198 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 198 - இல. 3
**Volume 198 - No. 3**

2011 මාර්තු 22 වන අඟහරුවාදා
2011 மார்ச் 22, செவ்வாய்க்கிழமை
**Tuesday, 22nd March, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**භූමි කම්පාව සහ සුනාමියෙන් පසු ජපානයේ වර්තමාන තත්ත්වය:**
විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**එකතු කළ අගය මත බද්ද (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ජාතිය ගොඩනැගීමේ බද්ද (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**හරබද්ද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**රේගු ආඥා පනත:**
යෝජනාව

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**பூமியதிர்ச்சி மற்றும் சுனாமியின் பின்னர் ஜப்பானின் தற்போதைய நிலைமை:**
வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று

**சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம்,மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பொருளாதாரச் சேவை விதிப்பனவு(திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, நிறைவேற்றப்பட்டது

**மாகாண சபைகள் (முத்திரைத் தீர்வையைக் கைமாற்றுதல்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பற்றுகள் வரி (நீக்குதல்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, நிறைவேற்றப்பட்டது

**நிதி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பிராந்திய உட்கட்டமைப்பு அபிவிருத்தி அறவீடு (நீக்கம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, நிறைவேற்றப்பட்டது

**சுங்கக் கட்டளைச் சட்டம்:**
தீர்மானம்

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

CURRENT SITUATION IN JAPAN FOLLOWING EARTHQUAKE AND TSUNAMI:
Statement by Hon. Minister of External Affairs

VALUE ADDED TAX (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed.

PROVINCIAL COUNCILS (TRANSFER OF STAMP DUTY) BILL:
Read a Second, and the Third time, and passed as amended.

DEBITS TAX (REPEAL) BILL:
Read a Second, and the Third time, and passed.

FINANCE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

REGIONAL INFRASTRUCTURE DEVELOPMENT LEVY (REPEAL) BILL:
Read a Second, and the Third time, and passed.

CUSTOMS ORDINANCE:
Resolution

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 මාර්තු 22 වන අඟහරුවාදා***
*2011 மார்ச் 22, செவ்வாய்க்கிழமை*
*Tuesday, 22nd March, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.*, MR. SPEAKER [THE HON.CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රේගු තීරුබදු සම්බන්ධයෙන් සාදනු ලැබ 2011 ජනවාරි මස 21 දිනැති අංක 1689/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - தொழில்நுட்ப, ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Technology and Research)

ගරු කථානායකතුමනි, 2008 වර්ෂය සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

ගරු කථානායකතුමනි, 2008 වර්ෂය සඳහා කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, මම හුංගම, බටඅත, මීගහජඳුර පදිංචි ඩබ්ලිව්.ඒ. මැණික්හාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) උඩුගොඩ, එළගල්ල, අයි. 55/5 දරන ස්ථානයේ පදිංචි පී.ජී.ආර්. ගුණරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පල්ලේගම, දීවෙල, අංක 345 දරන ස්ථානයේ පදිංචි ආර්.ඒ.ඩබ්ලිව්. සුනිල් ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කැගල්ල, කුරුඳුහින්න, ගලපල්ලේහේන පදිංචි ඩබ්ලිව්.ඩී. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතා - පැමිණ නැත.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) නිලාවෙලි, පෙරියකුලම්, අංක 282 දරන ස්ථානයේ පදිංචි සන්දානම් තුරෙයිරාජා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රත්නපුර, හිදැල්ල, කරපිංචාකඩේ පදිංචි ධනපාල පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කඩුගන්නාව, කැටකුඹුර, අමුණුපුර, අංක 89/2 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ජී. ආනන්ද සමරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා (දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க - சுதேச மருத்துவத்துறை பிரதி அமைச்சர்)
(The Hon. C.P.D. Bandaranaike - Deputy Minister of Indigenous Medicine)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) පස්යාල, මීරිගම පාර, අංක 65 දරන ස්ථානයේ පදිංචි එස්.එල්. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගනේමුල්ල, පහළ යාගොඩ, අංක 213/1 දරන ස්ථානයේ පදිංචි ජේ.ඒ.ඩී.ආර්. ජයසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කල්-එළිය, වලව්වත්ත, අංක 156/2 දරන ස්ථානයේ පදිංචි එච්.එම්. රාජා ධර්මවීර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මම මැදමුල්ල, කිංව්ගුණේ, ගාල්ලෙ ගෙදර පදිංචි එල්.පී. තේමියපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මම පොතුහැර, බැව්ල්ගමුව පදිංචි ඩී.වී. රංජනී ගුණතුංග මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු කථානායකතුමනි, මම නාවුල, කරවිල හේන පාර පදිංචි එච්.එම්.යූ.බී. හඳුගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) මාතර, වල්ගම මැද, ඕව්ලානවත්ත, අංක 37 දරන ස්ථානයේ පදිංචි ඩී.එම්. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රන්සැගොඩ, කොරඹුරුවාන, කෝදගොඩවත්ත පදිංචි එස්.ඩී. පියසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, හිත්තැටිය මැද, "උදය" නිවසෙහි පදිංචි එස්.එල්.ජේ. කමලානි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, නුපේ, අකුරැස්ස පාර, ශ්‍රී රත්නපාල මාවත, අංක 44/9 දරන ස්ථානයේ පදිංචි කේ.පී. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මිරිස්ස, බණ්ඩරමුල්ල, මදුරුදූව පදිංචි ඩී.එල්.එච්. මංජුල සම්පත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) කැකණදුර, නාගහ හන්දිය, "සමාධි" නිවසෙහි පදිංචි එච්.එම්.එස්. කෝලිත බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) මාතර, නාවිමන දකුණ, "ඉසුරුවිලා" නිවසෙහි පදිංචි උපුල් රංජිත් රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, මම නාරම්මල, රම්මුතුගල, අංක 33 දරන ස්ථානයේ පදිංචි එම්.එස්.එස්.පී. ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගිරාතලාන උතුර මාර්ගය: තාර දැමීම
### கிராதலான வடக்கு வீதி: தாரிடல்
### GIRATHALANA NORTH ROAD: TARRING

0726/'10

2. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගිරාතලාන උතුර මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාර දුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදු කළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දැමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, මේ වන විට බොහෝ ස්ථාන ගිලා බැස ඇති බවත්, නියමිත දුර ප්‍රමාණය තාර දමා නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදිකිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா: (2)

(அ) (i) பண்டுவஸ்நுவர மேற்கு பிரதேச செயலாளர் பிரிவின் கிராதலான வடக்கு வீதி எந்த நிறுவனத் திற்கு உரித்தாகின்றது என்பதையும்,

(ii) மேற்படி வீதிக்கு தார் இடுவதற்காக உரிய நிறுவனத்தின் அனுமதி பெறப்பட்டுள்ளதா என்ப தையும்

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதிக்கு தார் இடுவதற்காக ஒப்படைக் கப்பட்ட நிறுவனம் அல்லது நபர்கள் யாரென்ப தையும்,

(ii) அதற்காக ஒதுக்கப்பட்ட மதிப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்,

(iii) குறித்த மதிப்பீட்டுக்கமைய தாரிட வேண்டிய தூரத்தின் அளவும் வீதியின் அகலமும் எவ்வளவென் பதையும்,

(iv) தற்போது தாரிடப்பட்டுள்ள தூரத்தின் அளவு எவ்வளவென்பதையும்,

(v) தாரிட்டு முடித்த திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி வீதிக்கு தாரிடுதல் தரநியமங்களுக்கமைய நடைபெறவில்லை என்பதையும், தற்போது பெரும் பாலான இடங்கள் ஆழ்ந்துள்ளன என்பதையும், உரிய தூரத்திற்கு தாரிடப்படவில்லை என்பதையும் அவர் அறிவாரா?

(ஈ) ஆமெனின், தரநியமங்களுக்கு இணங்கியொழுகாத வகை யில் நிர்மாணிப்பை மேற்கொண்ட நிறுவனம் அல்லது நபர்கள் தொடர்பில் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Will he inform this House-

(i) of the institution under which the Girathalana North Road in Panduwasnuwara West Divisional Secretary's Division comes; and

(ii) whether permission has been obtained from the relevant institution to tar that road?

(b) Will he state-

(i) the name of the institution or names of the persons entrusted with the task of tarring the aforesaid road;

(ii) the estimated amount of money allocated in that respect;

(iii) the length and width of the road to be tarred, according to that estimate;

(iv) the length of the stretch of road that has been tarred by now; and

(v) the date on which tarring was completed?

(b) Is he aware that tarring of that road has not been done conforming to the standards, many places have caved in by now and that the specified length has not been tarred?

(c) If so, will he inform this House of the measures that will be taken against the institution or persons that carried out constructions without conforming to the standards?

(d) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, මම වරාය හා මහාමාර්ග ඇමතිතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

(ii) ප්‍රාදේශීය සභාවේ එකඟතාව පරිදි යම් ප්‍රදේශයක, අවශ්‍යතාව හඳුනා ගත් විට ඊට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

(ආ) (i) ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත මහ නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම.

(ii) රුපියල් මිලියන 40.

(iii) දිග මීටර් 1,700.

පළල අඩි 12.

(iv) දිග මීටර් 1,700.

(v) 2009 අප්‍රේල්.

(ඇ) මාර්ගය පිළිසකර කිරීම නියමිත ප්‍රමිතියට සිදු කර ඇත.

(ඈ) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාරේ දිග කොපමණද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
දිග මීටර් 1,700යි. කිලෝමීටර් 2ට මීටර් 300ක් අඩුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රුපියල් මිලියන 40ක් ගිහිල්ලා තිබෙනවා නේද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේක ඉතාම කුඩා පාරක්. පඩුවස්නුවර ආසනයේ ප්‍රාදේශීය සභාවට අයිති කිලෝමීටර් 2කට අඩු ප්‍රමාණයක පාරක් හදන්න රුපියල් කෝටි 4ක් ගිහින් තිබෙනවා. මේකේ ලොකු පාලම් හදන්න තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, නිකම්ම තිබෙන පාරට තාර එලන්න තමයි තිබුණේ. මේ කාර්යය කර තිබෙන්නේ මහ නැඟුම ආයතනය. ඒ සඳහා රුපියල් කෝටි 4ක් ගිහින් තිබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම අහන්නේ - [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න ප්‍රශ්නය අහනකම්. ප්‍රශ්නයක් අහන්න දෙන්නේ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාර ඉදි කරන්න කොන්ත්‍රාත් එක ලබා ගෙන තිබෙන්නේ කවුද කියා මම අහන්න කැමැතියි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ප්‍රශ්නය පැහැදිලි නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රාදේශීය සභාවක පාරක කිලෝමීටර් දෙකක් හදන්න රුපියල් කෝටි හතරක් යනවාද? ඒක ඇහුවාම ඒකටත් කෑගහනවා. කිලෝමීටර් දෙකක් හදන්න රුපියල් කෝටි හතරක් යනවාද? ඒ විධියට බලන කොට ගමක, ප්‍රාදේශීය සභාවක පාරක කිලෝමීටරයක් හදන්න රුපියල් කෝටි දෙකක් යනවා. ඒක ඇහුවාම ලජ්ජා නැතිව ඒකටත් කෑගහනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒ ප්‍රශ්නය -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මුළු පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේම අවුරුද්දක ආදායම රුපියල් කෝටි දෙකයි. මේ පාරේ කිලෝමීටර් දෙකක් හදන්න රුපියල් කෝටි හතරක් ගිහිල්ලා තිබෙනවා. ඒක ඇහුවාම හිනා වෙනවා, විහිළුවක් කියලා හිතා ගෙන.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට, කිලෝමීටර් එකයි මීටර් 700ක පාර සකස් කරන්න රුපියල් කෝටි හතරක් ගියාය කියන කාරණය එතුමා අර්ථ නිරූපණය කරන ආකාරය ගැන අපට එකඟ වන්න බැහැ. මේ කිලෝමීටර් දෙක තුළ බෝක්කු කොච්චර තිබුණාද, පාර කොයි තරම් උස්සන්න සිදු වුණාද, එහෙම නැත්නම් ඒ පාරේ පළල කොපමණද කියන ඒවා මොනවාවත් එතුමා සාධාරණීකරණය කරන්නේ නැහැ. ඒ නිසා එතුමා කියන කාරණයට එකඟ වන්න බැහැ. මේ අදාළ මාර්ගය අඩි 12ක් පළල් කරලා හදන්නයි කටයුතු කර තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම මේ පාරේ හැම දාම යන මනුස්සයෙක්. ඒක මගේ ආසනය. මෙතුමාට වඩා -මේ අනෙක් කට්ටියට වඩා- මම ඒ පාර ගැන හොඳට දන්නවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මෙම පාර හැදීම පිළිබඳව එතුමාට ප්‍රශ්නයක් තිබෙනවා. ඒක අද කථා කරන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාරේ එක බෝක්කුවක්වත් දමලා නැහැ. එක බෝක්කුවක්වත් දමන්නේ නැතිව නිකම් තිබුණ පාරේ තාර දමන්න තමයි මේ රුපියල් කෝටි හතරක් ගිහිල්ලා තිබෙන්නේ. ඉතින් මම අහනවා, මේ සල්ලි කාගේ සාක්කුවලටද යන්නේ කියලා. මේක හරියට හැදෙනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. එක බෝක්කුවක්වත් දමා නැහැ. එක බෝක්කුවක්වත් දමන්නේ නැතිව කිලෝමීටර් දෙකට රුපියල් කෝටි හතරක් ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීම්] මිනිසුන්ට මෙහෙම හොරකම් කරන්න පුළුවන්ද? මේ සල්ලි වියදම් කරන්නේ කවුද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, එතුමාට යන එන මං නැති හින්දා පාරක් හදා දීම පිළිබඳව එතුමා සෑහීමකට පත් වන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කාගේ සාක්කුවලටද මේ කෝටි හතර ගියේ? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මුළු ප්‍රාදේශීය සභාවටම ආදායම තිබෙන්නේ කෝටි දෙකයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
කෝටි දෙකක් තිබෙන හින්දා තමයි කෝටි හතරක් වියදම් කරලා පාරක් හැදුවේ. ඒ පාර හදන එකට එකඟ නැද්ද? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මහ නැඟුමට කෝටි හතරයි. ඒ සල්ලි ටික ප්‍රාදේශීය සභාවට දුන්නා නම්, ප්‍රාදේශීය සභාව ඒ කෝටි හතරෙන් තිබෙන පාරවල් ටික ඔක්කොම හදයි. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේගේ point of Order එක මොකක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, my point of Order is this. He is making a speech. The relevant Standing Order is very clear on this. He can ask three supplementary Questions on the reply given. He has already asked three supplementary Questions. Questions තුනයි. කථා තුනයි. This is a violation of the Standing Orders.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පෙන්වා දුන්නාම ඇති. තමුන්නාන්සේත් කථාවක් කරනවා. එහෙම බැහැ. ගරු මන්ත්‍රීතුමා, දැන් කථාවක් කරන්නේ නැතිව ප්‍රශ්නය අහන්නකෝ. කථාවක් කරන්න යන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගෙන් අවසර ලබා ගෙන දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි. කරුණාකර ඒ ගිය වියදම වාගේ කෝටි හතරක මුදලක් ප්‍රාදේශීය සභාවට මේ අවුරුද්දේ ලබා දෙනවා නම්, ඒ පාරවල් ගොඩක් ප්‍රතිසංස්කරණය කරන්න ප්‍රාදේශීය සභාවට පුළුවන්. ඒ නිසා නියෝජ්‍ය ඇමතිතුමා විධියට ඔබතුමාගෙන් මම ඉල්ලනවා, මේ අවුරුද්දට මේ ප්‍රාදේශීය සභාවට අඩුම තරමින් කෝටි හතරක් ලබා දෙන්න කියලා. එතකොට අපි ඔබතුමාට පෙන්වන්නම්, කොච්චර පාරවල් හදන්න පුළුවන්ද කියලා. ඒ කාරණය ඉටු කරන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. ඒක වෙන් කරලා දෙන්නකෝ. එතකොට හරි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා චෝදනාවක් කරනවා. ගරු ඇමතිතුමා කරුණාකරලා මේ ගැන බලන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
හොඳයි. ගරු කථානායකතුමනි.

## දඹුල්ල නගරයේ හා ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත ප්‍රදේශයේ අපද්‍රව්‍ය: පරිසර හානිය
தம்புல்ல நகர மற்றும் பொருளாதார மையப் பிரதேச கழிவுப்பொருட்கள்: சுற்றாடல் சேதம்
GARBAGE FROM SURROUNDING AREAS OF DAMBULLA TOWN AND ECONOMIC CENTRE: ENVIRONMENTAL DEGRADATION

0887/'10

3. **ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
පරිසර අමාත්‍යතුමාගෙන්ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) දඹුල්ල නගරයේ හා ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත ප්‍රදේශයේ දෛනිකව එකතු වන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඉනාමළුව වන රක්ෂිතයට බැහැර කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් ඉනාමළුව රක්ෂිතය තුළ විශාල පරිසර හානියක් සිදු වෙමින් පවතින බවත්;

(ii) එසේ බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සමග ඇති පොලිතීන් හා ප්ලාස්ටික් කැබලි ආහාරයට ගැනීම නිසා එම රක්ෂිතයේ වන ජීවීන්ගේ ජීවිතවලට විශාල තර්ජනයක් එල්ල වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉනාමළුව වන රක්ෂිතයට සිදු වෙමින් පවතින පරිසර හානිය වළක්වා ගැනීමටත්, එහි වනජීවීන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමටත් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தம்புல்ல நகரத்திலும் பொருளாதார மையத்தைச் சார்ந்த பிரதேசத்திலும் அன்றாடம் சேர்கின்ற கழிவுப்பொருட்கள் இனாமலுவ வன ஒதுக்கத்தில் அப்புறப்படுத்தப் படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இதன் காரணமாக இனாமலுவ ஒதுக்கத்தில் பாரிய சுற்றாடல் சேதம் இடம்பெறுகின்றதென்பதையும்,

(ii) இவ்விதமாக அப்புறப்படுத்தப்படுகின்ற கழிவுப் பொருட்களுடன் உள்ள பொலித்தீன் மற்றும் பிளாஸ்ரிக் துண்டுகளை உணவாக உட்கொள்வ தனால் இவ்வொதுக்கத்திலுள்ள வனசீவராசிகளின் உயிர்களுக்குப் பாரிய அச்சுறுத்தல் தோன்றியுள்ள தென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இனாமலுவ வன ஒதுக்கத்துக்கு ஏற்படுத்துகின்ற சுற்றாடல் சேதத்தினைத் தடுப்பதற்கும், அங்குள்ள வனசீவராசிகளின் உயிர்களைப் பாதுகாத்துக் கொள்ளவும் மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware that a large amount of garbage collected daily from the surrounding areas of the economic centre in Dambulla town is disposed to the Inamaluwa forest reserve ?

(b) Will he admit that -

(i) a serious environmental damage is caused to the Inamaluwa forest reserve as a result ;

(ii) the lives of the wild animals that live in the reserve have been seriously threatened as they consume polythene and pieces of plastic in the garbage so disposed ?

(c) Will he inform this House the steps that will be taken to prevent the environmental damage which is being caused to the Inamaluwa reserve and protect the lives of the wild animals in it ?

(d) If not ,why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

(අ) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ඇතුළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එකතු වන අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැති බැවින් ඒ සඳහා සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් කරන ලද ඉල්ලීම අනුව එම කරුණ ජාතික අවශ්‍යතාවක් සේ සලකා ඉනාමළුව තේක්ක වන වගාවේ අංක 01/13 හා 01/14 කොටස්වලට අතර මැදිව පිහිටි වන වගාවෙන් තොර අක්කර දෙකක පමණ හිස් බිමක් කොන්දේසි මාලාවකට යටත්ව, කසළ බැහැර කිරීමේ කාර්යය සඳහා යොදා ගැනීමට ප්‍රාදේශීය සභාව වෙත 2005 වර්ෂයේදී අවසර ලබා දෙන ලදී.

(ආ) (i) පනවා ඇති කොන්දේසි අනුව කසළ බැහැර කිරීමේදී සිදු වන පරිසර හානිය අවම කිරීමට කටයුතු යොදා ඇති අතරම එම ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාව හා එක්ව කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන පිළිසරු ව්‍යාපෘතිය යටතේ මේ වන විට සිදු කරමින් පවතී. ඒ සඳහා අවශ්‍ය ඉඩම ලබා ගැනීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර ඇත.

(ii) ආර්ථික මධ්‍යස්ථානයෙන් බැහැර කරන එළවලු කොටස් ආහාරයට ගැනීමට වල් අලින් ඇතුළු සතුන් මෙම ස්ථානයට පැමිණීම නිසා මෙම තත්ත්වය ඇති වන බැවින් මේ වන විට ආර්ථික මධ්‍යස්ථානය මඟින් බැහැර කරන සතුන්ට ආහාරමය වශයෙන් ගත හැකි අපද්‍රව්‍ය මෙම ස්ථානයට බැහැර නොකරන ලෙසට දඹුල්ල ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇත.

දඹුල්ල ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු මෙම අපද්‍රව්‍ය සමඟ ඇති පොලිතීන් හා ප්ලාස්ටික් කැබැලි ප්‍රතිචක්‍රීකරණය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඇ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙතින් අදාළ ඉඩම දඹුල්ල ප්‍රාදේශීය සභාවට ලබා දුන් විගස පිළිසරු ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළ කටයුතු සිදු කරනු ලැබේ. සුදුසු ස්ථානයක නිසි කළමනාකරණයෙන් යුතුව කොම්පෝස්ට් ව්‍යාපෘතිය පවත්වාගෙන යෑමේදී ඉනාමළුව රක්ෂිතයට අපද්‍රව්‍ය බැහැර කිරීම නතර වන බැවින් සිදු වන පරිසර හානිය වළක්වා ගැනීමට හැකි වේ. තවද, අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව මේ වන විටත් පනවා ඇති කොන්දේසිවලට අනුකූලව වළවල් හාරා අපද්‍රව්‍ය බැහැර කර වළවල් වසා දැමීම මඟින්ද සිදු වන පරිසර හානිය අවම කර ගත හැකි අතර, ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු ඇමතිතුමනි, ආර්ථික මධ්‍යස්ථානයේ තිබෙන අපද්‍රව්‍යත් එම ස්ථානයටම දමනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් අනුමැතියක් ලබා දීලා තිබෙනවාද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ ප්‍රාදේශීය සභාවටයි. අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංශය කළමනාකරණය කිරීමක් විතරයි අපි කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ අනුව පිළිසරු ව්‍යාපෘතිය යටතේ සියලුම කසළ බැහැර කිරීම සඳහා වන ව්‍යාපෘතියක් හදන්න අවශ්‍ය තරම් මුදල් දෙන්න අපි දැනටත් සූදානම්. ඒ වෙනුවෙන් ඉඩම ලැබුණු ගමන් අපි ඒ කටයුත්ත පටන් ගන්නවා. ඒ අතරතුර අපි උපදෙස් දීලා තිබෙනවා ඒ වළවල් හාරලා ඒවා වහන්න කියලා. සාමාන්‍යයෙන් කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් තිබෙන්නේ වළක් හාරලා ඒකට අපද්‍රව්‍ය දාලා වහලා දාන එකයි. ඒ වාගේම ඒ පිළිබඳව තිබෙන ක්‍රමවේදය මම කලින් කිව්ව ව්‍යාපෘතිය හරහා නිම කිරීමට බලාපොරොත්තු වෙනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු ඇමතිතුමනි, ඒ අපද්‍රව්‍ය බැහැර කිරීම ඔබතුමා කියන ක්‍රමයට සිද්ධ වන්නේ නැහැ. පළාත් පාලන ආයතනයෙන් ඒක සිදු වන්නේ නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒක මම සොයා බලන්නම්. නව ප්‍රාදේශීය සභාවක් පත් වෙලා තිබෙනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් ලබා දී තිබෙන භූමි ප්‍රමාණය කොච්චරද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මා ළඟ නම් ඒ තොරතුරු නැහැ. ගරු කථානායකතුමනි, නමුත් දළ වශයෙන් අක්කර 5ක පමණ භූමි ප්‍රමාණයක් අපි බලාපොරොත්තු වෙනවා. අවශ්‍ය ගොඩනැඟිලි, උපකරණ, යන්ත්‍ර සියල්ලම අපි ලබා දෙනවා.

## ජී.එම්. පුංචිබණ්ඩා මහතා: වන්දි
## திரு. ஜீ.எம். புஞ்சி பண்டா: நட்டஈடு
## MR. G.M. PUNCHIBANDA: COMPENSATION

0889/'10

4. **ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ වර්ෂ 2000 සිට 2008 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අත් පත් කර ගත් ඉඩම් ප්‍රමාණය, එම ඉඩම් හිමියන්ගේ නම්, ලිපිනයන් හා ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(ii) එම කාලය තුළ ආපසු පවරා ගත් පල්ලේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජී. එම්. පුංචිබණ්ඩා මහතා පදිංචිව සිටි ගොඩනැඟිල්ලට, ළිඳකට හෝ ඉඩමට මහා මාර්ග අමාත්‍යාංශයේ, ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, වන්දි ලෙස ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පුංචිබණ්ඩා මහතා විසින් කූට ලේඛන සකසා එම ඉඩමට විදුලිය ලබා ගෙන ඇති බවත්; එම ඉඩමට බලපත්‍රයක් ලබා ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතියට අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ආපසු පවරා ගැනීමේදී පුංචිබණ්ඩා මහතාට ගෙවා ඇති වන්දි මුදල් ආපසු ලබා ගැනීමටත්;

(ii) උක්ත ඉඩම වෙනුවෙන් වැරදි සහගත ලෙස බලපත්‍රයක් ලබා දීමට, එහි දේපළට වන්දි මුදල් ගෙවීමට සහ විදුලිය ලබා දීමට උපදෙස් දුන් හා අනුමත කරන ලද නිලධාරින්ට විරුද්ධව ක්‍රියා කිරීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

காணி, காணி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆட்சி மீளப் பெறுதல் சட்டத்தின் கீழ் 2000 ஆம் ஆண்டு முதல் 2008 ஆம் ஆண்டு வரை கண்டி மாவட்டத்தில் மினிப்பே பிரதேச செயலாளரால் சுவீகரிக்கப்பட்டுள்ள காணிகளின் பரப்பளவு, அக்காணிகளின் உரிமையாளர்களது பெயர்கள், முகவரிகள் மற்றும் கிராம உத்தியோகத்தர் பிரிவுகள் யாவையென்பதையும்,

(ii) மேற்படி காலத்தினுள் மீளப் பெறப்பட்டுள்ள பல்லேவத்த கிராம உத்தியோகத்தர் பிரிவின் திரு. ஜீ.எம். புஞ்சி பண்டா வசித்து வந்த கட்டடத்துக்கு, கிணற்றுக்கு அல்லது காணிக்கு நெடுஞ்சாலைகள் அமைச்சின் தேசிய நெடுஞ்சாலைகள் துறை சார்ந்த கருத்திட்டத்தின் மூலம் நட்டஈடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(iii) ஆமெனில், நட்டஈடாக வழங்கப்பட்ட பணத் தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா ?

(ஆ) திரு. புஞ்சிபண்டா போலி ஆவணங்களைத் தயாரித்து மேற்படி காணிக்கு மின்சாரம் பெற்றுக்கொண்டுள்ளார் என்பதையும், மேற்படி காணிக்கு உரிமப்பத்திரமொன்றை பெறுவதற்காக காணிகள் ஆணையாளர் நாயகத்தின் அனுமதிக்கான விண்ணப்பப்படிவமொன்றை சமர்ப்பித்துள்ளாரென்பதையும் அவர் ஏற்றுக்கொள்வாரா ?

(இ) (i) காணியை மீளப் பெறுகின்றபோது திரு. புஞ்சி பண்டாவுக்கு வழங்கப்பட்டுள்ள நட்ட ஈட்டுப் பணத்தை மீண்டும் பெற்றுக்கொள்வதற்கும்,

(ii) மேற்படி காணிக்கு தவறான முறையில் உரிமப் பத்திரம் வழங்கவும், அவ்வாதனத்திற்கு நட்டஈடு வழங்கவும், மின்சாரம் வழங்கவும் ஆலோசனை வழங்கிய மற்றும் அங்கீகரித்த உத்தியோகத்தர் களுக்கு எதிராக செயலாற்றுவதற்கும்

நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Land and Land Development:

(a) Will he state-

(i) the extent of land acquired by the Divisional Secretary of Minipe in Kandy District from 2000 to 2008 under the State Lands ( Recovery of possession) Act, the names of the owners of those lands, their addresses and Grama Niladhari Divisions ;

(ii) whether compensation has been paid by the National Highways Sector Project of the Ministry of Highways for the building or land where Mr. G.M. Punchibanda of Pallewatta Grama Niladhari Division was residing or for a well in that land which was subjected to recovery of possession within the aforesaid period ;

(iii) if so, the amount paid as compensation ?

(b) Will he admit that Mr. Punchibanda has obtained electricity supply for that land using forged documents and that he has submitted an application for the approval of Land Commissioner General to obtain a license for that land ?

(c) Will he state whether action will be taken-

(i) to recover the money paid as compensation to Mr. Punchibanda in recovering the possession of land;

(ii) against the officials who advised and approved the provision of a license for the aforesaid land in an irregular manner, the payment of compensation for property on it and the supply of electricity ?

(d) If not, why?

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)

(අ) (i)

| ඉඩම් ප්‍රමාණය | ඉඩම් හිමියාගේ නම | ලිපිනය | ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|---|
| සොයා ගත නොහැක. | ජී. එම්. පුංචිබණ්ඩා | නුගගහමුල වින්කලය, පල්ලෙවත්ත, හසලක. | පල්ලෙවත්ත |

(ii) ඔව්.

(iii) ළිඳ සඳහා පමණක් රු. 52,000/- ක මුදලක් ඉඩම් අත් පත් කර ගැනීමේ ප්‍රතිෂ්ඨාපන (LARK) කමිටු තීරණය අනුව ගෙවා ඇත.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත විදුලිය ලබා ගෙන ඇත. ඉඩම් සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇතත් ලබා දී නැත.

(ඇ) (i) ඉඩමට වන්දි මුදල ගෙවා නැත.

(ii) අදාළ නැත.

(ඈ) අදාළ නැත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-0891/'10-(1), ගරු හරින් ප්‍රනාන්දු මහතා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති හයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කල්පිටිය අසල දූපත: බදු ගිවිසුම
## கற்பிட்டிக்கு அண்மையிலுள்ள தீவு: குத்தகை உடன்படிக்கை
## ISLAND CLOSE TO KALPITIYA: LEASE AGREEMENT

0897/'10

6. **ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කල්පිටිය අසල ඇති දූපතක් දේශීය හෝ විදේශීය සමාගමකට හෝ පුද්ගලයකුට බදු දී තිබේද;

(ii) එසේ නම්, එම දූපත කවර කටයුත්තක් සඳහා, කුමන කාල සීමාවකට, කොපමණ මුදලකට බදු දුන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූපත බදු දී ඇති සමාගමේ හෝ පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම දූපත බදු දීමට අදාළ බදු ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கற்பிட்டிக்கு அண்மையில் அமைந்துள்ள ஒரு தீவு, உள்நாட்டு அல்லது வெளிநாட்டுக் கம்பனி ஒன்றுக்கு அல்லது நபர் ஒருவருக்கு குத்தகைக்கு விடப்பட்டுள்ளதா என்பதையும்,

(ii) அவ்வாறாயின், இத்தீவு எவ்வாறான நடவடிக்கைக் காக, எவ்வளவு காலப்பகுதிக்கு, எவ்வளவு தொகைக்கு குத்தகைக்கு விடப்பட்டுள்ளது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இத்தீவு குத்தகைக்கு வழங்கப்பட்டுள்ள கம்பனி அல்லது நபரின் பெயர் யாதென்பதையும்,

(ii) இத்தீவினைக் குத்தகைக்கு விடுதல் தொடர்பான, குத்தகை உடன்படிக்கையை இச்சபைக்கு சமர்ப்பிப் பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House-

(i) whether an island situated close to Kalpitiya has been leased out to a local or foreign company or an individual;

(ii) if it has been leased out, the purpose, the period and the amount of the lease ?

(b) Will he state -

(i) the name of the company to which the aforesaid island has been leased out or the name of the person to whom it has been leased out;

(ii) whether the relevant lease agreement will be submitted to this House?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. දූපත් දෙකක් බදු දී තිබේ. ඒවා පහත පරිදි වේ:

1. වෙල්ලෙයි දූපත - ශ්‍රී ලංකා, මාලදිවයින් සහ ස්විට්සර්ලන්ත ඒකාබද්ධ ආයෝජනයක් සඳහා.

2. ඉප්පන්තිව් දූපත - ඉන්දියානු සමාගමකට.

(ii) ඉහත දූපත් දෙකම සංචාරක හෝටල් ඉදි කිරීම සඳහා වසර 30ක කාල සීමාවකට බදු දී ඇත.

1. වෙල්ලෙයි දූපත - පළමු වසර 5 සඳහා මූලික බදු මුදල රුපියල් 3,709,999.68 යි.
වසර පහකට වරක් බදු මුදල සංශෝධනය වනු ඇත.

2. ඉප්පන්තිව් දූපත - පළමු වසර 5 සඳහා මූලික බදු මුදල රුපියල් 14,914,397.40 යි.
වසර පහකට වරක් බදු මුදල සංශෝධනය වනු ඇත.

(ආ) (i) වෙල්ලෙයි දූපත - සන් රිසෝට් ඉන්වෙස්ට්මන්ට් ලංකා පෞද්ගලික සමාගම

ඉප්පන්තිව් දූපත - කියුබ් ලංකා ලෙෂර් ප්‍රොපර්ටි පෞද්ගලික සමාගම

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත එම ගිවිසුම් සකස් කර අදාළ පාර්ශ්වයන් සමඟ අත්සන් කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ සංචාරක ව්‍යාපෘතියේ අය ළඟදීම වැඩ ආරම්භ කරනවාද කියා මම අහනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ආරක්ෂක හේතූන් මත කිසියම් අධීක්ෂණයක් යටතේද ඒ සමාගම් කටයුතු කරන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, අපේ කොන්දේසි රාශියක් යටතේ තමයි ඒ සමාගම් -

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමා ඒවා සභාගත කරනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගිවිසුම් සියල්ලම සභාගත කරන්නම්. ගරු කථානායකතුමනි, මේ ගිවිසුම්වලට අදාළ කොන්දේසි තිබෙනවා. එකී කොන්දේසි කඩ කළොත් ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව පැහැදිලිව සඳහන් කර තිබෙනවා. Evaluation Committee එකක් දමා කැබිනට් තීන්දුවක් අනුව ඉතාමත්ම පැහැදිලි අඩු ටෙන්ඩරයකට තමයි දීලා තිබෙන්නේ. අපි ඒ සියලුම ගිවිසුම් **සභාගත*** කරනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, තුන්වන අතුරු ප්‍රශ්නය.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අඩුම ටෙන්ඩරයටද දුන්නේ? එහෙම නැත්නම් වැඩිම ටෙන්ඩරයටද දීලා තිබෙන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේක වැඩිම ටෙන්ඩරයට දීලා තිබෙන්නේ. ඔබතුමාට සම්පූර්ණ විස්තරයක් -ඉල්ලපු අය පිළිබඳව සහ ඔවුන් ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිබඳව විස්තරයක්- දෙන්නම්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමා ටෙන්ඩර් කැඳෙව්වාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්. මිල ගණන් කැඳවීමක් කර තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ටෙන්ඩර් කැඳෙව්වාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබෙනවා. Evaluation Committee එකකුත් දාලා තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒක ප්‍රසිද්ධ කළේ නැහැ? [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ප්‍රසිද්ධ කරලා තිබෙන්නේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සියලුම ප්‍රශ්න අවසන්. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)
දැන් තුන් වැනි ජනමතයක් ඇවිත් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ වැඩ ඔබතුමන්ලා බලා ගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්න අංක 7ට යමු.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමා ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කියන්න කැමැතියි, පත්තරේ දැන්වීමක් දාලා ලබා ගෙන තිබෙන බව. ඒ සියලුම ලියවිලි සභාගත කර තිබෙනවා. ඔබතුමාට බලා ගන්න පුළුවන්. ඒ සියලුම දේවල් සභාගත කර තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, ප්‍රශ්න අංක 7, ගරු රවි කරුණානායක මහතා. මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමාගෙන් ඇසීමට. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, ඔබතුමා දැන් උත්තර දුන්නා. ලේඛන සභාගත කළා. කරුණාකර දැන් වාඩි වෙන්න. දැන් ප්‍රශ්න අංක 7.

## සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල මිලදී ගත් කොටස්: විස්තර
## ஊழியர் நம்பிக்கைப்பொறுப்பு நிதியம் கொள்வனவுசெய்த பங்குகள்: விபரம்
## SHARES BOUGHT BY EMPLOYEES' TRUST FUND: DETAILS

0602/'10

7. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වර්ෂයේදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල විසින් මිලදී ගනු ලැබූ සියලු කොටස් කවරේද;

(ii) ඉහත සඳහන් කොටස්වල ගැනුම් මිල සහ වත්මන් යළි විකුණුම් මිල කවරේද;

(iii) කොටස් මිලදී ගනු ලැබුවේ ලැයිස්තුගත සමාගම්වලින්ද;

(iv) නො එසේ නම්, ලැයිස්තුගත නොකළ කොටස් මිලදී ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ලැයිස්තුගත කළ සහ ලැයිස්තුගත නොකළ සමාගම් බොහොමයක සුළුතර කොටස් ප්‍රමාණ මිලදී ගැනීම රජයේ ප්‍රතිපත්තියක් ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த வருடத்தின்போது ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியத்தினால் கொள்வனவு செய்யப் பட்ட சகல பங்குகளையும்,

(ii) மேற்குறிப்பிட்ட பங்குகளின் கொள்வனவு விலை மற்றும் தற்போதைய விற்பனை விலை ஆகியவற்றையும்,

(iii) பட்டியலிடப்பட்ட கம்பனிகளிடமிருந்தா அப் பங்குகள் வாங்கப்பட்டன என்பதையும்,

(iv) இல்லையேல், பட்டியலிடப்படாத பங்குகள் ஏன் கொள்வனவு செய்யப்பட்டன என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) பல பட்டியலிடப்பட்ட மற்றும் பட்டியலிடப்படாத கம்பனி களிடமிருந்து சிறிய பங்குரிமைகளை வாங்குவது அரசாங்கத்தின் கொள்கையா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) all the shares bought by the ETF during last year;

(ii) the purchasing prices and the present reselling prices of aforesaid shares;

(iii) whether the shares were bought from quoted companies; and

(iv) if not, as to why non-quoted shares were bought?

(b) Will he state whether it is a policy of the Government to buy minority shareholdings of many quoted and unquoted companies ?

(c) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පසුගිය වර්ෂයේදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල විසින් මිල දී ගනු ලැබූ සියලු කොටස් පිළිබඳ විස්තර යා කර ඇති ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

එම කොටස් මිල දී ගත් දිනය (a) තීරුවෙහිද, සමාගමේ නම (b) තීරුවෙහිද, කොටස් ගණන (c) තීරුවෙහිද දක්වා ඇත.

(ii) කොටස්වල ගැනුම් මිල ඇමුණුමෙහි (d) තීරුවෙහිද, 2010.01.27 දිනට කොටසක වෙළෙඳ පොළ මිල (e) තීරුවෙහිද දක්වා ඇත.

(iii) ඔව්. මිලදී ගනු ලැබූ සියලු කොටස් ලැයිස්තුගත සමාගම්වල කොටස් වේ.

(iv) පැන නොනඟී.

(ආ) ආයෝජන සඳහා ලැබෙන ප්‍රතිලාභ/පොලී අනුපාත විධිමත් ලෙස අධ්‍යයනය කර අදාළ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල විසින් කොටස් වෙළෙඳ පොළ අරමුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් තීරණ ගනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය මා අහනවා. මේ අර්ථසාධක අරමුදල කියන්නේ වැඩ කරන ජනතාවගේ සල්ලි. මේ සම්බන්ධයෙන් ඒ වැඩ කරන ජනතාවට ලැබෙන පොලී ප්‍රමාණය සියයට 10යි. ඔබතුමා මේ ඉදිරිපත් කරලා තිබෙන ලේඛනය තුළ පෙන්වා තිබෙනවා, සියයට 25ක, 26ක විතර ලාභයක් ලබා ගන්නවා කියලා යම් කොටස්වල ලාභය වශයෙන්. මේ අර්ථසාධක අරමුදලේ ගිණුම් හිමි අයට ඇයි එවැනි පොලී අනුපාතිකයක් දීලා නැත්තේ කියන එක මා පළමුවෙන්ම අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මෙය සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල. සේවක අර්ථසාධක අරමුදල නොවෙයි. ඔබ අසා තිබෙන්නේ -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
EPF එකයි ETF එකයි දෙකම එක නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
නැහැ. දෙකම එක නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. එකක් EPF. එකක් ETF.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
කනගාටුයි. ඔබතුමා දන්නවා නේ ඒ දෙකේ වෙනස.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සේවක භාරකාර අරමුදල හෝ EPF එකෙන් -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
නැහැ. සේවක අර්ථසාධක අරමුදලේ සේවකයාගේ දායකත්වය තිබෙනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එකක් සියයට 12යි, එකක් සියයට 3යි. මේ ඔක්කොම වැඩ කරන ජනතාවගේ සල්ලි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. දැන් දෙවැනි එක.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වැඩ කරන ජනතාවගේ සල්ලි. ඒ සම්බන්ධයෙන් පොලී අනුපාතයක් ගෙවනවා. ඒ ගෙවන අනුපාතය සියයට 10 නම්, ඔය ලාභය සියයට 25 නම් ඇයි ඒ වැඩ කරන ජනතාවට ඒ පොලියේ ලාභය ලබලා දීලා නැත්තේ කියන ප්‍රශ්නය මම අහනවා?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
සවිස්තර වාර්තාවක් මෙතැන තිබෙනවා. ඔබ අහන ප්‍රශ්නයට උත්තරය දෙන්න නැවත මෙය ගණනය කිරීමක් අවශ්‍ය වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම එකක් ඇහුවේ නැහැ මම.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම ඒ ප්‍රශ්නයටයි පිළිතුරු දෙන්නේ. මේ 3,600ක් මට මෙතැනදී ගණනය කරන්නට බැහැ. 3,600ක කොටස්වල අගය, වෙළෙඳ පොළ අගය සහ ගැනුම් මිල මෙතැන තිබෙනවා. ඔබතුමා අහන ප්‍රශ්නයට නැවත පිළිතුරු දීමක් අවශ්‍යයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම ඇහුවේ නැහැ නේ මම. මම ඇහුවේ මේ සෙල්ලම් කරන්නේ වැඩ කරන ජනතාවගේ සල්ලි සමඟ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
නැහැ. සෙල්ලම් කරන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උත්තර දෙන්න. ශබ්ද කරන්න ඕනෑ නැහැ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
1977 රජයෙන් ආරම්භ කළ අවුරුද්දේ සිට අද දක්වා මේ ලෙස කෙරෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මේක අහසින් කඩා වැටිච්ච දෙයක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේත්, ඒ වාගේම අනෙක් ආණ්ඩු කාලවලත් ජනතාවගේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට ඇහුණ විධියට ප්‍රශ්න තුනම අවසානයි. කරුණාකරලා කථා පවත්වන්නේ නැතිව හරියට, පැහැදිලිව ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එක ප්‍රශ්නයයි ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. ප්‍රශ්න තුනක් මගේ කනට ඇහුණා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම එකයි නේ ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
10ක් ඇහුවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකරලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න කීයකට උත්තර දුන්නාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
දැන් පහකට විතර උත්තර දුන්නා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, සාධාරණයක් වෙන්න අවශ්‍යයි. මම ඇහුවේ එක අතුරු ප්‍රශ්නයයි. මේවා නිරාකරණය කර ගන්න වෙනම ප්‍රශ්න අහන්න අවශ්‍යයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට ස්ථාවර නියෝග අනුව එහෙම කරන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතුමා කියනවා, සියලු දෙයක්ම කොටස් වෙළෙඳ පොළෙන් ගත්තාය කියලා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එය අදාළ නැත.

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව: ලාභය හෝ අලාභය
## இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனம்: இலாபம் அல்லது நட்டம்
## SRI LANKA RUPAVAHINI CORPORATION: PROFIT OR LOSS

0839/'10

8\. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රූපවාහිනී සංස්ථාව 2010 වර්ෂය සඳහා යාවත්කාල සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කර තිබේද;

(iii) 2006 වර්ෂයේ සිට මේ දක්වා මැතිවරණ පැවති කාල සීමාවන් තුළ රජයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ජාතික රූපවාහිනිය වෙන් කළ කාලයන් සහ ඊට අදාළව කළ ගෙවීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා රූපවාහිනී සංස්ථාවට කළ බඳවා ගැනීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවා ගැනීම් සිදු කළ තනතුරුවලට අදාළ සුදුසුකම් සහ බඳවා ගත් අයගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனம் பெற்ற இலாபம் அல்லது நட்டம் வருடாந்த அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(ii) ரூபவாஹினிக் கூட்டுத்தாபனம் 2010ஆம் ஆண்டுக்காக இற்றைப்படுத்தப்பட்ட கூட்டுத் திட்டத்தை நடைமுறைப்படுத்தியுள்ளதா என்பதையும்,

(iii) 2006ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை தேர்தல்கள் நடைபெற்ற காலகட்டத்தில் அரசின் தேர்தல் பிரசாரங்களுக்காக தேசிய தொலைக்காட்சி ஒதுக்கிய காலநேரம் மற்றும் அதனுடன் தொடர்பு டையதாக மேற்கொள்ளப்பட்ட கொடுப்பனவுகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை ரூபவாஹினிக் கூட்டுத்தாபனத்தினால் மேற்கொள் ளப்பட்ட ஆட்சேர்ப்புகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) மேற்படி ஆட்சேர்ப்புக்கள் செய்யப்பட்ட பதவிகளுக் கான தகைமைகள் மற்றும் சேர்த்துக்கொள்ளப் பட்டவர்களின் தகைமைகள் என்னவென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he inform this House-

(i) separately, the profit made or the loss incurred by Sri Lanka Rupavahini Corporation in each year during the period from year 2006 up to now;

(ii) whether the Rupavahini Corporation has implemented the updated combined plan for the year 2010; and

(iii) the amounts of time the Rupavahini allocated for the election campaign activities of the government, during the periods when elections were held from 2006 up to now and the payments made in that respect?

(b) Will he state-

(i) the number of persons recruited to the Rupavahini Corporation from year 2006 up to now; and

(ii) the qualifications required for the posts to which the aforesaid persons were recruited and the qualifications of those recruited?

(c) If not, why?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] team එකක් -

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්න බැරි අවස්ථාවක අතුරු ප්‍රශ්න අහන්නේ කොහොමද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ගරු සභාවේ -[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද ප්‍රශ්නය? අහන්න බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමා කියපු හැටියට රුපියල් කෝටි තුනහමාරක් පමණ කර දියවර මංගල්‍යය සඳහා වියදම් වෙලා තිබෙනවා. මේ කර දියවර මංගල්‍යයට පෙර හම්බන්තොට වරාය සම්බන්ධව උත්සව 5ක් විතර තිබුණා. එකක් තමයි පස් පිඩැල්ල කැපීමේ උත්සවය. දෙවැනි එක මුල්ගල තැබීමේ උත්සවය. [බාධා කිරීම්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන්න බැරිව තිබෙන අවස්ථාවක අතුරු ප්‍රශ්න අහන්න දීලා, මේ අදහස් - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතැන අහලා තිබෙන්නේ එක උත්සවයක් ගැනයි. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ප්‍රශ්නයකට උත්තර දෙන්නේ නැතිව කොහොමද අතුරු ප්‍රශ්න අහන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා අහන්නේ- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ සම්බන්ධයෙන් අලුත් ප්‍රශ්නයක් අහන්න. [බාධා කිරීම්] අලුත් ප්‍රශ්නයක් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා ප්‍රශ්නය අහන්නයි හැදුවේ. අහන්න දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැ නේ.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
අදාළ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ අහන්න කර දියවර මංගල්‍යය ගැන. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒක අහන්න බැහැ. [බාධා කිරීමක්] ඒක වැරැදියි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවාද පඬුවස්දෙව් රජ්ජුරුවෝ බද්දකච්චායනා කසාද බඳින කොට කොච්චර මුදලක් වියදම් කළාද කියලා? ඔබතුමාගේ ආසනයේ; පඬුවස්නුවර ආසනයේ. ඔබතුමා දන්නවාද ඒක? [බාධා කිරීමක්] මා ළඟ තිබෙනවා ඒක. මම කියන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේකේ තිබුණා - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අහන්න බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා කිව්වේ මේකයි. ඒ වාගේ උත්සව පහක් තිබුණා. එකක්, පස් පිඩැල්ල කැපීම. තවත් එකක්, මුල්ගල තැබීම. ඊ ළඟ එක, පතුල බැලීම. අනෙක, වතුර මාරු කිරීම. ඊ ළඟට තමයි කර දියවර මංගල්‍යය. ඒ උත්සව පහට අදාළ වන ඇස්තමේන්තුව ඔබතුමා ළඟ තිබෙනවාද, නැද්ද කියන එක අහන්න මට ඉඩ දෙන්න. වතුර මාරු කරන්නත් උත්සවයක් තිබුණා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, සම්ප්‍රදායානුකූලව ප්‍රශ්නයක් ඇහුවා නම් ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්. වතුර මාරු වීම කෙසේ වෙතත් මොළය මාරු වෙලායි තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැති ප්‍රශ්න අහනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ හන්දා මොළය මාරු වීම නිසා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැඳිලා නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
යුද්ධය කරන කොටත් ඒක හාස්‍යයට ලක් කළා. [බාධා කිරීම්] කිලිනොච්චි යන කොට මැදවච්චි යනවාය කියලා කිව්වා. ජනතාව ඒක දන්නවා. බොරුවට ප්‍රශ්න අහන්න එපා.

## ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව මගින් පාලනය වන තේ වතු: කසළ තේ

## இலங்கைப் பெருந்தோட்டக் கூட்டுத்தாபனம் நிர்வகிக்கும் தேயிலைத் தோட்டங்கள்: கழிவுத் தேயிலை

## TEA ESTATES MANAGED BY SRI LANKA PLANTATION CORPORATION: WASTE TEA

0910/'10

**11. ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව මගින් පාලනය වන තේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) තේ වෙන්දේසිවලදී එම තේ වතුවලින් කසළ තේ ලෙස මාසිකව ඉවත් කර ගනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) 2010 අගෝස්තු මාසය තුළ කැලෑ බොක්ක වතුයාය හා ගල්පිහිල්ල වතුයාය මගින් නිපදවූ තේවලින් පරිභෝජනයට නුසුදුසු යැයි පවසා තේ වෙන්දේසිවලදී ඉවත් කොට ඇති තේ කිලෝග්‍රෑම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එමගින් සිදු වූ දළ පාඩුව කොපමණද;

(v) එවැනි පාඩුවක් සිදු වීමට හේතු සොයා බලා එවන් තත්ත්වයක් නැවත ඇති නොවීම සඳහා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பெருந்தோட்டக் கூட்டுத் தாபனத்தினால் நிர்வகிக்கப்படுகின்ற தேயிலைத் தோட்டங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) தேயிலை ஏலவிற்பனைகளின்போது மேற்படி தேயிலைத் தோட்டங்களிலிருந்து கழிவுத் தேயிலையாக மாதாந்தம் அகற்றப்படுகின்ற தேயிலையின் அளவு எவ்வளவென்பதையும்,

(iii) 2010 ஓகஸ்ட் மாதத்தில் கெலேபொக்கைத் தோட்டம் மற்றும் கல்பிஹில்ல தோட்டங்களில் உற்பத்தி செய்யப்பட்ட தேயிலைகளிலிருந்து உபயோகத்துக்கு பொருத்தமற்றதெனக் கூறி, தேயிலை ஏல விற்பனைகளின்போது நீக்கப்பட்ட தேயிலை கிராம்களின் அளவுகள் தனித்தனியே எவ்வளவு என்பதையும்,

(iv) இதனால் ஏற்பட்ட மொத்த நட்டம் எவ்வளவு என்பதையும்,

(v) அவ்வாறான நட்டம் ஏற்படுவதற்கு காரணமான விடயங்களை கண்டறிந்து அவ்வாறான நிலை ஏற்படாதிருக்க எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் எவை என்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், என்?

asked the Minister of State Resources and Enterprise Development:

(a) Will he inform this House -

(i) of the number of tea estates managed by the Sri Lanka Plantation Corporation ;

(ii) of the amount of tea disposed monthly as waste tea at tea auctions, out of the amount of tea produced by those tea estates;

(iii) separately of the number of kilograms of tea that was condemned as unsuitable for human consumption at the tea auctions out of the amount of tea produced by the Kele Bokka Estate and the Galpihilla Estate, in the month of August in year 2010;

(iv) the gross loss incurred by it;

(v) the steps that will be taken in future to find out the reasons for such a loss and prevent the situation ?

(b) If not ,why?

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වතු 12යි.

(ii) තේ වෙන්දේසිවලට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු යායන්වලින් එවනු ලබන තේ කසළ තේ ලෙස බැහැර කිරීමක් සිදු නොකෙරේ. මන්ද, වෙන්දේසිවලට එවීමට පෙර වතු යායේදී තේ වර්ග කිරීමකට ලක් කරන අතර, එම ක්‍රියාදාමයේදී සියලු කසළ තේ ඉවත් වීම යන්ත්‍රානුසාරයෙන් කෙරෙන අතර, තේ වෙන්දේසියට සුදුසු මට්ටමේ පවතින තේ පමණක් බ්‍රෝකර්වරුන්ට ලබා දෙයි.

(iii) ගල්පිහිල්ල වතු යායේ නිෂ්පාදිත තේ තොගයක්, ISO තත්ත්ව සහතිකය ලබා දීමට තරම් සුදුසු තත්ත්වයේ නොතිබූ හෙයින් වෙන්දේසියෙන් ඉවත් කර තිබූ මුත් නැවත ISO තත්ත්ව සහතිකය ලබා ගැනීමට සුදුසු තත්ත්වයට පත් කර වෙන්දේසියට ඉදිරිපත් කර ඇත.

කැලෑබොක්ක වතු යායේ පමණක් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ තිබූ ඉන්වොයිස් 9කට අයත් තේ විනාශ කර ඇත.

(iv) රුපියල් 2,315,230/-කි.

(v) වතු යායේ පෙර පැවති පරිපාලනය වෙනස් කොට නව පරිපාලනයක් යටතට පත් කිරීම හා අධීක්ෂණ කටයුතු වඩාත් විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට පියවර ගැනීම.

කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම, වඩාත් හොඳ තේ නිෂ්පාදනයට අවශ්‍ය ගුණාත්මක තේ දළු ලබා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම.

(ආ) පැන නොනඟී.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු ඇමතිතුමනි, කැලෑබොක්ක වතු යායේ කසළ තේ ලෙස වෙන්දේසියෙන් ඉවත් වී ඇති තේ ප්‍රමාණය කිලෝ 20,373යි. තේ කිලෝග්‍රෑම් එකක වටිනාකම රුපියල් 350 ගණනේ ගත්තත් කැලෑබොක්ක වතු යායෙන් රුපියල් 71,30,350ක පාඩුවක් ලබනවා. ඒ සම්බන්ධයෙන් කැලෑබොක්ක වතු යායට විරුද්ධව පරීක්ෂණයක් පවත්වනවාද? එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

එවැනි දෙයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා ඔබතුමා කියනවා නම් අපි ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්නම්.

## කිරිබත්ගොඩ විහාර මහා දේවි බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම: පොරොත්තු ලේඛනය
## கிரிபத்கொட விஹார மகா தேவி மகளிர் வித்தியாலயத்தில் முதலாம் தரத்திற்கு மாணவியர்களை சேர்த்துக்கொள்ளல்: காத்திருப்போர் பட்டியல்
## ADMISSION OF STUDENTS TO GRADE ONE OF VIHARA MAHA DEVI BALIKA VIDYALAYA, KIRIBATHGODA: WAITING LIST

0913/'10

12. **ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) 2010 වර්ෂයේදී කිරිබත්ගොඩ විහාර මහා දේවි බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමට පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පාසලට ඇතුළත් කර ගත්, පොරොත්තු ලේඛනයේ සිටි හා පොරොත්තු ලේඛනයේ සිට ඇතුළත් කර නොගත් එක් එක් ශිෂ්‍යාවගේ නම, ලිපිනය හා ලබා ගත් ලකුණු සංඛ්‍යාව කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විශේෂ නියෝග මත එම පාසලට ඇතුළත් කළ ශිෂ්‍යාවන් පස් දෙනාගේ නම්, ලිපිනයන් ලබා ගත් ලකුණු සංඛ්‍යාවන් සහ විශේෂ හේතුව කවරේද;

(ii) 2010 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නියෝග මත අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට සම්පූර්ණයෙන් පටහැනිව විදුහල්පතිනිය විසින් ඇතුළත් කළ, සම්මුඛ පරීක්ෂණයේදී අඩු ලකුණු ලැබූ ශිෂ්‍යාවන් 18 දෙනාගේ නම්, ලිපිනයන් හා ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත පරිදි අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට හා අමාත්‍යතුමාගේ ප්‍රතිපත්තිවලට පටහැනිව ළමුන් පාසලට ඇතුළත් කළ නිලධාරීන්ට හා විදුහල්පතිනියට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත හෝ වෙනත් නීතියක් යටතේ දඬුවම් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010ஆம் ஆண்டில் கிரிபத்கொட விஹாரமகாதேவி மகளிர் வித்தியாலயத்தில் முதலாம் தரத்திற்கு மாணவியர்களை சேர்த்துக் கொள்வதற்காக நடத்தப்பட்ட நேர்முகப் பரீட்சைக்குப் பின்னர் பாடசாலைக்கு சேர்த்துக் கொள்ளப்பட்ட, காத்திருப்போர் பட்டியலில் இருந்த மற்றும் காத்திருப்போர் பட்டியலில் சேர்த்துக் கொள்ளப் படாத ஒவ்வொரு மாணவியினதும் பெயர், முகவரி மற்றும் பெற்றுக்கொண்ட புள்ளிகள் வெவ்வேறாக யாவை என்பதனை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2010ஆம் ஆண்டில் கல்வி அமைச்சின் உத்தியோகத்தர்களின் விசேட கட்டளையின்பேரில் அப்பாடசாலைக்கு சேர்த்துக் கொள்ளப்பட்ட 5 மாணவியர்களினதும் பெயர்கள், முகவரிகள், பெற்றுக்கொண்ட புள்ளிகள் மற்றும் அதற்கான விசேட காரணம் யாவையென்பதையும்,

(iii) 2010, ஒற்றோபர் மற்றும் நவம்பர் மாதங்களில் கல்வி அமைச்சின் உத்தியோகத்தர்களின் கட்டளையின் பேரில் கல்வி அமைச்சின் செயலாளரின் சுற்று நிருபத்திற்கு முற்றிலும் முரணாக பாடசாலை அதிபரால் சேர்த்துக் கொள்ளப்பட்ட நேர்முகப் பரீட்சையில் குறைந்த புள்ளிகள் பெற்ற 18 மாணவிகளின் பெயர்கள், முகவரிகள் மற்றும் இவர்கள் பெற்ற புள்ளிகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(இ) மேற்சொன்னவாறு கல்வி அமைச்சின் செயலாளரின் சுற்றுநிருபத்திற்கும் அமைச்சரின் கொள்கைகளுக்கும் முரணான வகையில் மாணவர்களை பாடசாலைக்கு சேர்த்துக்கொண்ட அமைச்சு உத்தியோகத்தர்களுக்கும் பாடசாலை அதிபருக்கும் எதிராக இலஞ்ச மற்றும் ஊழல் சட்டத்தின் அல்லது வேறேதும் சட்டத்தின் கீழ் தண்டனை வழங்கப்படுமா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன் ?

asked the Minister of Education:

(a) Will he inform this House separately of the names, addresses and marks obtained by students who were in the waiting list and admitted to school and students who were not admitted to the school though their names were in the waiting list subsequent to the interviews held for the admission of students for Grade One of Vihara Maha Devi Balika Vidyalaya, Kiribathgoda for the year 2010 ?

(b) Will he state-

(i) the names, addresses, and marks obtained and the special reason of admission of the five students who were admitted to the said school on the special orders of the officials of the Ministry of Education in 2010 ;

(ii) the names, addresses and marks obtained by the 18 students who obtained low marks at the interview and admitted by the principal on the orders of the officials of the Ministry of

Education in the months of October and November 2010, in total violation of the circular of the secretary to the Ministry of Education?

(c) Will he state whether the officials of the Ministry and the principal who admitted children to the school as stated above in violation of the circular of the secretary to the Ministry of Education and the policies of the Minister will be punished under the Bribery and Corruption Act or any other law ?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්. ආසන්නතාව මත පදනම් වූ පොරොත්තු ලේඛනය අමුණා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

අභියාචනා මත පාසලක් නොලැබී ඇති සිසුවියන් 15 දෙනකු ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

(ආ) (i) පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නිමා වීමෙන් පසුව විවිධ හේතු නිසා පාසලක් නොලද සිසුනට පාසලක් ලබා ගැනීම සඳහා අභියාචනයක් ඉදිරිපත් කරන ලෙස දන්වා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ උපදෙස් මත පුවත් පත් නිවේදනයක් 2010.05.07 දින පළ කර ඇත. එම පුවත් පත් දැන්වීමට අනුව ලැබුණු අභියාචනා විමර්ශනය කර තීරණ ලබා දීම සඳහා ත්‍රි පුද්ගල අභියාචනා කමිටුවක් පත් කරනු ලැබීය. 2010 වර්ෂයේ පත් කරන ලද එම අභියාචනා කමිටුවේ තීරණ මත අධ්‍යාපන ලේකම්වරයා සතු බලතල යටතේ පාසලක් නොලැබී ඇති සිසුවියන් පස් දෙනකු විහාර මහා දේවි විද්‍යාලයට යොමු කර ඇත.

(ii) ඉහත ක්‍රියාදාමයම අනුව මෙම අමාත්‍යාංශය වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති, එතෙක් පාසලක් නොලැබී ඇති සිසුවියන් 15 දෙනකු ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:*

*Annex tabled:*

| | | | | | |
|---|---|---|---|---|---|
| | | VIHARA MAHADEVI BALIKA VIDYALAYA - KIRIBATHGODA | | | |
| | | | GRADE I ADMISSION 2010 | | |
| | CATEGORY - CO | | (ආසන්නතාවය) | WAITING LIST | |
| SERIAL | REF. | NAME OF CHILD | NAME OF PARANT/ | ADDRESS | MARKS |
| 1 | CO 215 | K.L.SEWMINI | K.SUMANARATHNA | 410, ERIYAWETIYA, KELANIYA | 93 |
| 2 | CO 163 | W.D.D.T.N.WIJESINGHE | S.D.S.SHANTHI | 133, NATUDUWA, KELANIYA | 93 |
| 3 | CO 426 | K.A.D.N.SIRITUNGA | A.N.HEWADIVAKARA | 115A/5A, MIHINDU MW, KIRIBATHGODA | 93 |
| ✓ 4 | CO 108 | H.M.FRENANDO ✓ | I.D.S.FRENANDO | 560B, ERIYAWETIYA,KELANIYA | 93 |
| 5 | CO 266 | P.G.S.U.PERERA | S.P.C.PERERA | 597F, ERIYAWETIYA,KELANIYA | 93 |
| 6 | CO 153 | K.D.HANSIKA | K.S.SUMANASIRI | 410, ERIYAWETIYA,KELANIYA | 93 |
| 7 | CO 758 | L.D.H.L.RICHARD | L.D.G.RICHARD | 485, PADILIYATUDUWA RD, ERIYAWETIYA, KELANIYA. | 93 |
| 8 | CO 741 | R.D.V.K.AKARSHANI | N.W.C.S.PRIYADARSHANI | 496/C/3, ERIYAWETIYA,KELANIYA | 93 |
| 9 | CO 525 | L.R.CABRAL | L.G.O.CABRAL | 111/B, "RANSIRI" KANDY RD, KIRIBATHGODA | 92 |
| 10 | CO 723 | M.D.SUHARSHA | I.D.B.P.K.PALLIARACHCHI | 254/4,VITO MW., HOSPITAL RD, KIRIBATHGODA | 92 |
| 11 | CO 649 | W.A.M.MANETHMI | W.A.D.SAMPATH | 550 N, VIHARAMAHADEVI MW, ERIYAWETIYA | 90 |
| 12 | CO 43 | S.M.P.A.BANDARA | S.M.J.L.BANDARA | 157/4/A, DINGIWATHTA,WEWALDUWA,KELANIYA | 90 |
| 13 | CO 40 | C.S.THUMBOWILA | J HEWAPATHIRANA | 124,NAGAHAWATTA RD, DALUGAMA, KELANIYA | 89 |
| 14 | CO 541 | M.A.P.MUTHUMALI | G.M.E.IRESHA | 11/7A, MAKOLA SOUTH, MAKOLA | 88 |
| 15 | co 42 | W D TILINI IMASHA | P C R SUBASHINI | 539, ERIYAWATIYA KELANIYA | 88 |
| 16 | CO 727 | N.V.A.S.S.WICKRAMAPALA | S.P.WICKRAMAPALA | 159/36, PAMUNUWILA RD, GONAWELA. | 88 |
| 17 | CO 658 | A.W.A.V.D.ABESEKARA | A.W.A.A.C.ABESEKARA | 288/3, HOSPITAL RD, KIRIBATHGODA | 86 |
| 18 | CO 628 | M R T PERERA | M E R PERERA | 12/3, MAKOLA NORTH ,MAKOLA | 86 |
| 19 | CO 290 | K B D D WIJERATHNA | K B D S WIJERATHNA | 3/1, JAYA MW, MAKOLA SOUTH, MAKOLA. | 86 |
| 20 | CO 177 | SK.S.NISHANTHA | K.D.THATHSARANI | 58/9, MAKOLA SOUTH, MAKOLA | 86 |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙයට පරිබාහිරව මෙම උත්තරය ගැන අතුරු ප්‍රශ්නයක් ඇහුවාට කමක් නැද්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කමක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මීට සුමාන හතර පහකට ඉස්සර වෙලා කොම්පඤ්ඤවීදිය සිරිසාර මහා විද්‍යාලය -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මොන විද්‍යාලයේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සිරිසාර විද්‍යාලය. ඒ පාසල වහන්න කියලා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කියලා තිබෙනවා. ඒ ගැන ඔබතුමා දැනුවත් කළාට පස්සේ යම් දෙයක් කරලා තිබෙනවා. ඔබතුමාට මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න පුළුවන්ද මොන වාගේ පාසල්ද වහගෙන යන්නේ කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, දරුවෝ නැති පාසල් තමයි වහන්නේ. ආණ්ඩුවට පාසල් හදන්න පුළුවන්. නමුත් දෙමව්පියන් ඒ පාසල්වලට දරුවන් එවන්නේ නැහැ. දරුවෝ නැති වුණොත් පාසල වහනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාගෙන් ඒ ගැන මම ප්‍රශ්න කරන්නේ නැහැ. නමුත් ඒක කොම්පඤ්ඤවීදියේ තිබෙන එකම සිංහල බෞද්ධ පාසල. එතැන ළමයි 473ක් ඉන්නවා. ළමයි 100ක් සහ 125ක් සිටින ඊට එහා තිබෙන පාසල් දෙකක් තියා ගෙන මේ පාසල වහන එක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට එහෙම අසාධාරණයක් වෙලා, දරුවෝ සිටියදී පාසලක් වහනවා නම් අපට ඒක නවත්වන්න පුළුවන්. ඒ ගැන ගැටලුවක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ පාසලේ ගොඩනැගිල්ල පාවිච්චි කරලා තිබෙනවා, කලාප අධ්‍යාපන කාර්යාලයට.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම නම් ඒක විශ්වාස කරන්නේ නැහැ. නමුත් අපට පළාත් අමාත්‍යාංශයෙන් අහලා ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ පාසල් වහන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමෙක් ඉන්නවා පිළිතුරු දෙන්න.

ප්‍රශ්න අංක 13, ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා තවම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, යම් ගැටලුවක් තිබෙනවා නම් ඒ ගැන සොයා බලන්න අපට පුළුවන්. නමුත් අපි පාසල් වහන්න තීරණය කරන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඒක පිළිගන්නේ නැහැ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. 11,800ක්ව තිබුණු පාසල් ප්‍රමාණය දැන් 8,900ට අඩු වෙලා තිබෙනවා කියලා ඔබතුමා පාර්ලිමේන්තුවට වාර්තා කරලා තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එහෙනම් ඒ සම්බන්ධයෙන් ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, මම අහන්නම්. හැබැයි මේ ප්‍රශ්නය ක්ෂණිකව විසඳන්න කියලා මම ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-0645/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මොකද මේ ප්‍රශ්නයේ එක කොටසක් තමයි අපේ අමාත්‍යාංශයට අයත් වන්නේ. අනෙක් කොටසට උත්තර දෙන්න ඕනෑ මුදල් අමාත්‍යාංශය. අපි මුදල් අමාත්‍යාංශයට ලියලා තිබෙනවා, ඒ කොටසේ වාර්තාව එවන්න කියලා. ඒ වාර්තාව ආවාම උත්තර දෙන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි. මුදල් අමාත්‍යාංශයෙන් ඒ විස්තර ලබා ගෙන උත්තර දෙන්න.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
අපට කල් දෙන්න. මුදල් අමාත්‍යාංශයෙන් ඒ වාර්තාව ආවාම උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් අමාත්‍යාංශයෙන් එව්වේ නැත්නම්, - [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
නැහැ. නැහැ. රාජ්‍ය අංශයේ පඩි වැඩි කිරීම කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. රාජ්‍ය අංශයේ පඩි වැඩි කිරීම පිළිබඳව ඒ විස්තර ලැබෙන තුරු මේ ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ඒකට පැහැදිලි උත්තරයක් දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා අහන්නේ පෞද්ගලික අංශය සම්බන්ධයෙන්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ප්‍රශ්නයට සම්පූර්ණ උත්තරයක් දෙන්න ඕනෑ. එහෙම උත්තරයක් දෙන්න ඕනෑ නිසා අපි මුදල් අමාත්‍යාංශයෙන් උත්තර ඉල්ලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් අමාත්‍යාශයෙන් විස්තර අරගෙන ඔබතුමාගේ ප්‍රශ්නයට නැවත උත්තර දෙයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වැඋඩ උළු ගඩොල් කර්මාන්තශාලාව: විස්තර
## வேஉட ஓடு மற்றும் செங்கல் தொழிற்சாலை: விபரம்
## WEUDA TILE FACTORY: DETAILS

0840/'10

14. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ලංකා පිඟන් සංස්ථාවේ වත්මන් සභාපතිවරයාගේ හෝ පත් කළ නිසි බලධාරියාගේ නම සහ සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා පිඟන් සංස්ථාවට අයත් වැඋඩ උළු ගඩොල් කර්මාන්තශාලාව පිහිටි ඉඩමේ අයිතිය හිමි අය කවුරුන්ද;

(ii) එම ඉඩම විකිණීමට හෝ බදු දීමට තීරණය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැඋඩ උළු ගඩොල් කර්මාන්තශාලාවේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඔවුන් වෙනුවෙන් ලැබිය යුතු ජීවන වියදම් දීමනාව සහ අර්ථ සාධක අරමුදල් 2010 නොවැම්බර් මාසය වන තෙක් ඔවුන්ට ලැබී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම දීමනා ඔවුන්ට ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கை பீங்கான் கூட்டுத்தாபனத்தின் தற்போதைய தவிசாளர் அல்லது நியமிக்கப்பட்டுள்ள உரிய அதிகாரி யின் பெயர் மற்றும் தகைமைகள் யாவை என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை பீங்கான் கூட்டுத்தாபனத்திற்குச் சொந்த மான வேஉட ஓடு மற்றும் செங்கல் தொழிற்சாலை அமைந்துள்ள காணியின் உரிமையைக் கொண்டுள் ளவர்கள் யாவரென்பதையும்,

(ii) மேற்படி காணியை விற்பதற்கு அல்லது குத்தகைக்கு விட தீர்மானிக்கப்பட்டுள்ளதா வென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) வேஉட ஓடு மற்றும் செங்கல் தொழிற்சாலையில் வேலை செய்யும் பணியாளர்களின் எண்ணிக்கை எவ்வள வென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i) இவர்களுக்கு கிடைக்கவேண்டிய வாழ்க்கைச் செலவு புள்ளி கொடுப்பனவு மற்றும் சேமலாப நிதி, 2010 நவெம்பர் மாதம் வரையிலும் கிடைக்க வில்லை என்பதையும்,

(ii) அவ்வாறாயின் குறித்த கொடுப்பனவுகளை அவர்களுக்கு வழங்கும் திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of State Resources and Enterprise Development:

(a) Will he inform this House the name and qualifications of the incumbent Chairman or the appointed competent authority of the Ceylon Ceramic Corporation?

(b) Will he state-

(i) the names of the owners of the land in which the Weuda Tile Factory belonging to the Ceylon Ceramic Corporation is situated ; and

(ii) whether a decision has been taken to sell or lease out the said land?

(c) Will he inform this House the number of workers employed in the Weuda Tile Factory?

(d) Will he state-

(i) whether the cost of living allowance and the employees' provident fund money due for them have not been received until November 2010 ;

(ii) if so, the date on which the said allowances will be granted to them?

(e) If not, why?

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன )
(The Hon. Sarath Kumara Gunaratne )

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) නිසි බලධාරියාගේ නම - පී. සරත් වික්‍රමරත්න

සුදුසුකම් - 1963 වර්ෂයේ සිට 1980 වර්ෂය දක්වා ලංකා පිඟන් සංස්ථාවට අයත් වූ උළු කර්මාන්තශාලාවේ සහකාර කම්හල් කළමනාකරු, කම්හල් කළමනාකරු වශයෙන්ද සියලුම කර්මාන්තශාලා භාර අධීක්ෂණ කළමනාකරු වශයෙන්ද සේවය කර පළපුරුද්ද ලබා තිබීම සහ උළු ගඩොල් කර්මාන්තය පිළිබඳ ජර්මනියේ සහ ඉන්දියාවේ විශේෂ පුහුණුවක් හා පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) (i) මෙම ඉඩමේ අයිතිය ඇත්තේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවටය.

(ii) 2010.10.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සංස්ථාවේ සියලුම කම්හල් වෙන් වෙන් වශයෙන් හෝ ඒකාබද්ධව පුද්ගලික අංශය සඳහා අවුරුදු 30ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම අනුමත කර ඇත.

(ඇ) දැනට සේවය කරන සේවක සංඛ්‍යාව 53කි.

(ඈ) (i) සංස්ථාවේ සියලුම සේවකයින්ගේ සේවක අර්ථසාධක අරමුදල් 2010 ජුනි 30 දින දක්වා දැනට ගෙවීමට ක්‍රියා කර ඇත. සේවක භාරකාර අරමුදල සම්පූර්ණයෙන්ම ගෙවීමට ක්‍රියා කර තිබේ. 2010 වර්ෂය තුළදී එම වර්ෂයේ ජනවාරි සිට ජුනි වර්ෂයේ මාස 06ක් ද, 2009 වර්ෂයේ සම්පූර්ණයෙන් හිඟව තිබූ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමට ක්‍රියා කර ඇත. ජීවනාධාර මුදල් වශයෙන් රුපියල් 5,250 ක මුදලක් ගෙවීමට තිබූ අතර, ඉන් රුපියල් 2,125 ක මුදලක් ගෙවීමට ක්‍රියා කළ අතර, රුපියල් 3,125ක මුදලක් ගෙවීමට හිඟව පවතී. මීට අමතරව 2011 ජනවාරි 01 දින සිට ගෙවීමට නියමිතව ඇති රුපියල් 600ක ජීවනාධාර මුදල දැනට සංස්ථාවේ අදාළ සේවකයින්ට ලබා දීමට ක්‍රියා කරන ලදී.

(ii) සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවක් ක්‍රියාත්මක වෙමින් පවතින හෙයින් එම අවස්ථාවේදී සේවකයින්ට හිමි සියලුම හිඟ ව්‍යවස්ථාපිත දීමනා ලබා දීමට ක්‍රියා කරනු ලැබේ.

(ඉ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මහින්ද චින්තනයේ තිබුණා, කිසිම වෙලාවක කිසිම රාජ්‍ය ආයතනයක් පෞද්ගලීකරණය කරන්නේ නැහැ, හැබැයි ඒ රාජ්‍ය ආයතන අලාභ ලබනවා නම් එම අලාභය ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් කිසියම් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑය කියන යෝජනාව. මම පළමුවෙන්ම ඒ ගැන අහන්න කැමැතියි. ප්‍රතිව්‍යුහගත කිරීම හෝ පෞද්ගලීකරණය කිරීම හෝ එසේත් නැත්නම් ජනතාකරණය කිරීම නමින් අපි විවිධ කාලවල කටයුතු කළා. ගරු ඇමතිතුමනි, මේක පෞද්ගලීකරණය කිරීමක්ද, නැද්ද කියන එක මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්න කැමැතියි.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මේක පෞද්ගලීකරණය කිරීමක් නොවෙයි. එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයකු විධියට ඒවාට දැනට ඇති වී තිබෙන තත්ත්වය ඔබතුමා දන්නවා. මෙතැනදී විශාල සේවකයෝ පිරිසක් ගොඩ ගැනීමට අවශ්‍යයි. ඒ නිසා අපි සමස්ත ලංකා උළු කර්මාන්ත හිමියන්ගේ සංගමය සමඟත් සාකච්ඡා කරලා, රජයේ අයිතිය තබා ගෙන යම් කිසි බදු ක්‍රමයකට මේ කර්මාන්තශාලාව වෙනත් අයෙකුට ලබා දීලා නඟා සිටුවන්න අපි පත් කළ බලධාරියා විසින් මේ වන කොට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළටත් වඩා අපි ලොකු උත්සාහයක යෙදෙනවා දැනට උළු කර්මාන්තයේ යෙදෙන අයට සහනයක් සලසන්න. ඒ නිසා මේ වන කොට අතිගරු ජනාධිපතිතුමා ඇස්බැස්ටස් පිළිබඳව දැඩි නීති රීති ක්‍රියාත්මක කර ගෙන යනවා. හොඳ ප්‍රමිතියෙන් යුතු උළු නිපදවන්න මේ වන කොට අපි කටයුතු කර ගෙන යනවා. මේ වන කොට සැහෙන අළෙවියක සේයාවන් අපි දකිනවා. ඒ වාගේම මේ වන කොට උළු කර්මාන්තයට ඉල්ලුම් ගණනාවක් තිබෙනවා. ඒ නිසායි මේ වැඩ පිළිවෙළට අපි ඇතුළු වුණේ. එසේ නැතුව මේක පෞද්ගලීකරණය කිරීමක් නොවෙයි. ඒ අයත් එක්ක සම්බන්ධ වෙලා ඒ සම්බන්ධීකරණය තුළ කරන වැඩ පිළිවෙළක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පෞද්ගලීකරණය නොවෙයි කියලා ඒකම තමයි කරන්නේ. කමක් නැහැ.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ඔබතුමන්ලා කළා වාගේ විකිණීමක් නොවෙයි කරන්නේ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කමක් නැහැ. ඔබතුමා ඒකට බොහොම හොඳ උත්තරයක් දුන්න නිසා අපි ඉවසලා ඉමු. අනික් එක මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ උළු කර්මාන්තශාලාව ක්‍රියාත්මක කර ගෙන යන්න භාර දෙන්න දැනට කවුරු හෝ පුද්ගලයෙක් හඳුනා ගෙන තිබෙනවාද?

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
තවම නම් කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අපි පුවත් පත් දැන්වීම් මඟින් ඒක ප්‍රකාශයට පත් කළා විතරයි. කිසිම කෙනෙකුට පෞද්ගලිකව දෙන්න හෝ ඒ වාගේ වැඩ පිළිවෙළක් දැනට නම් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

## බෝගොඩ රජමහා විහාර පූජා භූමිය: පරිසර හානිය
## போகொடை ரஜமகா விஹாரைப் புனித பிரதேசம்: சூழல் சீர்கேடுகள்
## BOGODA RAJAMAHA VIHARA SACRED AREA: ENVIRONMENTAL DEGRADATION

0895/'10

15. **ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ලෝක උරුමයක් වූ බෝගොඩ රජමහා විහාරය සහ ඓතිහාසික බෝගොඩ ලී පාලම ඇති ස්ථානයට යාබදව කළු ගල් වළක් (quarry) පවත්වාගෙන යන බවත්;

(ii) ඒ හේතුවෙන් මෙම පූජා භූමිය ආශ්‍රිතව විශාල පරිසර හානියක් සිදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගල් වළ පවත්වාගෙන යෑම සඳහා අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, සංස්කෘතික වටිනාකමකින් යුත් ඉහත ස්ථානයේ සිදු වන පරිසර හානියට වග කිව යුත්තෝ කවුරුන්ද;

(iii) එම පරිසර හානිය වළක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலக மரபுரிமையான போகொடை ரஜமகா விஹாரையும் வரலாற்று சிறப்புமிக்க போகொடை மரப்பாலமும் அமைந்துள்ள இடத்துக்கு அருகில் கற்சுரங்கமொன்று நடத்தப்பட்டு வருவதையும்,

(ii) அதன்மூலம் மேற்படி புனித பிரதேசத்தை அண்டிய தாக பாரிய சூழல் சீர்கேடுகள் ஏற்படுவதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கற்சுரங்கத்தை பேணிக்கொண்டு நடத்துவதற்கு அனுமதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், கலாசார பெறுமதிமிக்க மேற்படி பிரதேசத்தில் இடம்பெறும் சூழல் சீர்கேடுகளுக்கு பொறுப்புக் கூறவேண்டியவர்கள் யாவர் என்பதையும்,

(iii) மேற்படி சூழல் சீர்கேட்டை தடுப்பதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கை யாவை யென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware -

(i) that a quarry is run in a place which adjoins the land in which the Bogoda Rajamaha Viharaya, which is a world heritage, and the historic Bogoda Wooden Bridge are situated;

(ii) a serious environmental damage caused by the aforesaid quarry in the vicinity of the aforesaid sacred area ?

(b) Will he inform this House -

(i) whether, permission has been granted to run the above-mentioned quarry;

(ii) if so, the names of the persons who are responsible for the environmental damage caused to the aforesaid place of cultural importance;

(iii) of the steps that will be taken to prevent the aforesaid environmental damage?

(c) If not, why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

(අ) (i) බෝගොඩ රජමහා විහාරය සහ ඓතිහාසික බෝගොඩ ලී පාලම ඇති ස්ථානයට ආසන්නයේම පිහිටා ඇති ගල් වළට එම ස්ථානවල සිට ඇති දුර ප්‍රමාණය දළ වශයෙන් මීටර් 650ක් පමණ වේ.

(ii) වාර්තා වී නොමැත.

(ආ) (i) දඹේතැන්න වත්ත, බෝගොඩ, ජගුල්ල යන ලිපිනයැති ඩී.එම්. උපුල් ශාන්ත යන අය නමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2011.02.12 සිට 2012.02.11 දින දක්වා වලංගු වන පරිදි C කාණ්ඩයේ කැණීම් බලපත්‍රයක් නිකුත් කර ඇත. එහෙත් මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර නොමැත. මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාව අනුව දැනට ගල් වළ ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත.

(ii) ඉහත (ආ) (i) අනුව අදාළ නොවේ.

(iii) ඉහත (ආ) (i) අනුව අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, මේ පිළිතුරේ ඇමතිතුමා කිව්ව විධියට බෝගොඩ ලී පාලමේ සිට ගල් වළට ඇති දුර මීටර් 650යි. මෙම ගල් වළේ සිට මීටර් 650ක් දුරින් ලෝක උරුමයක් තිබෙන කොට, එම ගල් වළේ ඇති කරන පිපිරීමකදී අනිවාර්යයෙන්ම ඒ ලෝක උරුමයට යම් කිසි මට්ටමක හානියක් වන්නට ඉඩ තිබෙන්න පුළුවන් කියන එක ඔබතුමාත් විශ්වාස කරනවා ඇති කියලා මම හිතනවා. ඔබතුමා කිව්වා, දැන් ඒ ගල් වළ ක්‍රියාත්මක තත්ත්වයේ නැහැ කියලා. නමුත් තවමත් ඒ ගල් වළ ක්‍රියාත්මක තත්ත්වයේ තිබෙන්නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මම ඒ ගැන සොයලා බලලා පාර්ලිමේන්තුවට වාර්තා කරන්නම් ගරු කථානායකතුමනි. සාමාන්‍යයෙන් එවැනි බලපත්‍රයක් නිකුත් කිරීමේදී සියලු කාරණා සැලකිල්ලට අරගෙන තමයි නිකුත් කරන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ලෝක උරුමයක් තිබෙන තැනක්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ප්‍රශ්නයක් තිබෙනවා නම් මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

බොහොම ස්තුතියි.

## ශ්‍රී ලංකාවේ වෛද්‍යවරු: විස්තර
## இலங்கையிலுள்ள மருத்துவர்கள்: விபரம்
## DOCTORS IN SRI LANKA: DETAILS

0578/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරු වශයෙන් ලියා පදිංචි වීමට සුදුසුකම් ලබන විදේශ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත කී උපාධිධාරීන් වෛද්‍යවරු වශයෙන් ලියා පදිංචි කිරීම සඳහා පවත්වනු ලබන විභාග, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන්නේද සහ 2010.01.01 දින සිට එය වෙනත් අධිකාරියකට පවරා තිබේද;

(iv) එසේ පවරා තිබේ නම්, එම නව අධිකාරියේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරක කාලයක් සඳහා මෙරටට අවශ්‍ය වන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරයකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කවරේද;

(iii) ඔවුන්ට ලබා දී ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේදී සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් හට නිවාඩු ලබා විදේශගත වීමට අවසර තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එලෙස නිවාඩු ලබා ගෙන විදේශ ගතවීම සඳහා අවසර ලබා දෙන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பல்கலைக்கழகங்களிலிருந்து ஆண்டுதோறும் வெளியேறும் மருத்துவர்களின் எண்ணிக்கையையும்,

(ii) மருத்துவர்களாக பதிவு செய்வதற்கான தகுதியைப் பெறும் வெளிநாட்டு மருத்துவ பட்டதாரிகளின் எண்ணிக்கையையும்,

(iii) மேற்படி பட்டதாரிகளை மருத்துவர்களாக பதிவுசெய்வதற்கான பரீட்சைகள் இலங்கை மருத்துவச் சங்கத்தால் மேற்கொள்ளப்படுகின்றதா என்பதையும், 01.01.2010 முதல் செயற்படும் விதமாக வேறொரு அதிகார சபையிடம் இப்பணி ஒப்படைக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iv) அவ்வாறாயின், அப்புதிய அதிகாரசபையின் பெயரையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இந்நாட்டில் ஆண்டொன்றிற்கு தேவைப்படும் மருத்துவர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) ஒரு மருத்துவருக்கு வழங்கப்படும் சராசரிச் சம்பளம் யாதென்பதையும்,

(iii) அவர்களுக்கு வழங்கப்படும் ஏனைய நன்மைகள் யாதென்பதையும்,

(iv) இலங்கையில் தகுதி பெறும் மருத்துவர்கள் விடுமுறையில் வெளிநாடுகளுக்கு செல்வதற்கு அனுமதியளிக்கப்படுகின்றதா என்பதையும்,

(v) அவ்வாறாயின் அவர்கள் விடுமுறையில் இருப்பதற்கு அனுமதிக்கப்படும் கால அளவையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House-

(i) the number of doctors pass out per year from Sri Lankan universities;

(ii) the number of overseas medical graduates who are accounted to be registered as doctors ;

(iii) whether the exams to register the aforesaid graduates as doctors are carried out by the Sri Lanka Medical Council and it has been assigned to another authority w.e.f. 01/01/2010; and

(iv) if so, the name of the new authority ?

(b) Will he state-

(i) the requirement of doctors in the country per year;

(ii) the average salary paid to a doctor;

(iii) the other benefits given to them;

(iv) whether the doctors qualified in Sri Lanka are permitted to go overseas on leave; and

(v) if so, the time period they are allowed to be on leave ?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க )
(The Hon. Lalith Dissanayake )

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2009 වර්ෂයේදී වෛද්‍යවරු 899යි. 2010 වර්ෂයේදී වෛද්‍යවරු 912යි.

(ii) 2009 වර්ෂයේදී වෛද්‍යවරු 133යි. 2010 වර්ෂයේදී වෛද්‍යවරු 83යි.

(iii) ඔව්. දැනට විදේශවලින් සමත් වන වෛද්‍යවරුන් සඳහා විභාග පැවැත්වීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට භාර දීලා තිබෙනවා. නඩු තීන්දුවක් අනුව තමයි එවැනි පැවරීමක් කර තිබෙන්නේ.

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

(ආ) (i) 1,200ක් පමණ විශ්‍රාම යෑම් ප්‍රතිපූරණයට හා අලුතින් එක් වන අංශවල සේවයේ යෙදවීමටයි මේ වෛද්‍යවරුන් එන්නේ. 1,200ක් තමයි අවශ්‍යතාව. 1,200ක් දෙනාගේ අවශ්‍යතාව තියෙන්නේ සාමාන්‍යයෙන් වෛද්‍යවරුන් විශ්‍රාම යෑම සහ විදේශගත වීම මත ඇති වන පුරප්පාඩු පිරවීමටයි.

(ii) ඇමුණුම 1 බලන්න.

(iii) ඇමුණුම 2 බලන්න.

ඇමුණුම් **සභාගත*** කරමි.

(iv) ඔව්.

(v) සේවය ස්ථිර කර ඇති වෛද්‍ය නිලධාරින්ට පෞද්ගලික හා සාමාන්‍ය කාර්යයන් සඳහා - මාස 06යි (උපරිමය)

විදේශ රැකියා සඳහා අවුරුදු 05යි (උපරිමය) - ආයතන සංග්‍රහයේ XII : 16ට අනුව.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
*Annexes tabled:*

**ඇමුණුම 01**

වෛද්‍යවරයෙකුට ගෙවනු ලබන ආරම්භක මූලික වැටුප පහත සඳහන් අයුරින් වර්ග කළ හැකිය.

| ශ්‍රේණිය | ආරම්භක වැටුප හා දීමනා (රුපියල්) |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 26,160/- + දීමනා |
| දෙවන ශ්‍රේණිය | 28,095/- + දීමනා |
| නියෝජ්‍ය වෛද්‍ය පාලන ශ්‍රේණිය | 30,175/- + දීමනා |
| පළමුවන ශ්‍රේණිය | 34,345/- + දීමනා |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පාලන ශ්‍රේණිය | 36,755/- + දීමනා |
| විශේෂඥ ශ්‍රේණිය | 42,390/- + දීමනා |

මෙහි දී දීමනා ලෙස රජයේ නියමිත ජීවන වියදම් දීමනා සහ විවේක කාල රාජකාරි බාධා, ප්‍රවාහන, පැමිණ සිටීමේ දීමනාව වෙනුවෙන් රු. 10,000ක් ද, පරිපාලන කටයුතු සඳහා රුපියල් 6,000ක දීමනාවක්ද ලබා දේ.

**ඇමුණුම 02**

- සේවා දීමනා සහ ඉරිදා, ප්‍රසිද්ධ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් විශ්‍රාම වැටුප් දීමනා ඇතුළු මූලික වැටුපෙන් 1/20 දීමනාව,
- අතිකාල දීමනා - දිනකට උපරිම පැය 04ක් හා මසකට උපරිම පැය 120ක් වන පරිදි.

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | පැයකට රුපියල් 210/- |
| දෙවන ශ්‍රේණිය | පැයකට රුපියල් 280/- |
| පළමුවන ශ්‍රේණිය | පැයකට රුපියල් 300/- |
| විශේෂඥ ශ්‍රේණිය | පැයකට රුපියල් 350/- |

- නිල නිවාස පහසුකම් (අදාළ ආයතනයේ නිල නිවාස පහසුකම් සපයා දී ඇති විට)

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපට ප්‍රමාණවත් පරිදි, ලංකාවේ විශ්වවිද්‍යාලවලින් දොස්තරවරු පිට වන විට පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් තවත් දොස්තරවරු පිට වන ප්‍රතිපත්තියක් ආණ්ඩුව අනුගමනය කරනවාද, කවදාද ඒක ආරම්භ කරන්නේ කියා මම අහනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් පිට වන වෛද්‍යවරුන් සම්බන්ධ කාරණාව මෙම ප්‍රශ්නයට අදාළ නැහැ. මේ ප්‍රශ්නයට අදාළ වන්නේ පෞද්ගලිකව විදේශගත වෙලා විභාග කරලා එන වෛද්‍යවරුන් සහ -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙතැනින්ම උත්තරය ලැබෙනවා. රටට අදාළ ප්‍රශ්නයකුයි මම අහන්නේ. ඒකට ඔව් කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මේක මේ ප්‍රශ්නයට අදාළ නැහැ. මට අද යොමු කරලා තිබෙන ප්‍රශ්නය පෞද්ගලික විශ්වවිද්‍යාලවලට සම්බන්ධ නැහැ ගරු කථානායකතුමනි. ඒ නිසා මම ඒකට උත්තර දෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතැන "ඔව්" කියා තිබෙනවා. ඒකයි මම අහන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෞද්ගලික විශ්වවිද්‍යාල නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, විදේශගත විශ්වවිද්‍යාලවලින් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද, ආසියාවේ මේ වාගේ රටවල් දියුණු කරන්න දොස්තරවරු ඕනෑ. ළිඳේ ඉන්න ගෙම්බො වාගේ හැසිරෙන්න එපා. ඇමතිවරයා කියනවා "ඔව්" කියලා. හොඳයි.

දෙවැනි කාරණය තමයි උතුරු නැඟෙනහිර සහ සබරගමුව ප්‍රදේශයේ දොස්තරවරුන්ගේ හිඟයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ හිඟ පැතිවලට නිසියාකාරව දොස්තරවරුන් යවන්න පුළුවන් මාර්ගයක් ඇති කරනවාද? කවදාද ඒක කරන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මේ අසා තිබෙන ප්‍රශ්නයේ නම් සබරගමුවේ වෛද්‍යවරුන්ගේ හිඟයක් ගැන සඳහන් කරලා නැහැ. වෛද්‍යවරු ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ඒ සඳහා වැඩ බැලීමට වෛද්‍යවරු පත් කර තිබෙනවා. වෛද්‍යවරුන්ගේ හිඟයන් ඇති වන අවස්ථාත් තිබෙනවා. නමුත් ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහන්නේ දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. අම්පාරේ, ත්‍රිකුණාමලයේ දොස්තරවරුන්ගේ හිඟය සම්බන්ධවයි. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් නම් ඕනෑම ප්‍රශ්නයකට උත්තර දෙන්න පුළුවන් නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ. මම ඒ තොරතුරු සොයලා ඉදිරිපත් කරන්නම්. මම සූදානම් වෙලා ආවේ මේ අසා තිබෙන ප්‍රශ්නයට උත්තර දෙන්නයි. ගරු කථානායකතුමනි, එතුමා අසා තිබෙන ප්‍රශ්නයට මා උත්තර දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝගවලට අනුව අතුරු ප්‍රශ්න ඇසිය යුතුයි. ඇමතිතුමා සූදානම් වෙලා ඇවිත් තිබෙන්නේ ඔබතුමා අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු දෙන්නයි. ඒ නිසා ඒ ප්‍රශ්නයට අදාළ නැති ඒවා අහන්න එපා. [බාධා කිරීමක්] අදාළ නැති ඒවා අහන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕකයි ආණ්ඩුවට වෙලා තියෙන්නේ. පුටුව තියෙනවා, ඔළුව නැහැ. මේ පැත්තේ ඔළුව තියෙනවා, පුටුව නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එහෙම තමයි. ඔළුව නැති වුණත්, පුටුව නැති වුණත් ගරු මන්ත්‍රීතුමා 32,38,400ක් අපට ඡන්දය දුන්නා. සියයට 55ක් ඡන්දය දුන්නා. ආයතන 250ක් අපි දිනුවා. මන්ත්‍රීවරු 1,839 දෙනෙක් අපි පත් කර ගත්තා. තමුන්නාන්සේලා ගිහිල්ලා හොරණෑ කළා නේ. තමුන්නාන්සේලා මොනවා කිව්වත් අතිගරු ජනාධිපතිතුමාට ජනතාවගේ ගෞරවය තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වා නේ ගම ගන්නවාය කියලා. ගම ගත්තාද? ගම ගන්නවාය කිව්වා. ගත්තාද? අපි දිනුවා. අපේ නායකතුමා දිනුවා. අපේ ජනාධිපතිතුමාගේ වැඩසටහන ජනතාව පිළිගත්තා. මේ වැඩසටහන හරි. පස් පිඩැලි කැපුවේ නිකම් නොවෙයි. Swimming pool නොවෙයි, වරායවල් හදලා තියෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළ නැත. [බාධා කිරීමක්] ප්‍රශ්නයට අදාළ නැහැ. [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අතිගරු ජනාධිපතිතුමා අද නොරොච්චෝලේ විදුලි බලාගාරය විවෘත කරනවා. විදුලිය ඒකකයක් රුපියල් නවයකට නිෂ්පාදනය කරන්න අද අපේ නායකතුමාගේ අතින් නොරොච්චෝලේ විදුලි බලාගාරය විවෘත කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය - [බාධා කිරීමක්] අපි දොස්තරවරු ගැන ප්‍රශ්න කළේ. එතුමා නොරොච්චෝලෙට ගිහිල්ලා. [බාධා කිරීමක්] අපි දොස්තරවරු ගැන ප්‍රශ්නය අහන්නේ. එතුමා නොරොච්චෝලේට ගිහිල්ලා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමා, මෙතුමා තව ප්‍රශ්නයක් අහනවා. පිළිතුරු දෙන්න සූදානම් වෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. මේ රෝහල්වල බෙහෙත් නැහැ. දොස්තරවරු සිටියාට වැඩක් නැහැ, බෙහෙත් නැත්නම්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැතිලු.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න. එතකොට මම උත්තර දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තිබෙන්නේ අමාත්‍යාංශ නිවේදන. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා.

## භූමි කම්පාව සහ සුනාමියෙන් පසු ජපානයේ වර්තමාන තත්ත්වය: විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பூமியதிர்ச்சி மற்றும் சுனாமியின் பின்னர் ஜப்பானின் தற்போதைய நிலைமை: வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று
## CURRENT SITUATION IN JAPAN FOLLOWING EARTHQUAKE AND TSUNAMI : STATEMENT BY HON. MINISTER OF EXTERNAL AFFAIRS

**ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

Mr. Speaker, I seek your indulgence to make a Statement on behalf of the Government on the current situation in Japan following the earthquake and tsunami.

The Government of Sri Lanka expressed its deepest sympathies to His Imperial Majesty Emperor Akihito and the Government of Japan in the wake of the destruction caused by the earthquake, which was followed by a tsunami. His Excellency the President, in his message of condolence, stated that the Japanese people possess incredible resilience and courage that will certainly help them to overcome any destruction and to continue on the path of national progress. In a further manifestation of solidarity, support and compassion, His Excellency the President personally visited the Japanese Embassy in Colombo to meet with His Excellency Kunio Takahashi, the Ambassador of Japan and to sign the condolence book.

Under His Excellency the President's guidance and directive, the Government of Sri Lanka pledged a donation of US Dollars 1 million for the relief and recovery efforts that are currently underway in Japan. The cheque of US Dollars 1 million will be handed over by Dr. P.B. Jayasundara, Secretary to the Treasury, to the Japanese Ambassador today. As further testimony to the abiding friendship and solidarity between Sri Lanka and Japan, the Government of Sri Lanka has, parallel to the donation, offered to dispatch a team of medical professionals to help care for those who have been affected by the disaster along with a search and rescue team comprising armed forces personnel who are trained and equipped for that purpose. The Government will extend further assistance to the people of Japan, if necessary.

Mr. Speaker, the Government of Japan has informed us that there is no need for measures of an emergency nature following the explosions of the nuclear power plants in the Fukushima area, which is approximately 200 kilometres north-east of Tokyo. The Government of Sri Lanka has full confidence that the Japanese Government will take all necessary measures to manage the situation.

A large number of Sri Lankans opted to return to Sri Lanka, following the disaster. The Ministry of External Affairs, in consultation with the Embassy of Sri Lanka in Japan and the SriLankan Airlines, facilitated their return, which was purely a commercial operation. Our Embassy continues to be in close contact with the relevant Japanese officials with a view to ensuring the safety and well-being of Sri Lankans in Japan.

Sir, I wish to reiterate that the Government of Sri Lanka stands ready to give further assistance to the people of Japan in order to assist them in overcoming the devastation. We have every confidence that the people of Japan, drawing on their tremendous reserves of strength and courage and showing their indomitable spirit as they have often done on many occasions in their history, will overcome this calamity.

We wish them every success. The Government and people of Sri Lanka stand by them in a spirit of friendship and solidarity at this time of difficulty.
Thank you, Mr. Speaker.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, 2011 මාර්තු මස 11 වන දින ජපන් රට මුහුණ දුන් බිහිසුණු භූමි කම්පාවත්, ඒ සමඟම ඇති වූ සුනාමි තත්ත්වයත් හේතුවෙන් ජපන් රටේ දහස් ගණනක් ජනතාවගේ ජීවිත සහ දේපොළ විනාශ විය. එමෙන්ම මේ වන විටත් ජපාන න්‍යෂ්ටික බලාගාරයේ ඇති වූ පිපිරීම හේතුවෙන් එරට දැඩි අවදානමකට මුහුණ දී සිටියි. ජපන් රජය ශ්‍රී ලංකා රජය සමඟ ඉතා දිගු සමීප මිත්‍රත්වයක් පවත්වාගෙන යන බෞද්ධ රටක් වශයෙන් සැලකෙන අතර පසු ගිය වසර ගණනාවක් තිස්සේම ශ්‍රී ලංකාවට විවිධාකාරයෙන් ආධාර උපකාර ලබා දුන් ප්‍රධානම රට බවට හඳුන්වා දිය හැකිය. දෙවන ලෝක යුද්ධයෙන් විනාශ වූ රටවල් වෙනුවෙන් ජපානයේ සාම ගිවිසුම සඳහා සැන්ප්‍රැන්සිස්කෝ නුවරදී පවත්වන ලද ජාත්‍යන්තර සමුළුව අමතා හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් "නහි වෙරෙන වෙරානි" යන බුදු වචන සිහි කරමින් ජපානයෙන් යුද්ධ වන්දි ප්‍රතික්ෂේප කිරීම නිසා ජපානයේ ජනතාව ශ්‍රී ලංකා ජනතාව කෙරෙහි විශේෂ ගෞරවයක්ද දක්වති. එහෙයින් දැනට ජපානය මුහුණ පා ඇති

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඛේදජනක තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් වන අප සියලු දෙනාම ජපන් රටේ ජනතාව සමඟ එක් වී සිටින බවත්, ඔවුනට අවශ්‍යව ඇති මානුෂීය සහ භෞතික ආධාර ලබා දිය යුතු බවටත් ශ්‍රී ලාංකීය ජනතාවගේ ශෝකය ජපන් රටටත්, ඒ රටේ ජනතාව වෙතත් මෙම පාර්ලිමේන්තුව හරහා ප්‍රකාශ කළ යුතු බවත් මා යෝජනා කරන්න කැමැතියි.

විශේෂයෙන්ම වීර්යය, නොපසු බට උත්සාහය, අප්‍රමාදය, තැන්පත්කම හා ඉන්ද්‍රීය දමනය යන දේවලින් කෙලෙස් වතුරට යට නොවන මුදුනක් තනා ගන්න පණ්ඩිතයා සමත් වන බව ධම්ම පදයේ සඳහන් වනවා. වීර්යය, නොපසු බට උත්සාහය, අප්‍රමාදය, තැන්පත්කම හා ඉන්ද්‍රීය දමනය පදනම් කරගෙන මේ විපතින් යළි උපදින්නට ජපන් ජාතිකයන්ට හැකි වන බව අපගේ විශ්වාසයයි. ගරු කථානායකතුමනි, මම ඉංග්‍රීසි භාෂාවෙනුත් වචන ස්වල්පයක් කථා කරන්න කැමැතියි.

Hon. Speaker, in recent times no country has had to face the triple-disaster faced by Japan. Japan is a country, which from time to time, had to face earthquakes and tsunamis. But, no one anticipated an earthquake of this magnitude - of 9 Richter scale. It was so severe that the resulting tsunami in fact came over the tsunami walls that were put up to protect the cities in that part of Japan. We saw on television, major ships resting next to skyscraper buildings or high-rise buildings in those cities. What has concerned the world in addition to this is the Fukushima Nuclear-Power Plant explosion, which delayed the rescue efforts and as a result even today, there is no final estimate of the dead. I read that it had been estimated to be 18,000. Though the Fukushima Nuclear-Power Plant has to a large extent been brought under control, the surge in the pressure of the number 3 reactor is still unsettling and the world itself is concerned of the use of nuclear-power plants.

We have to remember the help the Japanese Governments have given us for many projects - whether it be power like the Samanalawewa, whether it be the Sri Jayewardenepura General Hospital or the National Youth Services Centre in Maharagama or the roads that we built. This country which has helped us so much has suffered damage which is estimated to be 4 per cent of their GDP and the World Bank says it will take five years to overcome this disaster. So, at this time, the thoughts of the people of our country are with the people of Japan and we all wish them a speedy recovery. We know that the people of Japan are undergoing tremendous hardships comparable to what their grandparents and their parents faced with Hiroshima, Nagasaki and the end of the World War II. But, we have to admire the Japanese people for the spirit in which they have faced these disasters and we hope that their country will be settled back to normal and soon recover to give leadership to the Asian countries.

Mr. Speaker, I think the sentiments expressed by the Government, the Hon. Minister of External Affairs and me and whatever you say, should be conveyed to the Japanese Government, the Japanese Parliament and to their Imperial Majesty the Emperor.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01 සිට 08 දක්වා පනත් කෙටුම්පත් දෙවැනි වර කියැවීම සහ විෂය අංක 13 දරන රේගු ආඥාපනත යටතේ යෝජනාව සම්මත කිරීම. ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී ගන්නා ලද තීරණය අනුව අද දින න්‍යාය පත්‍රයේ අංක 01 සිට 08 දක්වා සහ අංක 13.

# එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
## VALUE ADDED TAX (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. භා. 2.16]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද අප සාකච්ඡා කරන පනත් කෙටුම්පත් ගැන කථා කිරීමට ප්‍රථමයෙන් මම ජපානයේ ඛේදවාචකය ගැන ඉංග්‍රීසි භාෂාවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට කැමැතියි.

Today, we are expressing our solidarity with the Government and people of Japan, who have been the strongest development partners of our country. For over 50 years, as the Hon. Leader of the Opposition mentioned, Japan has been helping us in our development efforts. But, it is particularly poignant because when the tsunami struck Sri Lanka in 2004, the first country that came to our assistance was Japan. They gave us an immediate grant of US Dollars 90 million which was a grand humanitarian gesture. They did not go through the normal Parliamentary procedures, which are so important in development assistance. Within a matter of days, the Government of Japan released US Dollars 90 million to Sri Lanka for our rehabilitation efforts. They followed it

up with a soft loan of another US Dollars 90 million. So, at this time of tragedy, I think we should all have our feelings of sadness as well as confidence in the Government and people of Japan who came to our assistance at a very difficult time.

I must also mention that we have received a large amount of development assistance from Japan, for the outstanding work that we have been able to do. The new Mannar Bridge, improvement to the causeway, the Outer Circular Highway Project, Southern Transport Development Project, Upper Kotmale Hydropower Project and many other very important ventures, which we have undertaken have been financed by Japan. So, they have been great friends of ours and I think we should convey to the Government and people of Japan, our appreciation of what they have done for us and our determination to express our solidarity to our friends.

Now, Sir, I want to get to the main Business of the Day.

ගරු කථානායකතුමනි, අද අපි සාකච්ඡා කරන්නේ, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත, පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත් කෙටුම්පත, හරබදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත, මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සහ රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.02.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කිරීම යන විෂයයන් සම්බන්ධවයි. ගරු කථානායකතුමනි, මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි මෙම යෝජනා සියල්ලම පසු ගිය අය වැය ලේඛනය තුළින් ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ඉදිරිපත් කර, මේ ගරු සභාව විසින් අනුමත කරන ලද යෝජනා බව. නෛතික හේතූන් මත ඒ ඒ අදාළ පනත් සංශෝධනය කිරීම අවශ්‍යයි ඒවාට ක්‍රියාත්මක කිරීමේ බලය ලබා දීමට. එතකොට මේ හුඟක් සංශෝධන පසු පස තිබෙන්නේ අපේ බදු ක්‍රමය සංශෝධනය කිරීමට අපේ තිබෙන අභිලාෂයයි. අපේ රජය කිහිප වතාවක්ම මේ ගරු සභාවේ සඳහන් කර තිබෙනවා, දැන් පවතින බදු ක්‍රමය සංකීර්ණයි, පැටලිලි සහගතයි. එම නිසා ඒක සංශෝධනය කරලා සරල බදු ක්‍රමයක් ඇති කිරීම අවශ්‍යයි කියලා. ඒ අනුව අපේ රජය පත් කළා බදු කොමිසමක්. තමුන්නාන්සේලා දන්නවා, ඒ බදු කොමිසමේ සාමාජිකයන් අප කාටත් පිළිගන්න පුළුවන් මේ ක්ෂේත්‍රය පිළිබඳ හොඳ දැනුමක් තිබෙන අය කියලා. මට ඔක්කෝම නම් කියවන්න වුවමනාවක් නැහැ. ඒ බදු කොමිසමේ සභාපතිවරයා වුණේ, මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතායි. ඒ අදහස් ගරු ජනාධිපතිතුමා එතුමාගේ 2011 අය වැය කථාවේදී සඳහන් කළා.

I quote:

"Hon. Speaker, in support of this overall vision, I intend to revamp our entire taxation strategy. The findings of the Presidential Commission of Taxation provided some valuable ideas. We all agree that our tax system is complex, tax rates are too high and

taxation is narrowly based. I propose to make some drastic changes".

ඒ, ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට 2011 අය වැය කථාවේදී මෙම ගරු සභාවේ කරන ලද ප්‍රකාශයයි. ඒ අදහස් ක්‍රියාත්මක කිරීමට තමයි අපි මෙයින් බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන්ම අපි මේ බදු ක්ෂේත්‍රයේ ආදායම් බදු, ඒ වාගේම VAT, ඒ වාගේ Nation Building Tax - NBT - එක සහ Economic Service Charge කියන සියල්ලම විමර්ශනය කරලා වඩාත් සහනදායී සහ සරල ක්‍රමයකට ක්‍රියාත්මක කිරීමට තමයි මේ යෝජනාවලින් බලාපොරොත්තු වන්නේ. ඒවායේ අරමුණ මොකක්ද කියන එක මට තමුන්නාන්සේලාට ලේසියෙන් පැහැදිලි කරන්න පුළුවන්. මොකද, මේ බදු කොමිසමේ වාර්තාව අනුව අපට පෙනෙනවා අපේ අරමුණු විය යුත්තේ මොනවාද කියලා. මම ඒ බදු කොමිසමේ වාර්තාවෙන් කොටසක් කියවන්නම්. ඒ අය කියනවා, "The overall principle which guided the Commission in its deliberations was the need to develop a fair and equitable tax system".

තමුන්නාන්සේලා දන්නවා ඇති, මේ සභාවේ දෙපාර්ශ්වයෙන්ම, ඒ වාගේම සුළු බදු ගෙවන්නන්, මධ්‍යම කොටසේ බදු ගෙවන්නන්, ව්‍යාපාරිකයන් හැම දෙනාම නිරන්තරයෙන් ඉල්ලීමක් කළා, "අපට සරල බදු ක්‍රමයක් දෙන්න, බදු ක්‍රම විශාල ගණනක් තියන්න එපා, පුළුවන් නම් ඒවා ඒකාබද්ධ කරන්න, එහෙම නැත්නම් එක්තරා සැලැස්මක් අනුව අපට බදු ගෙවන්න හදලා දෙන්න" කියලා. ඉතින් ඒ අරමුණ කරා යෑමේදී තමයි අපි මේ අලුත් පනත්, නැත්නම් පනත් සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. ව්‍යාපාරිකයන් සමඟ, බදු ගෙවන්නන් සමඟ, ඒ අයගේ ආයතන සමඟ අපි නිරන්තරයෙන් සාකච්ඡා කරනවා. අපි හැකි තරම් දුරට ඒ, ඒ යෝජනා ගැන සාකච්ඡා කරලා තමයි මේ බදු සංශෝධන ඉදිරිපත් කරන්නේ.

ඒ තුළ අපේ බලාපොරොත්තු මෙන්න මෙවායි: A tax system which is streamlined and rationalized, easy to administer, taxpayer-friendly in nature and promotes economic growth and development while enhancing compliance and generating larger revenues to support the Government's development and social welfare programmes.

දැන් මේක අත්‍යවශ්‍යයි. මොකද මේ බදු ක්‍රමය සරල කරලා, පහසු කරලා, බදු ගෙවිය යුතු නමුත් බදු නොගෙවන කොටස්වලටත් මේ සරල ක්‍රමය තුළින් බදු ගෙවීමේ පහසු ක්‍රමයක් ඇති කර ගන්න ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා අපේ සෑම පර්යේෂණයක් තුළින්ම පෙනෙන දෙයක් තමයි, compliance බව. ඒ කියන්නේ බදු ගෙවිය යුතු අයගෙන් කොටසක් පමණයි ඇත්ත වශයෙන් බදු ගෙවන්නේ. මොකද අපේ තිබෙන්නේ self-declaration system එකක්. අපිම තමයි අපේ ආදායම් පිළිබඳ ප්‍රකාශනයක් කරන්නේ. ඒ self-declaration එක අනුව තමයි බදු ගණනය කරන්නේ. එතකොට ඉතාම අවශ්‍යයි, ඒ බදු ගෙවන්නාට මේ බදු දැලට ඇතුළු වීමට පුළුවන් සහනදායී ක්‍රමයක් තිබීම. ඒ කියන්නේ ඔහුට හසුරුවා ගන්න පුළුවන්, ඒ වාගේම කැමැත්තෙන් ඔහුගේ ඒ අවම ගෙවීම කිරීමට සුදුසු වාතාවරණයක් - taxpayer-friendly - ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒක හැම බදු පරිපාලනයකම අරමුණක්. ඒක payer friendly එකක්. This ought to be done without adverse impacts on the processes of investment and on living conditions of the low and middle income groups.

ගරු කථානායකතුමනි, මේ පනත් සංශෝධනවල තියෙන එක අරමුණක් තමයි මේ සරල කිරීම තුළ විශේෂයෙන් සුළු සහ මධ්‍යම කොටස්වලට ගෙවන්න තිබෙන ඒ බදු ප්‍රමාණය සහනයට ලක් කිරීම. නිදසුනක් වශයෙන් ගත්තොත්, ඉස්සර ලක්ෂ තුනක් ආදායම් ලබන අය අනිවාර්යයෙන් ඒ බදු දැලට අහු වෙනවා. දැන් මේ සංශෝධන තුළ ඒ ප්‍රමාණය ලක්ෂ පහක් දක්වා ඉහළ දමා

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

තිබෙනවා. එතකොට ලක්ෂ තුනේ සිට ලක්ෂ පහ දක්වා මීට ඉස්සර බදු ගෙවපු අය දැන් බදු ගෙවීම අවශ්‍ය නැහැ. පරිපාලන වශයෙන් එහි තිබෙන හුඟක් ලිපි ගොනු එතකොට අකර්මණ්‍ය ලිපි ගොනු බවට පත් වෙලා, පරිපාලන වශයෙනුත් ලොකු පහසුවක් ලැබෙනවා. ඉතින් ඒ වාගේ හැම තැනම ඒ සහනය දෙනවා. නමුත් ඒ සහනය තුළින් වඩාත් හොඳ compliance එකක්, නැත්නම් ඒකට එකඟත්වය ලබා ගෙන කටයුතු කිරීමක් අපි බලාපොරොත්තු වනවා. The Commission was guided in its analysis and recommendations by the age-old and widely accepted principles of good tax policy. මොනවාද ඒ? Simplicity, convenience, efficiency, equity and protection for domestic economic activities. එතකොට මේ බදු ක්‍රමය යම් යම් අරමුණු අනුව තමයි අපි ක්‍රියාත්මක කරන්නේ. විශේෂයෙන් තමුන්නාන්සේලාට ඒ ගැන පෙනෙන්නට තිබේවි. අපේ දේශීය ආයෝජකයන්ට, ඒ වාගේම දේශීය ව්‍යාපාරිකයන්ට, ඒ වාගේම සුළු සහ මධ්‍යම පන්තික ව්‍යාපාරිකයන්ට අපි මේ බදු ක්‍රමය තුළින් සහන ලබා දෙනවා. ඉතාමත් වැදගත් දෙයක් මේ ගරු සභාවේ අපි සැලකිල්ලට ගන්නට ඕනෑ. මොකද, අපි බොහෝ විට සහන ලබා දෙන්නට කැමැතියි. අපි ඒ සහන ලබා දෙනවා. නමුත් ඒ සහන ලබා දීමේ අනෙක් පැත්ත තමයි, අපට අවශ්‍ය ප්‍රමාණයේ ආදායමක් ලබා ගැනීම. ඒ ආදායම් ලබා ගැනීම අපි ව්‍යාප්ත කළේ නැත්නම්, වැඩි කළේ නැත්නම් අපේ සහන මල්ල කෙරෙහි එය බලපානවා. දේශීය වශයෙන් අපේ ඉතිරි කිරීම් අඩු වන තරමට අපට ණය මුදල් ගන්නට සිදු වනවා, අපේ සමාජයීය තත්ත්වය, ජනතාවගේ තත්ත්වය රැක ගන්නට ඕනෑ නම්. ඒකට වඩා අපි කවුරුත් පිළිගන්නා හොඳම දේ තමයි අපේ රටේ තිබෙන ඒ හැකියාවන් තුළින් දේශීය ඉතිරි කිරීම් වැඩි කර ගැනීම. විදේශ රටවලින් ලබා ගන්නා ආයෝජන, විදේශ ණය සහ දේශීය ඉතිරි කිරීම් කියන මේ තුනේම අනුපාතය අනුව හුඟක් රටවල් කටයුතු කරනවා. මේ කොටස් තුනම හරි විධියට සමනය කර ගන්නට අපි දැන ගන්න ඕනෑ; පරිපාලනය කර ගන්නට දැන ගන්න ඕනෑ. අපේ රටේ ආර්ථික ප්‍රගමනය සඳහා අවශ්‍ය දේශීය ඉතිරි කිරීම් මොනවාද කියලා අපි කල්පනා කරන්නට ඕනෑ. ඉන්දියාව වාගේ රටක ආර්ථික සංවර්ධනය හුඟක් දුරට ඒ ගොල්ලන්ගේ දේශීය ඉතිරි කිරීම් මත තමයි රැඳෙන්නේ. අපි හැම වෙලාවේම බලන්නට ඕනෑ ඒ දේශීය ඉතිරි කිරීම් ප්‍රතිශතය වැඩි කර ගන්නයි. අපේ ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමාත් හොඳින් දන්නවා, පොඩි කාලයේ ඉඳලාම අපට උගන්වා තිබෙන හොඳ දෙයක් තමයි, ඉතිරි කිරීම. පුංචි කාලයේ ඉඳලාම කැටයක් දීලා ඉතිරි කරන්නට උගන්වා තිබෙනවා. ඉතිරි කිරීම ඉතාම හොඳ දෙයක් කියන අදහස අපිට දීලා තිබෙනවා. මට මතකයි, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා මේ ගරු සභාවේ මේ පුටුවේ ඉඳ ගෙන කිව්වා, ලංකාවේ saving habits ගැන අපි ආඩම්බර වන්න ඕනෑය කියලා. ඉතිරි කිරීමේ දැනුම, වගකීම අපි පුංචි කාලයේ සිට ඉගෙන ගත් දෙයක් කියලා ජාතික ඉතිරි කිරීමේ බැංකුව හදන අවස්ථාවේදී එතුමා ප්‍රකාශ කළා මට මතකයි. එය ලංකාවට ඉතා ශුභදායක දෙයක්. එතකොට අපේ දේශීය ඉතිරි කිරීමේ ප්‍රතිශතයත් අපි වැඩි කර ගන්න ඕනෑ.

දැන් මා එකක් කියන්න කැමැතියි. ඒ අතින් අපට බලන්න පුළුවන්, අපේ බදු ක්‍රමය සාර්ථක වනවාද, නැද්ද කියලා. විශාල බද්දක් පනවා හුඟක් දෙනකු ඒ බදු දැලෙන් පැන යනවාට වඩා හොඳයි, හැම එක් කෙනාටම ඔරොත්තු දෙන විධියට සාධාරණ බද්දක් පනවා ඒ බදු ක්‍රමයට ඇතුළු වන්න අවස්ථාව ලබා දෙන එක. අපේ රටේ මෙතෙක් කල් කළේ තෝරා ගත් කිහිප දෙනකුට ඉතාම විශාල බදු පනවන එකයි. ඒක නූතන තර්කයක් නොවෙයි. හුඟක් දෙනකුට සහනයක් වශයෙන් ගෙවන්න පුළුවන් විධියට බදු ප්‍රමාණය අඩු කරලා, ඒ ගොල්ලන්ට ඒ බද්ද ලොකුම ප්‍රශ්නයක් නොවන විධියට, ඒ බද්ද වැඩි දෙනාට පැතිරී ගියොත් මා හිතන හැටියට සියලු දෙනාටම හොඳ විධියේ බදු පරිපාලනයක් අපේ රටේ ඇති කරන්න පුළුවන්. ඒ හරහා තමයි අපි යන්නේ.

ඒ වාගේම අපට කියන්න පුළුවන්, අපේ සංඛ්‍යා ලේඛන අනුව අපේ බදු උපාය මාර්ගය -strategy එක- සාර්ථකව ක්‍රියාත්මක කර ගෙන යන්න පුළුවන් තත්ත්වයක් ඇවිත් තිබෙනවාය කියලා. මොකද, අපට පෙනෙනවා, මේ රටේ 2009 වර්ෂයට වඩා 2010 වර්ෂයේ අපේ ආදායම් ඉලක්ක කෙරෙහි අපට සාර්ථකව යන්න පුළුවන් වෙලා තිබෙනවාය කියලා. ඒ වාගේම දැනට අපට ලැබී තිබෙන විස්තර අනුව කියන්න පුළුවන්, මේ වර්ෂයේ අය වැය ප්‍රකාශනයේ ගරු ජනාධිපතිතුමා සඳහන් කළ රුපියල් බිලියන 986 බදු ඉලක්කය කරා අපට යන්න පුළුවන් කියලා. මේ බදු ක්‍රමය ලිහිල් කිරීමෙන්, මධ්‍යම පන්තියට සහ සුළු කොටස්වලට සහනය දීමෙන් රජයට ලැබෙන ආදායම අඩු වෙයි කියලා සාමාන්‍ය ජනතාව හිතනවා. නමුත් ඇත්ත වශයෙන් එහෙම වෙලා නැහැ. එහෙම වන්නේත් නැහැ. ආර්ථික තර්ක අනුව එහෙම වන්නේත් නැහැ. ඒ නිසා අපි පුළුවන් තරම් සරල බදු ක්‍රමයකට ගිහිල්ලා වේදනාකාරීභාවයෙන් අඩු බදු ක්‍රමයක් සකස් කරලා, ආවරණයක් නැති දුප්පත් ජනතාවට සමාජ සේවාවක් විධියට අපි දෙන සහනයන්වලට අත තියන්නේ නැතුව සමහර විට ඒවා වඩාත් වැඩියෙන් ලබා දෙමින් අපේ ආර්ථික ක්‍රියාවලිය හොඳ පැත්තට ගෙන යන්න තමයි මේ බදු යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වනවා. දැනටමත් ඒකේ ප්‍රතිඵල තිබෙනවා. මේකට සම්බන්ධ වූ සියලුම අංශයන් -ව්‍යාපාරික අංශයන්, බදු ගෙවන්නන්ගේ සමිති, ඒ වාගේම සුළු හා මධ්‍යම අපනයන සේවකයන්ගේ සංගම්, එක් කෙනෙක් නැර ඒ සියලු දෙනාගේම- සතුට ප්‍රකාශ කරලා තිබෙනවා; ප්‍රශංසා කරලා තිබෙනවා මේ නව බදු ප්‍රතිපත්තිය ගැන. ඒ නිසා අපි මේක ක්‍රියාවට නංවනවා. සමහර විට ඉදිරියට තව තවත් අපට මේකට සංශෝධන ඇති කරන්න පුළුවන් වෙයි. ඒ නිසා අපේ අරමුණ විශේෂයෙන්ම සහනදායී සංවර්ධන ව්‍යාපාර, ජනතාවට ලැබෙන ඒ සහන ව්‍යාපාර සියල්ලටම අවශ්‍ය දේශීය ආදායම් පදනම පළල් කර ගන්නයි. මේක හුඟක් දුරට අපි දැන් ඉලක්ක කරලා තිබෙනවා. අපට අවශ්‍ය තාක්ෂණික අංශය, IT අංශය, විද්‍යා සහ පර්යේෂණ අංශ ඒ හැම එකකම බදු අඩු කරලා තිබෙනවා; නැත්නම් බදු සම්පූර්ණයෙන් අහෝසි කරලා තිබෙනවා. බදු ක්‍රමයක් කියන්නේ නිකම්ම සල්ලි හම්බ කිරීමක් විතරක් නොවෙයි. අපගේ ඉලක්කය වනුයේ කෘෂිකර්මය නම් කෘෂිකර්මය, තාක්ෂණය නම් තාක්ෂණය කියන අංශවලට ආයෝජනය යොමු කිරීම සහ ඒ අංශවලට යෙදෙන අයට ඒ අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමයි. අතිගරු ජනාධිපතිතුමා පෙන්වලා තිබෙන හැටියට අපේ වෘත්තිකයන්ට විශාල සහනයක් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා කියන විධියට, "I intend to mobilize our professionals and build a knowledge reserve in our country. I propose to create the region's best personal income tax regime". අන්න ඒ විධියට තමයි අතිගරු ජනාධිපතිතුමා අපේ තාක්ෂණික අංශයට, අපේ වෘත්තිකයන්ට ඒ සහන ලබා දෙමින් ඒ, ඒ අංශවලට අපේ අවධානය ඉලක්ක කර තිබෙන්නේ. ඒ නිසා අද දින ඉදිරිපත් කර තිබෙන මේ බදු යෝජනාවලට අවශ්‍ය වන ඒ නෛතික පදනම ලබා දෙන ලෙස මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිමින් මගේ වචනය ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊ ළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ. භා. 2.37]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යාංශයට අදාළ පනත් සඳහා සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වනවා. ඊට වඩා සතුටුයි, සරත් අමුණුගම හිටපු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කථා කළාට පසුව විරුද්ධ පක්ෂය වෙනුවෙන් අපේ අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන්. සරත් අමුණුගම ඇමතිතුමා කිව්ව පරිදි මෙවැනි සංශෝධන අද නොවෙයි මීට පෙර කළ යුතු දේවල් කියායි මා හිතන්නේ. අපි අගය කරනවා, ආණ්ඩුව පරක්කු වෙලා හෝ හරියාකාරව ඒ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන එක ගැන. නමුත් සංශෝධන ඉදිරිපත් කිරීම තුළින් මේ රටේ ජනතාවගේ අභිවෘද්ධියට එය හේතු වෙනවාද, නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්. අපට අවශ්‍ය වන්නේ මේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරන්නයි. අන්තිමට අපි ජාතික ආර්ථිකයක් ගැන කථා කරන කොට අපට අවශ්‍ය වන්නේ මේක පාට කිරීම නොවෙයි. මේක කොළ, නිල්, රතු, කහ නොවෙයි. අන්තිමට අපි ජාතික ආර්ථිකය සවි ශක්තිමත් කරලා ජනතාවගේ බදු බර අඩු කරලා ඒ සීමිත බදු මුදල්වලින් අසීමිත ඉල්ලීම්වලට කොහොමද අපි මුදල් වෙන් කරන්නේ කියන එකයි අපට අවශ්‍ය වන්නේ.

අද ඉදිරිපත් කරපු මේ සංශෝධන පනත් කෙටුම්පත් සහ අලුත් පනත් කෙටුම්පත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිසා ඇති වූ ප්‍රතිවිපාකයක්ය කියායි මම හිතන්නේ. මෙතෙක් කල් ලෝක බැංකුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට බැණ, බැණ හිටපු ආණ්ඩුව දැන් ඒ ආයතනවලින් යැපෙන්න ගිහිල්ලා ඔවුන් දෙන වට්ටෝරුවට අනුව කටයුතු කිරීමටයි අද සිදු වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම මම අහනවා, අද රටේ ආදායම ජනතාවගේ අභිලාෂය වෙනුවෙන් කොයි ආකාරයටද පාවිච්චි කරන්නේ කියලා. මොකද, අද ප්‍රමුඛතාව විධියට පෙනෙන්නේ ආණ්ඩුව රැකීම කියන එකයි. ආණ්ඩුවට අදාළව තිබෙන වියදම් වෙනුවෙන් ඉස්සෙල්ලාම ඒ මුදල් පාවිච්චි කරලා, ඊට පස්සේ තමයි ජනතාව මතක් වන්නේ කියන එකයි අපට පෙනෙන්න තිබෙන කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා අහන්න කැමැති වන්නේ පඩි වැඩි කිරීම සම්බන්ධයෙනුයි. අද ජීවන වියදම අධික ලෙස ඉහළ ගිහින් තිබෙනවා. අපේ කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාගෙන් මා අද උදේ අහපු ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වුණේ, ශ්‍රම බල ශක්තිය සපයන ලක්ෂ 72ක් වන පෞද්ගලික අංශයේ වැඩ කරන අහිංසක සේවකයන් වෙනුවෙන් පඩි වැඩි කිරීමට බලාපොරොත්තුව සිටින්නේ කොහොමද කියන එකයි. රජයේ සේවකයන් නොමඟ යවලා, ඡන්දය ලබා ගන්න ඔවුන්ගේ පඩි වැඩි කරනවාය කියලා පෙන්වලා, අන්තිමට තිබෙන පඩියේත් ක්‍රය ශක්තිය අඩු කර තිබෙනවාය කියන එක අද සියලු දෙනාම කථා කරන දෙයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභාවල එකතු කරන්න තිබෙන ඒ මුදල් ප්‍රමාණය එකතු කිරීම මධ්‍යම ආණ්ඩුවට දීලා, ඒ මඟින් ඒ සියලුම බදු එකතු කිරීම ඉතාම හොඳ ප්‍රතිපත්තියක් ලෙස මම සලකනවා. මොකද ඒ තුළින්, එනම් තැන් දෙකක එකතු කර තිබෙන මුදල් ප්‍රමාණය එක තැනක එකතු කිරීමෙන් හොර කරන්න පුළුවන් හැකියාව අඩු වනවා. මේ සම්බන්ධයෙන් එදා ඉඳන්ම තර්ක විතර්ක කළත් අද ඒක පිළිගෙන කටයුතු කිරීම අවශ්‍යයි. නමුත් ඒ එකතු කරපු මුදල් ප්‍රමාණය ඒ ඒ පළාත් සභාවලට හරියාකාරව බෙදන්න අවශ්‍යයි. දැන් පළාත් සභාවල ඒ ආදායම් දෙපාර්තමේන්තුවල වැඩ කරන අයට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. කුරුණෑගල ඉන්න එහි වැඩ කරන අය ගණනාවක් ඇවිල්ලා මට කිව්වා, "මන්ත්‍රීතුමනි, කරුණාකර අඩු ගණනේ විපක්ෂයක් වශයෙන්වත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. මොකද, අපේ රක්ෂා නැති වනවා." කියලා. තවම ස්ථිර ප්‍රතිපත්තියක් අර ගෙන නැහැ, පළාත් සභාවල මුදල් එකතු කරන්න හිටපු ඒ පළාත් ආදායම් සේවා නිලධාරින්ගේ අනාගතය මොකක්ද කියන එක සම්බන්ධයෙන්. මොකද, මධ්‍යම ආණ්ඩුවට ගන්නේත් නැහැ, පළාත් සභාවේ තියා ගන්නේත් නැහැ. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව අද බොහොම ඍජු පිළිතුරක් දිය යුතුයි. මොකද, අප දන්නා විධියට 3,400ක විතර වැඩ කරන පිරිසක් එතැන සිටිනවා. ඒ වාගේම ඒ මුදල් ප්‍රමාණය ඉතිරි කර ගෙන, මධ්‍යම ආණ්ඩුවේ වැඩ කරන පිරිස තවත් වැඩි කරන්න ඕනෑය කියන මතයක් තිබෙනවා. මා හිතන්නේ එය කරන්නම අවශ්‍ය දෙයක් කියලායි. එය කළ යුතුයි. ඒ සම්බන්ධයෙනුත් මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය දැන ගන්න අවශ්‍යයි. මොකද, මේ දවස්වල පුළුවන් තරම් වියදම අඩු කරන බවක් පෙනෙන්න තිබෙනවා. සිය දෙනකු කරන දේ දෙ දෙනකු තුන් දෙනකු කරන්න ගිහිල්ලා, ඒ බර ඒ දෙන්නා තුන් දෙනා මත පැටවිලා, ඒ විධියට කටයුතු කරන්න ගිහිල්ලා අන්තිමට ලබා ගන්න පුළුවන් ආදායම් ප්‍රමාණය අඩු වේවි කියන එක පිළිබඳ ප්‍රශ්නයක් අපට තිබෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී ඒ ඒකාබද්ධ කිරීම තුළින් අපි නැවත පළාත් සභාවට මුදල් බෙදන්න ගියාම පාවිච්චි කරන්න යන පදනම මොකක්ද? ඒ පළාත් සභාවල ආදායම තමයි ඒ අය වෙන් කරන්නේ කියන අදහස මුදල් අමාත්‍යාංශයෙන් යොමු කරලා තිබෙනවා. නමුත් මා හිතන විධියට පළාත් සභාවලින් ආදායම ලබා ගන්න පුළුවන් ප්‍රමාණය තමයි නැවත ඒ අයට බෙදා ගන්න අවශ්‍ය වන්නේ. එකතු කරන්න තිබුණු දේවල් හරියාකාරව එකතු කළේ නැති නිසා නැවත ඒ පදනම පාවිච්චි කරලා ඒ මුදල් ඒ ප්‍රදේශයට වෙන් කරන්න ගියොත් අසාධාරණයක් වනවාය කියන එක අප මේ අවස්ථාවේදී ඉස්මතු කරලා පෙන්වන්න අවශ්‍යයි. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් අදහස් යොමු කරනවා. කරුණාකර රජය ඒ සම්බන්ධයෙන් පිළිතුරක් දිය යුතුය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

Then, the next one is the repealing of the debits tax imposed on the consumer through banks, which is going to be implemented from the 1st of April, 2011. I was under the impression that this was going to be an instantaneous arrangement, but I was subsequently corrected saying that it would be implemented from the 1st of April, 2011. It is important that the benefit of this Act should percolate down to the consumer. Banks have made billions of money through this tax but they have not compensated the consumer either through better service or more humane approach and have not felt remorse at all. There are many areas. The benefit of interest rates that were supposed to be reduced by the banks as a result of fiscal activities carried out by the Government have not percolated down to the consumer. The borrower today is in the same plight as before. Heavy collaterals are required to borrow a very small sum. Today Rs. 100,000, Rs. 500,000 or Rs. 1 million is nothing for small and medium-scale investors.

[ගරු රවි කරුණානායක මහතා]

නමුත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙකුට රුපියල් ලක්ෂ 10ක් ගන්න එක ඉතාම අමාරු කාර්ය භාරයක්. රුපියල් ලක්ෂ දහයකින් මොන ආකාරයේ ව්‍යාපාරයක්ද කර ගෙන යන්න පුළුවන් වන්නේ? ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වඩා හුඟක් වැඩ කටයුතු කරන්න අවශ්‍යයි කියලා මම හිතනවා. ආර්ථික සංවර්ධන ඇමතිතුමා මෙතැන ඉන්නවා. ආර්ථිකයේ පුනර්ජීවනයක් ඇති කරලා ඉදිරියට තල්ලු කර ගෙන යෑම එතුමාගේ කාර්ය භාරය වන නිසා ඇමතිතුමා සහ මේ ආණ්ඩුව ප්‍රමුඛත්වය දිය යුත්තේ මේ සංශෝධන තුළින් අඩු වන ඒ වරප්‍රසාදය පාරිභෝගිකයාට හෝ ආයෝජකයාට ලබා දීලා ඒකෙන් නැවත ප්‍රතිලාභයක් ලබා ගන්න එකටයි කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. නමුත් ඒක සිදු වන්නේ නැහැ.

රජයේ බැංකුවලින් එක බැංකුවකින් රුපියල් මිලියන 5,000යි, අනෙක් බැංකුවෙන් රුපියල් මිලියන 7,000යි, පෞද්ගලික අංශයේ බැංකුවලින් රුපියල් මිලියන7,000යි කියලා ලාභ ලැබුවාට වැඩක් නැහැ. එයින් එක කොටසක් රටේ සංවර්ධනයට යොදන්න ඕනෑ. ඒක ක්‍රියාත්මක කිරීම සඳහා රජය පුළුවන් තරම් කටයුතු කරන්න අවශ්‍යයි; focus කරන්න අවශ්‍යයි; target කරන්න අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ වාගේම regional infrastructure development levies ආදී වශයෙන් නොයෙක් නොයෙක් බදු වර්ග තිබෙනවා. දැන් බලන්න Finance (Amendment) Bill එක යටතේ බදු ගණනාවක් තිබෙනවා. මීට පෙරත් අපි මේ ගැන කථා කළා. ඒ වාගේම Tax Commission එකේ තිබෙන එක අදහසක් තමයි පුළුවන් තරම් මේ බදු ඒකාබද්ධ කරන්න කියන එක. සෘජු බදු ඔක්කොම ඒකාබද්ධ කරලා, වක්‍ර බදුත් ඒකාබද්ධ කරලා, බදු වර්ග එකක්, දෙකක්, තුනක් හෝ හතරක් ඇති කරන්න ඕනෑ. අද ඒ වාගේ බදු වර්ග 49ක් තිබෙන රටක් තමයි ලංකාව කියන්නේ. එක තැනකින් දශම 025යි, තව තැනකින් 1.25යි යන මේ විධියට බදු එකතු කර ගෙන යන කොට සියලු දෙනාටම ලොකු ප්‍රශ්නයක් ඇති වනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඒවා check කරන්න සිදු වන්න පුළුවන්; මුදල් අමාත්‍යාංශයට ඒවා එකතු කරන්න සිදු වන්න පුළුවන්; මේවා මුද්‍රණය කරන්න යන ගාස්තු වෙන්න පුළුවන්. මේ එක එක විධියට යම් වියදමක් දරන්න තිබෙන නිසා මේ බදු ඒකාබද්ධ කිරීම ඉතාම හොඳයි. පළාත් සභා මට්ටමෙන් ලැබෙන මුදල් ප්‍රමාණය ඒකාබද්ධ කරලා මධ්‍යම ආණ්ඩුවෙන් එකතු කිරීම හොඳයි වාගේම, මේ සියලුම බදු එකතු කරලා - ඒක රාශි කරලා- බදු වර්ග තුනක්, හතරක්, පහක් ක්‍රියාත්මක කිරීමෙන් තමයි රටක සාරවත්භාවයක් ඇති වන්නේ කියන එක මතක් කරන්න අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව ක්‍රියාත්මක වන්න ඕනෑ. සමහර වෙලාවට එක බද්දක් විධියට සියයට 10ක් අය කරනවාට වඩා, සියයට එකහමාරක හරි සියයට දෙකක හරි බදු අනුපාතයක් දමලා, බදු වර්ග හයක් හතක් දමලා සියයට 10ක් එකතු කරන එකෙන් ඒ බදු බර අඩුයි කියන එක පෙන්වන්න හදනවා වන්න පුළුවන්. නමුත් ඒක වැඩක් නැහැ. කොහොම වුණත් අන්තිමට ඒ බර ජනතාව පිටට එනවා. ඒ නිසා මේ බදු ඒක රාශි කරලා බදු එකක්, දෙකක් හෝ තුනක් දැමීම මීට වඩා හුඟක් හොඳයි. Then, there will be higher compliance, higher collection, less cost on collection of taxes. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් ඒක පිළිගනීවි කියන මතය තමයි තිබෙන්නේ. ඊ ළඟට, imposition of motor vehicle levy. Now, look at the absurdity of the Government which is talking about the downtrodden people. You are talking of the introduction and reduction of certain taxes. This is a Government that reduces taxes on BMWs, Benzes, the Pajeroes from 150 per cent to 75 per cent or 50 per cent on the dictation of the IMF. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අණ පරිදි මේ ආණ්ඩුව සියයට 125 සිට සියයට 50ට, 75ට බදු අඩු කර තිබෙනවා. නමුත් අහිංසක ජනතාවගේ කිරි පිටි ටිකට, පරිප්පු ටිකට, මාළු ටින් එකට අය කරන බද්ද තවම රුපියල් 85ක, 90ක තියා ගෙන ඉන්නවා. තෙල් මිලට රුපියල් 50, 60 බදු අය කරනවා. එසේ තිබියදී සුඛෝපභෝගී භාණ්ඩ පාවිච්චි කරන පිරිසකට - සියයට 2ක, 3ක පිරිසකට- මේ විධියට බදු අඩු කිරීම ඉතාම අසාධාරණයක් කියන එක,- [බාධා කිරීමක්] මට දැන් ආර්ථික සංවර්ධන ඇමතිතුමා කියනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

IMF එකෙන් කියන ඒවා තමයි ඔබතුමන්ලා කියන්නේ. රුපියලේ අගය අඩු කරන්න-

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

IMF එකෙන් කියන එක දැන් මේ ආණ්ඩුව පිළිගෙන තිබෙනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**

(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)

(The Hon. Basil Rohana Rajapaksa)

නැහැ, ඔබතුමන්ලා කියන එක තමයි IMF එක කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ඕක නේ වැරැද්ද. අයිඑම්එෆ් එක රටෙන් පැන්නුවාම ඔබතුමන්ලා කිව්වා, "බලන්න අපේ දක්ෂතාව, අපිට උන් ඕනෑ නැහැ, අපි රටින් එළවනවා" කියලා. බොහොම හොඳයි කියලා අත්පුඩි ගහනවා. "ඔන්න ජාතිකත්වය, දැක්කාද අපේ සැර" කියනවා. ඊට පස්සේ මල් වෙඩි දමලා, සෝදලා, ඉඹලා ගෙනැල්ලා දැන් ඒ ගොල්ලන් කියන කොට මෙහෙම කරන්න, මෙහෙම කරන්න කියලා -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**

(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)

(The Hon. Basil Rohana Rajapaksa)

ඔබතුමන්ලාගේ ගිවිසුම් අනුව, යන්න කිව්වා. මහින්ද චින්තනය අනුව -

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

හරි, එක්සත් ජාතික පක්ෂයේ චින්තනය අනුව පැන්නුවා. මහින්ද චිනතනය අනුව ගෙන්නුවා. එතකොට මහින්ද චින්තනය අනුව BMW එකට, Pajero එකට සියයට 125ක්ව තිබුණ tax එක සියයට 25ට ගේනවා. එක්සත් ජාතික පක්ෂයේ චින්තනය අනුව පරිප්පුවලට බදු දමන්න එපා කිව්වත් ඒක වැඩි කරනවා. මරු වැඩේ නේ! [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

දැන් පරිප්පුවල බද්ද කීයද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පරිප්පුවලට බද්ද රුපියල් 22ක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැන්?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වැරැදි කථා කියන්න එපා. රුපියලයි. මොනවාද මේ කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ටින් මාළු එකක් රුපියල් 185යි. දැන් නැහැයි කියන්න. [බාධා කිරීම්] ඒක නැහැයි කියනවා. ඇයි ඔබතුමා පරිප්පුවලින්ද ජීවත් වන්නේ? ටින් මාළු කන්නේ නැද්ද? අහිංසක ජනතාව වෙනුවෙන් - [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පරිප්පු බද්ද රුපියල් 10යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පරිප්පු බද්ද රුපියල් 10යි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා, බොරු කියන්න එපා. [බාධා කිරීම්] පරිප්පු බද්ද රුපියල් 10යි, රුපියල් 15යි. කොහේද රුපියලක් තියෙන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් නොවෙයි, යම් ගණනකට වැඩිය තිබුණොත්, - [බාධා කිරීම්] රුපියල් 22ටයි තිබුණේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පරිප්පු බද්ද රුපියල් 10යි, රුපියල් 15යි. කොහේද රුපියලක් වන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔය ගැසට් එකේ දිනය කවදාද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බලන්න, ඔබතුමා ළඟ තිබෙනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගැසට් එක ඔබතුමා ඉස්සරහ තිබෙන්නේ. ඔබතුමා තමයි ඇමති මණ්ඩලයේ ඉන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පරිප්පුවල බද්ද රුපියල් 10යි, රුපියල් 15යි. රුපියල වෙන්නේ කොහොමද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔය ගැසට් එකේ දිනය කවදාද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දිනය බලන්න, මම කියන්න ඕනෑ නැහැ නේ. ඔබතුමා ආණ්ඩුවේ ඇමති කෙනෙක් නේ. ඔබතුමා ළඟ තිබෙන්න එපා යැ. [බාධා කිරීම්] පට්ටපල් අසත්‍ය කියනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පුස් කොළ පොතක් ගෙනැල්ලා පෙන්වා ඔය ගණන් කියන්න පුළුවන්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ වාමාංශික සහෝදර ඇමතිතුමනි, - [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පරිප්පුවල බද්ද රුපියල් 10යි. පියලි කරපු පරිප්පු බද්ද රුපියල් 15යි. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එදා හෝටලයේදී බොරු කිව්වා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එදා හෝටලයේ බොරු කිව්වා නම්, බැසිල් ඇමතිතුමා කිව්වේ වික්කා කියලා. හැන්සාඩ් එකේ තිබෙන්නේ. [බාධා කිරීම්] පරිප්පුවල බද්ද රුපියල් 15යි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කථාව කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔය ගැසට් එකේ දිනය කවද්ද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇමතිතුමා, පරිප්පුවල බද්ද රුපියල් 15යි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පරණ පොතේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පරණ පොතේ නොවෙයි, අලුත් පොතේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නිකම් බොරුවට කෑ ගහනවා. තිස්තුන් ලක්ෂයක් ඡන්දය ගත්තා. මාළු මිරිස් කරල රුපියල් හයයි, ශත පණහයි කිව්වා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
රුපියල් දෙකට තමයි තිබුණේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වාතාවරණය විවෘත කළා, ටිකක් උණුසුමක් ඇති කරන්න. මොකද නිදිමතේ හිටපු ඇමතිවරු දැන් නැඟිට්ටා. ඒක තමයි විපක්ෂයට තිබෙන කාර්ය භාරය. දැන් දැක්කා නේ, ඇමතිතුමා දැන ගෙන හිටියේ නැහැ පරිප්පුවලට රුපියල් 15ක බද්දක් තිබෙනවා කියලා. නමුත් ඇමති මණ්ඩලයේ ඉන්නේ. මම මේ වාමාංශික ඇමතිතුමාගෙන් අහන්නේ. මගේ ප්‍රිය මිත්‍රයෙක්. රුපියල් 2,500කින් පඩිය වැඩි කරන්න ඔබතුමා කෑ ගහන්නේ නැත්තේ ඇයි? අද ආණ්ඩුවෙන් පරිප්පු ගැන කථා කරනවා. අනේ අහිංසක මිනිස්සුන්ගේ රුපියල් 2,500 පඩි වැඩි කිරීම ගැන කථා කරන්නේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගමේ මිනිස්සු තමුන්නාන්සේලාට පරිප්පු දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ පරිප්පු තමයි ලැබිලා තිබෙන්නේ. ජනතාවට පරිප්පු තමයි ඉතින්. අපි ඕවා මතක් කරන කොට අපි දේශ ද්‍රෝහියෝ. දැන් මම මේ ආණ්ඩුවෙන් අහනවා, දැන් ඡන්දය ඉවරයි නේ. දැන් තමයි ඡන්ද ප්‍රතිඵල එන්නේ. තෙල් මිල වැඩි කරන්නේ නැද්ද? විදුලි බිල වැඩි කරන්නේ නැද්ද? කිරි පිටි මිල වැඩි කරන්නේ නැද්ද? ඒ වාගේම ගෑස් මිල වැඩි කරන්නේ නැද්ද? මොකද ඡන්ද ප්‍රතිඵල එන්නේ දැනුයි. සාමාන්‍ය සිරිත එහෙම නේ. මොකද ඒ කියපු දේවල් - [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අවුරුදු හයක් පොහොර සහනාධාරය දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඉන්න කෝ. මම අහන්නේ මේ ආණ්ඩුවෙන් නේ. වැදගත් ඇමතිවරු ඉන්නවා නේ. ආර්ථික සංවර්ධන ඇමතිතුමා හිනා වෙවී ඉන්නවා. මොකද එතුමා දන්නවා, දැන් තමයි ඡන්ද ප්‍රතිඵල එන්න තිබෙන්නේ කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ )
(The Hon. Basil Rohana Rajapaksa)
මම අහගෙන හිටියේ ඔබතුමන්ලාගේ ජයග්‍රහණය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකට භය වෙන්න එපා. කොහොමත් ඒක තිබුණේ නැති ප්‍රශ්නයක් නේ. ඒ තිබුණේ නැති ප්‍රශ්නයක් ඇති වුණා. ඒක නිරාකරණය වුණා. අපි බොහොම සහෝදරත්වයෙන් ප්‍රශ්න විසඳනවා. ඒ වැඩේ අපි කරන්නම්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
අපි සුබ පතනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආ! ඒකට බොහොම ස්තුතියි. කොහොමත් එදා සිටම සුබ පැතීම් තිබුණා නේ. රටේ තිබෙන ප්‍රශ්නය මේකයි. පුටුව තිබුණාට ඔය පැත්තේ ඔළුවක් නැහැ. මේ පැත්තේ ඔළුවක් තිබෙනවා, පුටුවක් නැහැ. ඒක තමයි තිබෙන දුක. ඉතින් ඒ සම්බන්ධයෙන් කරුණාකරලා අපි - [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔළුව නැති වුණත් අපට 33,38,400ක් ඡන්දය දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔළුව මෙතැන තිබෙනවා. එක් කෙනෙක්, දෙන්නෙක් මෙතැන ඉන්නවා. ඉතින් කමක් නැහැ. [බාධා කිරීම්] ඒ ගොල්ලෝ නිශ්ශබ්දව සිටිනවා. මේ පළමුවැනි පේළියේ ජී.එල්. පීරිස් ඇමතිතුමා ඉන්නවා. දෙවැනි පේළියේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉන්නවා. ඔය සද්ද කරන අයට තමයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. මම ආර්ථික සංවර්ධන ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. කරුණාකරලා ඔබතුමා කියන්න, මේ ආණ්ඩුවෙන් තෙල් මිල වැඩි කරන්නේ නැද්ද කියලා. අප්‍රේල් මාසයේ පළමුවැනි දා සිට විදුලි බිල වැඩි කරන්නේ නැද්ද කියලා මම අහනවා. මම අහනවා,- [බාධා කිරීම්] නැහැ, නැහැ, ලෝකයේ තෙල් මිල වැඩි වන කොට මේ රටේත් තෙල් මිල වැඩි වෙනවා නම් මොකටද ආණ්ඩුවක් කියලා අහපු, ඇමති මණ්ඩලයේ ඉන්න අය දැන් තෙල් මිල අඩු කරන්නේ නැද්ද? ඔවුන්ට තෙල් මිල අඩු කරන්න හැකියාව තිබෙනවා. හෙජින් සූදුවෙන් මේ ආණ්ඩුවට කෝටි 11,000ක් නැති වෙලා තිබෙනවා. අපි උසාවි ගිහිල්ලා ඒ අහිංසක පාරිභෝගිකයාට ලබා දුන් ඒ වරප්‍රසාදයවත් ලබා දෙන්නේ නැති ආණ්ඩුවක් තමයි දැන් ඔය කථා කරන්නේ. හෙජින් සූදුවට ලීටරයකින් රුපියල් එකොළහක, දොළහක මුදලක් අද එකතු කරනවා. ඒ වරප්‍රසාදය ජනතාවට දී නැහැ. ඒ වාගේමයි කිරි පිටි මිලත්. අපේ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාට බැණලා වැඩක් නැහැ. මොකද, අදක්ෂ ආණ්ඩුවක එතුමාට කරන්නට තිබෙන කාර්ය භාරයයි කරන්නේ. එතුමාට බැණලා වැඩක් නැහැ. හැබැයි පාරිභෝගික අධිකාරිය ගෑස් සඳහා බදු වැඩි කරන්නට තීරණය කර නැද්ද? ගෑස් සිලින්ඩරය රුපියල් සියයකින් වැඩි කරන්නට තීන්දු කර නැද්ද? මේවා තීන්දු කළේ නැද්ද? "කරුණාකර දැන් වැඩි කරන්න එපා, ඡන්දය ඉවර කර, ඡන්දයට පස්සේ ඡන්ද ප්‍රතිඵලවලින් මෙය නිකුත් කරමු" කියා තීන්දු කර නැද්ද මේ ආණ්ඩුව? වැඩි කල් යන්නට ඕනෑ නැහැ. [බාධා කිරීමක්] එය කරලා තිබෙනවා. බදු වැඩි වන කොට වැඩි කරන, අඩු වන කොට අඩු කරන ආණ්ඩුවක් අපට තිබුණේ. එතකොට එදා හිනා වුණා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් වැඩි වන කොට වැඩි කරනවා, අඩු වන කොට අඩු කරන්නේ නැති ආණ්ඩුවක් බවටයි ඔබතුමන්ලා පත් වෙලා තිබෙන්නේ. මේක තමයි තිබෙන වෙනස.

එම නිසා, මේ ඔක්කොම වෙනස් කළාට කිසි සේත්ම වැඩක් නැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මොහොතක් ඉන්න. මා ඔබතුමා වෙත ප්‍රශ්නයක් යොමු කරන්න ඕනෑ. එතුමා වාගේ එක් කෙනෙක් ගියාට පස්සේ ආණ්ඩුවේ ඇමතිවරු අසූපහකින් හැත්තෑපහක් එළියට ගියා වාගේ නේ. ගරු ඇමතිතුමාගෙන් මා ප්‍රශ්නයක් අහනවා, බදු සම්බන්ධයෙන්. එතුමා ඒ සම්බන්ධයෙන් බොහොම ඕනෑකමින් සටන් කර තිබෙන බව මා දන්නවා.

ෂැන්ග්‍රි-ලා හෝටල් ආයතනයට ඉඩම් දී තිබෙනවා. කොහොම ගියා ද දන්නේ නැහැ. තීන්දු කර තිබෙනවා. ෂැන්ග්‍රි-ලා හොඳ හෝටල් කොම්පැනියක් කියා අපත් පිළිගන්නවා. ඒ ගැන මා මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් යොමු කළ අවස්ථාවේදී මා ඇහුවා, "ඔබේ ආණ්ඩුව පෞද්ගලීකරණයට විරුද්ධයි. ඉඩම් විකුණනවා නේද?" කියලා. "ඔව්." කිව්වා. මේකට ටෙන්ඩර් පටිපාටියක් ගෙන ගියා ද කියා ඇහුවා. "නැහැ" කිව්වා. ටෙන්ඩර් පටිපාටියක් නැත්නම් කොයි පදනමින් ද ඒක දුන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තක්සේරුවෙන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. තක්සේරුවෙන්. ඔන්න ඉතින් වාමාංශික ඇමතිතුමා ඔක්කොම පැනලා දෙනවා නේ. මා අහන්නේ ආර්ථික සංවර්ධන ඇමතිතුමාගෙන්. [බාධා කිරීම්] කමක් නැහැ. මගේ මිත්‍රයා. දේශපාලනය සම්බන්ධයෙන් මට හුඟක් ඉගැන්වුවා. මා අගය කරනවා. තක්සේරු මිල මා දැන් අහනවා. යුද්ධ හමුදාවේ මූලස්ථාන කඳවුර එතැනින් ගේන්න ඕනෑ. ඒ එන කොට හදන්නට දේවල් තිබෙනවා. රෝහලක් හදන්නට තිබෙනවා. මූලස්ථානය හදන්නට තිබෙනවා. මේ ඔක්කොම කරලා අන්තිමට රජයට ගෙවන්නට වෙයි. ඒ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. ෂැන්ග්‍රි-ලා කොම්පැනියට ටෙන්ඩරයක් නැතිව දෙනවා. ඒ එන්නේ පිට රට තිබෙන සුද්දන්ගේ කොම්පැනියක්. මේ සුද්දන්ගේ කොම්පැනිය මෙහාට එන කොට මේ රටේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් තිබෙනවා. මේ වාගේ කොම්පැනියකින් සියයට සියයක බදු ගෙවන්නට තිබෙනවා. දැන් රුපියල් මිලියන හැත්තෑපහක් ගෙවා තිබෙනවාය කියා පිළිගෙන තිබෙනවා. ඒ වාගේම තමයි CATIC කියන කොම්පැනිය. මා දන්නේ නැහැ, මේක මොන වාගේ හෝටලයක් ද කියා. මේක වමරි හෝටලයක් ද? තරු පහේ හෝටලයක් ද, තරු හතේ හෝටලයක් ද -[බාධා කිරීමක්] ඉන්නකෝ. ඔබතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති නේ. මා අහන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගෙන්. මේ සම්බන්ධයෙන් ගෙවන්නට තිබෙනවා, stamp tax එකක්; 100 per cent tax එකක්. මේ ආණ්ඩුව එය ෂැන්ග්‍රි-ලා කොම්පැනියෙන් අරගෙන තිබෙනවා ද? මේ ආණ්ඩුව CATIC කියන කොම්පැනියෙන් අරගෙන තිබෙනවා ද? ගෙවන්නට තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසියයක්. කෝටි දෙදහස් දෙසියයක්. මේ රටට එම මුදල විදේශ විනිමයවලින් ඇවිත් තිබෙනවා ද? ඇවිත් නැත්නම් මොනවා ද කරන්නට තිබෙන්නේ? මොකද, ෂැන්ග්‍රි-ලා කොම්පැනිය කියා වෙනසක් නැහැ. ඒ වාගේ කොච්චර කොම්පැනි තිබෙනවා ද? මේ වාගේ බදු සියයට සියයක් ගෙවා තිබෙනවා ද? දැන් BOI එකේ මේක අත්සන් කර තිබෙනවා ද? නැද්ද? මම දන්නවා, ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සමහර විට ලොකු ප්‍රශ්න කිරීම් කර තිබෙන බව. රට වෙනුවෙන් සටන් කර තිබෙනවා. අප අගය කරනවා. ඒ වාගේ තමයි කළ යුත්තේ. එහෙම නම් කොහොම ද මේක වෙලා තිබෙන්නේ? කෝටි දෙදහස් දෙසියයක්.

ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසියයක්. බදු සම්බන්ධයෙන් මේ රටට එන්න තිබෙන එක ඇවිත් නැහැ. කවුද මේ exemption එක දී තිබෙන්නේ? මොකද, දැන් කියන්න එපා, Strategic Development Project Act, No. 14 of 2008 යටතේය, ඔන්න ඕක තිබෙන නිසා, හැංගෙන්න ඕනෑය කියා.

එන්න ඉස්සෙල්ලා අත්සන් කරන්න ඕනෑ. අප වාගේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට හුඟක් හිරිහැර කරදර වුණා. නීතිය මෙහෙම නම්, කෝ දැන් අපට කියන දේවල්? මේ සුද්දන්ගේ කොම්පැනියෙන් -කොණ්ඩ බඳින චීනුන්ගේ කොම්පැනියෙන්- මේ රටට මේ ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසීය ගෙවා නැත්නම් කවුද මේකට වග කියන්නේ කියන එක මා මේ අවස්ථාවේදී අහනවා.

[ගරු රවි කරුණානායක මහතා]

ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සටන් කර තිබෙන බව මා දන්නවා. මොකද එතැන වෙන දේවල් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා වග කියන්නට අවශ්‍යයි. අදක්ෂ ආණ්ඩුවක කොටසක් වන්නට පුළුවන්. දක්ෂ ඇමති කෙනෙක්. නමුත් අදක්ෂ ආණ්ඩුවක කොටසක්. ඒ සම්බන්ධයෙන් කරුණාකර හෙළිදරව් කරන්න. කොහොමද, කවදා ද මේක ලැබුණේ කියන එක. මේක ගෙවා නැහැ කියන එක මා දන්නවා. ගෙවා නැත්නම් උත්තර දෙන්න අවශ්‍යයි.

ලංකාවේ අහිංසක අයගෙන් බදු ගන්න කොට, ඒ බදුවලට සහනයක් දෙන්නේ නැති කොට පිට රට ඉන්න සුද්දන්ගේ කොම්පැනිවලට බදු සහන දෙන්න ඕනෑ වෙන්නේ ඇයි කියන එක මා මේ අවස්ථාවේදී අහනවා. ඒ සම්බන්ධයෙන් ඊට වඩා මට කියන්නට අවශ්‍යතාවක් නැහැ. මොකද, ගරු ඇමතිතුමා නැඟිට ගියාය කියන්නේ උත්තරයක් දෙන්න බැරි නිසා වන්නට පුළුවන්. උත්තරයක් දෙන්නට බැරි නම් අප ඒ ගැන ඇහුවාම අප දේශ ද්‍රෝහියෝ. ගෙව්වේ නැති අය දේශ ප්‍රේමියෝ. ගෙව්වේ නැති අය ශ්‍රී ලංකාවේ ජාතීන් නම් කමක් නැහැ. චීනයේ කොම්පැනියක් මෙහාට ඇවිත් ගන්න එක; CATIC කියන කොම්පැනිය ගන්න එක ගැන මගේ මිත්‍ර ගරු හර්ෂ මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර තිබුණා. මේක තරු පහේ හෝටලයක් ද, තරු හය ද, තරු දෙක ද, තුන ද කියා පසු ගිය පාර්ලිමෙන්තුවේ විමසීමක් කර තිබුණා. මේ සම්බන්ධයෙන් කොහොම ද දෙන්නේ? එහෙම කියනවා නම්, අපේ John Keells, අපේ Stassens, අපේ Aitken Spence වාගේ කොම්පැනිවලටත් බදු රහිතව ටෙන්ඩර් නැතිව දෙන්නට බැරි ඇයි? එහෙනම් ආණ්ඩුවේ වෙන්නම ඕනෑද? විපක්ෂයෙන් වුණාම මොකද? ඉන්න දක්ෂයෝ ඉදිරිපත් කර තිබෙනවා නම් ඇයි ඒ අයට දෙන්නට බැරි වන්නේ? එම නිසා මේ වාගේ සංශෝධන පනත් කෙටුම්පත් ඉදිරිපත් කළාට වැඩක් නැහැ, යම් කොටසකට විතරක් ආදායම බෙදී යනවා නම්.

ඒක පුද්ගල ආදායම ගැන කථා කළා නේ. අපේ ගරු සී.බී.රත්නායක ඇමතිතුමා මෙහි ඉන්නවා. මා දන්නවා, එතුමා බොහොම මහන්සියෙන් වැඩ කර මේ දවස්වල ඉන්නවා. එතුමා තමයි ක්‍රීඩා අමාත්‍යාංශය හොබ වන්නට අවශ්‍ය වන්නේ. නමුත් දීලා තිබෙනවා, මගේ මිත්‍ර මහින්ද අලුත්ගමගේ මැතිතුමාට.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ඇයි ඔබතුමා කැමති නැද්ද මට?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කිව්වා, මගේ මිත්‍ර මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට දීලා තිබෙනවාය කියා. ඔබතුමා හැම දාම මට බණිනවා. එතුමා මට බණින්නෙත් නැහැ. ඉතාම හොඳ -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

බණින්නේ ආදරය වැඩිකමට. එහෙම කරන්නේ හදා ගන්නයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක මම දන්නවා. මමත් පෙන්වන්න හදන්නේ ඒ ආදරයෙන් යම් කොටසක්. බණින එකට මමත් ප්‍රති උත්තර දෙනවාය කියා. දෙදෙනා අතර දක්ෂතාව පවතිනවා. ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2,300ක් කියා කියනවා. ඒ අනුව එක් කෙනෙකුට පඩිය රුපියල් 26,000ක් වන්න ඕනෑ. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ කී දෙනෙකුට මාසයකට රුපියල් 26,000ක් හම්බ වනවාද? එක් කෙනෙක් කෝටියක් හොයා ගත්තාම තවත් කෙනෙක් රුපියල් 10ක් හොයා ගත්තාම වාමාංශික ඇමතිවරයෙක් වන මගේ මිත්‍ර වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වොත් ඒ දෙදෙනාගේ ආදායම සම වෙනවා කියා, ඒක හරිද? නැහැ නේ. විෂමතාවක් පවතිනවා. ඒවා මනින්න එපා. අපි ඒවා කිව්වාම දේශ ද්‍රෝහියෝ කියනවා. එදා ටයි කෝට් ගහනවා කියලා කථාවක් කිව්වා. දැන් සරම අඳිනවා. සරම අඳිද්දි මොනවා කියන්නද? දැන් කෑ ගහන කෙනාත් ටයි කෝට් ගහගෙන ඉන්නවා. කමක් නැහැ. කිසි ප්‍රශ්නයක් නැහැ. මා කියන්නේ හාස්‍යයට ලක් කර කියපු ඒවායි. ඕනෑ එකක් කියන්න. හැබැයි අපි කියන්නේ අහිංසක බණ්ඩාගෙන් ආදායම් බදු ගන්නවා. නමුත් චීන කොම්පැනියක් වන ෂැන්ග්‍රි-ලා එකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් ගන්නේ නැති එක ගැන කරුණාකර ඔබතුමා කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න කියායි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Strategic -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මොනවාද strategic? අපේ බණ්ඩා බදු ගෙව්වාම ඒක strategic නැහැ. අපේ හනීෆා බදු ගෙව්වාම ඒක strategic නැහැ. අපේ සේනාධිරාජා බදු ගෙව්වාම ඒක strategic.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Now, do not pretend - [*Interruption.*]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Now, will you answer? You also do not be hypocritical. - [*Interruption.*]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

That is because of the strategic importance of the investment.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

What is the strategic importance? If you have got to pay US dollars 200 million, why is it that they are exempted? Where is the strategy in it? - [*Interruption.*] Then, give that benefit to Mlesna Tea; give that to Ceylon Tea Services; give it to Aitken Spence; give it to John Keells; give it to our local companies. Our stock market is booming. Our local capital base is there - [*Interruption.]* Come on, Hon. Minister, when did you talk of investments? - [*Interruption]* Hon. Minister, when did you talk of investments? You were on the other side of the fence. You were talking of the down-trodden worker. But, you were not talking about an increase of

Rs. 2,500 for him. Now, you talk of the tax exemption of a company. I am so happy. At least "Mahinda Chintana" has given you a redirection of the implementation of the economic upliftment of the country. - [*Interruption.]* Okay. -[*Interruption.*] I think all you have to do is to ensure that the LSSP, the CPs are basically torn and thrown into the dustbin. That is the only way that you can get this country moving forward. That is all I want to say. [*Interruption.*] - I am talking to an honourable Minister, not to a backbencher who is dishonourable. [*Interruption.*] - So, all we basically want to say is that -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only two minutes left.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Hon. Yogarajan's time will be used by me.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Has he informed?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I was informed by the Hon. John Amaratunga, the Chief Whip of the Opposition. How many minutes has he got?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. Yogarajan has been given 20 minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take about 12 minutes of that. I think the Hon. Harsha de Silva might take some time from that as well. So, going on that basis - the active working Minister has gone off from here - all I want to basically say is -

මේ සම්බන්ධයෙන් අපි කථා කරනවා. අද මේ කථා කරන්නේ imposition of a levy on motor vehicles under Part II of the Finance Act එක ගැනයි - introduction of new levies on motor vehicles and reduction of taxes and so on. මේ රටට ලිමෝසින් ගෙනෙනවා; බස් ගෙනෙනවා; කාර් ගෙනෙනවා. බස් එකේ size කාර් ගෙනල්ලා සියයට 5 බද්දකින් එළියට එන විට මේ ඇමති මණ්ඩලය නිදිද කියායි මම අහන්නේ. දෙ දෙනෙක්, තුන් දෙනෙක් යන අඩි 40 container එකක් වාගේ තිබෙන කාර් ගෙනල්ලා සියයට 5 බද්දක් ගහද්දී මේ ආණ්ඩුව නිදිද? එදා කිව්වේ, "එක්සත් ජාතික පක්ෂය සුබෝපභෝගී ආණ්ඩුවක්. මොවුන් මේ වැඩ කරන්නේ ව්‍යාපාරිකයන්ට විතරයි" කියායි. දැන් වැඩ කරන ජනතාව සම්බන්ධයෙන් කථා කරන මේ ආණ්ඩුව 40-foot container එකක් වාගේ තිබෙන කාර් එකක් ගෙනාවාම අහන්නේ නැද්ද? බැරි වෙලාවත් එක්සත් ජාතික පක්ෂයේ ව්‍යාපාරිකයෙක් රුපියල ගෙවන එකට රුපියල් 1.10 හෝ ශත 90 ගෙව්වා නම් හිර ගෙදරට යවනවා. මේවා හොයා ගෙන ආවාම ඒවාට අවසර දුන්නේ කවුද? [බාධා කිරීමක්] ඒකට ලැබුණු - [බාධා කිරීමක්] ඒ vehicle එක Rs. 17 million. ගෙවලා තිබුණු tax එක 5,50,000යි. මරුටි කාර් එකක් ගෙනාවොත් ලක්ෂ 4ක් විතර බදු ගන්නවා. ඉතින් මම මේ අවස්ථාවේදී අහන්නේ වාමාංශික ඇමතිතුමනි, මෙන්න මෙයයි. කරුණාකරලා මේවා විමර්ශනයට ලක් කරන්න. මේවා අපි හාස්‍යයට ලක් කරන්නේ නැහැ. අපි කැමැතියි ආර්ථිකය දියුණු කරන ආණ්ඩුවක් - [බාධා කිරීමක්] අපි කැමැතියි රට දියුණු කිරීමට. ඒ ආර්ථිකය දියුණු වන එක තමයි අපි රටේ සංවර්ධනය ලෙස සලකන්නේ. නැත්නම් තුන් හතර දෙනෙකුගේ සංවර්ධනය විතරක් කතා කරන පුද්ගලයෝ නොවෙයි අපි. ඒ සම්බන්ධයෙන් අපි කියන්නේ මේකයි. කරුණාකරලා මේවා තමයි විමර්ශනයට ලක් කරන්න අවශ්‍ය වන්නේ. ඇමතිවරු හැටහුටහුමාරක් ඉන්නවා. වැඩ කරන්න දේවල් නැහැ. ඉතින් දාන්න, ඒවා හොයන්න. ඒවා තමයි කරන්න අවශ්‍ය වන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හා,හා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි හා, හා කියන්නේ? [බාධා කිරීම්] හා, හා කියන්නේ ඔබතුමාටත් ඒ කොටසින් දෙයක් ඕනෑ වාගේ කථා කරන්නේ. කියන දේවල් නැති නිසා තමයි මේ ආණ්ඩුවේ තිබෙන ප්‍රශ්නය. ඊයේ මුදල් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ජනාධිපතිතුමා හිටියා. ජනාධිපතිතුමාට ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ ඇමතිවරුන්ට ක්‍රියාත්මක කරන්න බැරි වන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි මට තිබෙන්නේ. එතැනට ගියාම ආයෝජන මණ්ඩලය ගැන ප්‍රශ්නයක් තිබුණා. එතුමා දුන්නු උත්තරෙන් මම පුදුම වුණා. මොකද ඒ කියන දේ තමයි පිළිගෙන තිබෙන්නේ. ඒවා ක්‍රියාත්මක කරන්න. අද මෙතැන තිබෙන debit tax කියන්න පුළුවන්. අර Tax කරන්න පුළුවන්; මේ tax කරන්න පුළුවන්. BOI කියන්නේ Board of Investment not Board of Idiots. දැන් ඇවිල්ලා තිබෙන්නේ Board of Idiots කියන මට්ටමටයි. Board of Investment යටතේ one-stop shop කියන එක තමයි පිළිගත්තේ. ජනාධිපතිතුමා ඊයේ දුන්නු උත්තරය මම අගය කරනවා. මේක වෙනස් කරන්න අවශ්‍යයි කිව්වා. ආයෝජකයෝ රටට එන්නේ යමක් කරන්න. මේක තැනින් තැනට ගිහිල්ලා කරන්න බැහැ. එකක් Inland Revenue Department යන්න, අනික් එක Environment Department යන්න, නැත්නම් තව කොටසක් bank වාගේ යන්න තියන්න නොවෙයි අවශ්‍ය. වග කීමකින් මම මේ ගැන අහනවා. මෙතැන ආර්ථික සංවර්ධන ඇමති නැති නිසා මම අහන්න අකැමැතියි. නමුත් මේ ගැන අහන්න වනවා. ඒ, 2011 ජනවාරි මාසයේ ඉඳන් අද වන තුරු ආයෝජන මණ්ඩලයට අයදුම් පත් කීයක් ඉදිරිපත් වෙලා තිබෙනවාද කියලායි. ඒකෙන් කීයකට උත්තර දීලා තිබෙනවාද? ඒකෙන් කීයක් ආයෝජකයෝ බවට පරිවර්තනය වෙලා තිබෙනවාද? මම මේක ඉතාමත් කම්පාවෙන් කියන්නේ. දැනට අත්සන් කරලා තිබෙන්නේ හතරයි පහයිලු. මේකෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ එකලු. මම දන්නේ නැහැ, අනික් ඒවා -තිබෙන කොම්පැනි ටික- වර්ධනය වෙලා තිබෙනවා? නමුත් මේ සංශෝධනයට වැඩිය මෙන්න මේ වාගේ ප්‍රායෝගිකව වෙනස් කරන්න පුළුවන් දේවල් තමයි අවශ්‍ය වන්නේ. මතක තියා ගන්න. එක්සත් ජාතික පක්ෂය -අපි- මේ ආර්ථිකය සංවර්ධනය කරන්න සම්පූර්ණ සහයෝගය දෙනවා. මේ අදහසුත් දෙන්නේ ඔය සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේදී කරුණාකරලා අහන්නේ මේකයි. මේ BMW එකට, බෙන්ස්

[ගරු රවි කරුණානායක මහතා]

එකට, පැජරෝ එකට, ප්‍රාඩෝ එකට, ලිමෝසින්වලට බදු අඩු කරපු ආණ්ඩුවක්. අහිංසක ජනතාවට- [බාධා කිරීමක්] දැන් මේ අපේ වාමාංශික ඇමතිතුමා දැන ගත්තේ නැහැ පරිප්පුවල තිබ්බ බද්ද. මට හිනා වෙන්න පටන් ගත්තා. 2004 අප්‍රේල් මාසයේ දෙවැනි දා අපි රට භාර දෙන කොට රුපියල් 12ට තිබුණු පොල් ගෙඩිය අද රුපියල් 65යි. [බාධා කිරීම්] එදා රුපියල් 12.50ට තිබුණු පාන් ගෙඩිය අද රුපියල් 60යි. දැන් මොනවාද මෙතැන උත්තර කියන්නේ? එදා රුපියල් 75ට තිබුණු පොල් තෙල් බෝතලය අද රුපියල් 280යි. [බාධා කිරීම්] ඒ වාගේම තමයි බිත්තරෙත්. එදා රුපියල් හතරට තිබුණු බිත්තරය අද රුපියල් 18යි. එදා රුපියල් 45ට තිබුණු පරිප්පු අද රුපියල් 200යි, රුපියල් 220යි. [බාධා කිරීම්] රුපියල් 35ට තිබුණු සීනිවල මිල අද රුපියල් 110යි, රුපියල් 115යි. [බාධා කිරීම්] දැන් ඕක විතරද? ඔන්න පොඩි ඡන්දයක් තිබුණා. ප්‍රතිඵල මෙන්න මෙහෙම ලැබුණා. ලැබුණ ප්‍රතිඵල නිසා හෙට ඉඳන් සීනි මිල තවත් රුපියල් 200කින් වැඩි කළත් කමක් නැහැ- [බාධා කිරීම්] එහෙනම් ඉතින් වැඩි කරන්න. ජනතාව දැන් licence එකක් දීලා තිබෙනවා කරන්න. අපේ වැඩය, අපේ ජනතාව වෙනුවෙන් අපි මෙතැන ඉන්නේ ආණ්ඩුවක් රකින්න නොවෙයි, රටක් රකින්නයි. මෙතැන විපක්ෂයේ කාර්ය භාරය සම්බන්ධයෙන් අපි මේ අවස්ථාවේදී ඉතාමත් ඕනෑකමින් කියන්නේ මේකයි. ජනතාව licence එකක් දුන්නා නේ. එහෙනම් මම අහපු ඒවාට මිල වැඩි කරන්නේ නැහැ කියන සහතිකය ලබා දෙන්න. අද එක පැත්තකින් පඩි වැඩි කරන්නේ නැහැ. අනික් පැත්තෙන් ජීවන වියදම වැඩි කරනවා. අන්තිමට වෙන්නේ-[බාධා කිරීම්] මෙහෙම තමයි ඊජිප්තුවේ මුබාරක් කිව්වේ. මුබාරක් මොනවාද ඇවිල්ලා කිව්වේ? "මම අවුරුදු 30ක් පාලනය කළා. මේ ගොල්ලන් කෑ ගහනවා නම් උන්ට ගෙදර යන්න කියලා මම ගෙදර යන්නේ නැහැ" කියපු එක් කෙනා පැය 24න් ගියා නේද? එහෙම යන්න දෙන්න ඕනෑ නැහැ. අපට අවශ්‍ය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. කවුරුවත් පිට රටකින් මේ රටේ අභ්‍යන්තරය ගැන ඇඟිලි ගහන්න ඕනෑ නැහැ. අපි එදත් කියනවා. අදත් කියනවා. නමුත් ආණ්ඩුවක් වශයෙන් ඇඟිලි ගහන්න ඉඩ තියන්න එපා. මෙතැන මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා ඉන්න නිසා කියනවා. පිට රටකින්, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගිලිහී යන අවස්ථාවක ඇඟිලි ගහන්න ඉඩ දෙන්න එපාය කියන එක කරුණාකරලා මම මේ අවස්ථාවේදී කියනවා. ඒ සම්බන්ධයෙන් අපි ඉතාමත් ඕනෑකමින් මේ ගැන නැවත අපේ පක්ෂය සාකච්ඡා කරනවා. ඒ, කොහොමද ඒකට උත්තර දෙන්න අවශ්‍ය වන්නේ කියලා. මොකද ඉදිරි කාලාන්තරය තුළ ඉතාමත් අමාරු කාලයක් තුළින් ගමන් කරන්න වෙයි. අද මේ රටේ ආර්ථිකයට සුනාමියක් ඇවිල්ලායි තිබෙන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේලා නැහැයි කියනවා. ඒක ඔබතුමන්ලාගේ ඇමති මණ්ඩලයට දැනෙන්නේ නැති වන්න පුළුවන්. ඇමති මණ්ඩලයේ පවුල් ටිකට සහ වැඩ කරන පිරිසට ඒක දැනෙන්නේ නැති වන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන අයගෙන් අහන්න, උදේ පාන්දර එන කොටම ඒ අය කියන දේවල්. "අනේ මේ ආණ්ඩුව කියන එකයි, කරන එකයි වෙනස්, ඡන්දෙ කාලයට කියන දේවල් නොවෙයි දැන් කතා කරන්නේ, ජනතාවට ආදරයක් නැහැ, කතා කරන්නේ නැහැ, හැඟීමක් නැහැ." කියනවා. ඉතින් දැන් ඡන්ද ප්‍රතිඵල ලැබී තිබෙනවා. ඒ ගැන බොහොම සතුටු වෙනවා. හිතන්න එපා පරාජය වුණේ අපිය, පරාජය වුණේ ජේවීපී එකය කියලා. ඔතැනදී පරාජය වුණේ ජනතාවයි. ඔතැනදී ජනතාව පරාජය වෙලා තිබෙනවාය කියන එක තමයි අපි මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මෙන්න ජනතාවට අපහාස කරනවා. මෙන්න, මේ උදවිය ජනතාවට අපහාස කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අනේ මේ, ඔබතුමන්ලාගේ ඇමතිවරු තණ කොළ කැවාය කියපු - [බාධා කිරීමක්] ගිහින් වෙන දෙයක් ගැන කතා කරන්න. මේ ආණ්ඩුව යටතේ එක දෙයක් විතරක් අඩු වෙලා තිබෙනවා. මොනවා නැති වුණත් කුඩුවලට තිබෙන මිල නම් අඩු වෙලා තිබෙනවා. මෙතැන ඉන්න කොළඹ දිස්ත්‍රික්කයේ, බොරැල්ල ආසනයේ අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවොත් කියාවි. එදා රුපියල් 200ට, 300ට තිබුණු පැකට් එක අද රුපියල් 2,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. මොකද, "මතට තිත" වැඩසටහන බොහොම දරුණු මට්ටමෙන් ක්‍රියාත්මක කළා. පාතාල ලෝකය වෙන්න පුළුවන්, කුඩුකාරයෝ වෙන්න පුළුවන්, ඒ ඔක්කෝම නැති කළා. මම ඒක අගය කළා. අන්න ඒක තමයි කළ යුත්තේ. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒක එක පාරටම නැවැත්වුවා. එතකොට රුපියල් 2,000ට තිබුණු පැකට් එක ආයෙත් රුපියල් 200ට, 300ට අඩු වුණා. රටේ පාන් මිල අඩු කරන්න බැරි ආණ්ඩුව, රටේ බිත්තර මිල අඩු කරන්න බැරි ආණ්ඩුව, පොල් ගෙඩියේ මිල අඩු කරන්න බැරි ආණ්ඩුව කුඩු මිල අඩු කරලා තිබෙනවා. මොකක්ද මේකේ තිබෙන්නේ? ඒක විතරයි. [බාධා කිරීමක්] කවුරුත් දන්නවා, ඔය වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්] මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නවාද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, කතාව කරගෙන යන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම හිතන්නේ nursery ළමයෙක් වුණත් දන්නවා මම සිගරට් එකක්වත් බොන්නේ නැති කෙනෙක් බව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න. මේ ආණ්ඩුව අඩු කරලා තිබෙනවා නම් අඩු කරලා තිබෙන්නේ ඔන්න ඕක විතරයි. අපට අවශ්‍ය වන්නේ ජීවන වියදම අඩු කරන එකයි. කොහොමද ඒක අඩු කරන්නේ? ඒ වාගේම තමයි රටේ ආයෝජකයන් පිළිබඳ කාරණයත්. මේ රටට ආයෝජකයන් යොදවන මුදල්වලින් අනිවාර්යයෙන්ම අපි මේ රටේ යටිතල පහසුකම් දියුණු කරලා අපනයන කටයුතු කරන්න පුළුවන් විධියේ ක්ෂේත්‍රයක් ඇති කරන්න අවශ්‍යයි. අද අපනයනකරුවන් ඉතාමත් අමාරු තත්ත්වයකයි ජීවත් වන්නේ. මොකද, එදා අපනයනකරුවෙකුට ආදායම වශයෙන් රුපියල් 117ක් ලැබුණා නම් අද රුපියල් 110යි හම්බ වෙන්නේ. අද පඩි වැඩි වෙලා. අද විදුලි බිල වැඩි වෙලා; වතුර බිල වැඩි වෙලා. ආණ්ඩුවේ වියදම් හුඟක් වැඩි වෙලා. නමුත් ආදායම අඩු වෙලා. ආණ්ඩුව අපනයනකරුවන්ට උදවු කරන්නම අවශ්‍යයි. ඒ නිසා අද exports have reduced drastically. අපි ඒක මතක් කරනවා, මතක් කරනවා. නමුත් ඔබතුමන්ලා GDP ගැන කියනවා. Total exposure of public debt to GDP ගැන මතක් කරනවා. අපි කියන්නේ පිට රටින් ආයෝජන සඳහා ලැබෙන මුදල් ප්‍රමාණයත්, ණය බරතාවත් දෙක සංසන්දනය කරන කොට ඒ පරතරය දවසින් දවස අඩු වෙනවාය කියන එකයි. අපනයනය අඩු වෙනවා.

ණය ප්‍රමාණය වැඩි වෙනවා. ඒ නිසා දවසින් දවස ඒ පරතරය අඩු වෙලා භයානක තත්ත්වයක් ඇති වෙනවා. මගේ මතකයේ හැටියට මේ මොහොත වන කොට සාමාන්‍යයෙන් ආදායම බිලියන 1,050ක් වන කොට අපි ණය හැටියට ගෙවනවා බිලියන 950ක්. ඉතින් ඒ නිසා මේ අවස්ථාවේදී රටේ ආයෝජකයන් දිරිමත් කරවන විධියේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපි මේවා කිව්වාම ආණ්ඩුව හිතනවා, අපි රුපියලේ අගය අවප්‍රමාණය කරන්න කතා කරනවාය කියා. අපට එහෙම කරන්න ඕනෑ නැහැ. අපට රුපියලේ අගය අවප්‍රමාණය කරන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් රටේ අපනයනකරුවන්, අප රටේ රැකීරක්ෂා ඇති කරන කොම්පැනි දිරි ගන්වන්න අවශ්‍යයි. ඒවා වහන්නේ නැති වෙන්න කටයුතු කරන්න. ප්‍රධාන විපක්ෂය වශයෙන් අපි ඒ සම්බන්ධයෙන් කියනවා. මේ පාර්ලිමේන්තුවේදී අපි ප්‍රශ්න කළා, කෘෂි කර්මාන්තයේ යෙදී සිටින ගොවීන්ට පොහොර දෙනවාද කියා. ඒ වෙලාවේදී කිව්වා, හැම දෙනාටම දෙනවාය කියා. වැලිමඩට ගිය අවස්ථාවේදී ජනාධිපතිතුමා කිව්වා, ගොවිතැන් කරන අයට විතරක් නොවෙයි අනික් සියලු දෙනාටම පොහොර දෙනවාය කියා. එහෙම නම් අවුරුදු 3ක් තිස්සේ මෙතෙක් අපි මේ පාර්ලිමේන්තුවේදී අහපු ප්‍රශ්නවලට බොරු උත්තර නේ දීලා තිබෙන්නේ. සුමාන දෙකකට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා වැලිමඩට ගිය අවස්ථාවේදී කිව්වේ ගොවිතැන් කරන සියලුම අයට නැවත පොහොර ලබා දෙනවාය කියායි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara )
ඒක බොරුවක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මොනවාද බොරුය කියන්නේ? ඔක්කොටම දෙනවාය කියා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට මෙහේ ඇවිල්ලා තර්ක විතර්ක කරන්න පුළුවන්. ඔබතුමන්ලා ඊට පසුව මෙහේ ඇවිල්ලා අහිංසක ගොවීන්ට IMF එක අනුව කොන්දේසියක් දමාවි, පොහොර දෙන්න පුළුවන් වෙන්නේ හෙක්ටෙයාර් දෙකකට අඩු ප්‍රමාණයකට විතරක්ය කියා. ඉන් පසුව කියාවි, පොහොර ලබා ගන්න නම් වී බුසල් මෙච්චර ප්‍රමාණයක් ලබා ගන්න ඕනෑය කියා. ඔය වාගේ කොන්දේසි දමාවි.

ඔබතුමන්ලා සමෘද්ධිලාභීන්ට ගෙවන මුදල අඩු කර තිබෙන්නේ කොයි ආකාරයෙන්ද? ඒ ගොල්ලෝ පොහොසත් වෙලා නැහැ. බැරි වෙලාවත් TV එකක් ලැබුණා නම් ඔන්න සමෘද්ධිය නැති කරලා දානවා. ඔන්න ඔය වාගේ කටයුතු කරන එක තමයි තියෙන්නේ. අපි කියන්නේ හොරුන්ට අඩු කරන්න; නැති කරන්න; වනසන්න කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් අහිංසක දුප්පතාට ලැබෙන්න තිබෙන දේ නැති කර දමන එක නම් හරිම අපරාධයක්. මා නැවත කියනවා, BOI එක; මේ one-stop shop එක නැවත ඇති කරන්න කියා. අද එහේ වැඩ කරන්න දක්ෂයෝ ඉන්නවා. ඒ දක්ෂයෝ දිහා බලන්නේ වෙනත් ලෝකයක වැඩ කරන කට්ටියක් දිහා බලනවා වාගේ. එතැන ලස්සන office එකක් හදලා තිබුණොත් ඒකට ඊර්ෂ්‍යා කරනවා. ඇයි, එහෙම වෙන්නේ? ආයෝජන ගෙනෙන තැනට ඒවා දෙන්න ඕනෑ. අපේ මිත්‍ර වාමාංශික ඇමතිතුමා තමන්ගේ ආකල්පය වෙනස් කරලා තිබුණා වාගේ ලෝකයත් එක්ක එකතු වන මේ පුංචි රටට එන ආයෝජකයන්ට ඒ ආකාරයට පරිසරය හදලා දෙන්න අවශ්‍යයි. එතැනට ගියාම ලොකු ප්‍රශ්නයක්. ලෝක දෙකක්. ව්‍යාපාර ලෝකය පාලනය කරන්නේ මුදල් අමාත්‍යාංශයද, එහෙම නැත්නම් මහ බැංකුවද, එහෙමත් නැත්නම් BOI එකද? අද සාමාන්‍යයෙන් ව්‍යාපාර ලෝකය control කරන්නේ ඔය channels තුනෙන්; ඔය ත්‍රිකෝණයෙන්. මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, ඊට පස්සේ BOI එක. මේ තුන් කොන් සටන තුළින් අද BOI එක නැති කර ගෙන යන ගමනක් තමයි තිබෙන්නේ. මොනවා වුණත් BOI එකේ ධම්මික පෙරේරා බොහොම දක්ෂ ලෙස වැඩ කර ගෙන ගියා. එතැන වෙනස් කළා. ආයෝජන ගෙන්වා ගන්න මාර්ග ඇති කළා. නමුත් ඊට පස්සේ සම්පූර්ණයෙන් වෙනස් වුණා. ඔහු එතැනින් ගියාට පස්සේ ලොකු පීඩනයක් ඇති වෙලා තිබෙනවා කියලා එතැන වැඩ කරන කට්ටිය අපව දැනුවත් කර තිබෙනවා. ඉතින් මම මේ අවස්ථාවේදී අහනවා, ෂැන්ග්‍රි-ලා හෝටලය සහ CATIC එක ඇමෙරිකන් ඩොලර් මිලියන 200ක - 100 per cent tax - සියයට සියයක් බදු ගෙවලාද නැද්ද කියා. බැරි වෙලාවත් හරමානිස් තමන්ගේ පිරිවැටුමට සියයට 12ක් බදු ගෙව්වේ නැත්නම් ඔන්න ඔහුට උසාවියෙන් නොතීසි එනවා. ඔහුව අත් අඩංගුවට ගන්නවා. ඔහු කොට උඩ. නමුත් පිට රට ඉන්න සුද්දෙක් US Dollars මිලියන 200ක් ගෙව්වේ නැති වුණාම ඔහුට salute කරනවා. මෙතැන නියෝජ්‍ය මුදල් ඇමති ඉන්නවා. මම එතුමාගෙන් අහනවා. කරුණාකර කියන්න, මේ 100 per cent tax එක -පිට රට සුද්දන් ගෙවන්න තියෙන tax එක- ගෙවලා තිබෙනවාද නැද්ද කියලා. එදා ටෙන්ඩර් නැතුව දුන්නේ. ටෙන්ඩර් නැතුව දෙන මේ company එකට කොයි නීතිය යටතේද මේක දුන්නේ නැත්තේ? එහෙම නම් දැන් කිසිම සමාවක් නැහැ. දැන් මම මේක මතක් කළා කියලා හරි, එක්සත් ජාතික පක්ෂයේ අපි මතක් කළා කියලා හරි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේක ගැන මීට පසුව ප්‍රශ්න කරයි කියලා හරි ඊට පස්සේ ගිහිල්ලා ගෙවන්නය කියන ඒ පදනම නැහැ. ඒ ප්‍රශ්නෙ තමයි තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂය කාලයේ tax amnesty දුන්නා කියලා, කෝටි 22,200ක් නැති වුණාය කියලා උඩ පැන පැන කිව්වා. අන්තිමට ආවාට පස්සේ ගන්න පුළුවන් වුණාද? කෝටි 100ක් ගන්න පුළුවන් වුණාද? බැරි වුණා. එක්සත් ජාතික පක්ෂය දිහා වපර ඇහින් බලලා ඒ වාගේ බැණ බැණ ආර්ථිකය දියුණු කරන්න බැහැ, ඇමතිතුමා. අපි එකමුතු වෙලා මේ රටේ ආර්ථිකය හදමු. සුදු, කළු, කොළ, නිල්, කහ කියලා භේදයක් නැතිව රටේ ආර්ථිකය හදලා රට ඉදිරියට ගෙනි යන්න ඕනෑ කියලා මතයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒක තමයි කරන්න අවශ්‍ය. [බාධා කිරීමක්] ලජ්ජා නැති දේශපාලනය අපි කරන්නේ නැහැ නේ. දේශපාලනය කරන කොට ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න ඕනෑ නැහැ. ඒ විධියට හිතන්න එපා. අදහස් යොමු කරලා එකට වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් හදමු. අපි අදහස් දෙන කොට ඒවා ක්‍රියාත්මක කරන්න. ඔය සී.බී. රත්නායක වාගේ දක්ෂ ඇමතිවරුන්ට වැඩ දෙන්න. එතුමා පුද්ගලික ප්‍රවාහන සේවා ඇමති. මොකක්ද, කරන්න පුළුවන් වන්නේ? [බාධා කිරීමක්] මගේ කෝච්චේ ආසනයේ සභාපති ඉන්නවා. එයත් එක්ක පොඩි ෂේප් talk එකක් දැම්මාම වැඩි කරන්නේ නැහැ. නැත්නම් වැඩි වෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)
ඒක මට අභියෝගයක් නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඔබතුමාට අභියෝගයක් කරන්නේත් නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විනාඩි 15ක් අරගෙන තිබෙනවා. තව විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම තව විනාඩියකින් අවසන් කරන්නම්. මම මේ අවස්ථාවේදී හෙජින් සුදුව සම්බන්ධයෙන් ඒ මුදල් ප්‍රමාණය ගැනත් මතක් කරනවා. අපි මේ අවස්ථාවේදී රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් මාර්ගයක් ඇති කරමු. රටේ ජනතාව ජීවත් කරවන්න පුළුවන් මාර්ගයක් ඇති කරමු. අද ලෝකයේ ආර්ථිකය භයානක තත්ත්වයක් කරා ගමන් කරනවා. යුරෝපය නැවත ප්‍රශ්නයකට යනවා. මේවා ගැන නොදැනුවත්කමින් කටයුතු කරන්න එපා.

අද මේ Inland Revenue Department එක ඉදිරිපත් කර තිබෙන tax appeals බොහොම භයානකයි. මොකද, සාමාන්‍යයෙන් Inland Revenue Department එකේ තිබුණු ඒ වැඩ කරන්න පුළුවන් වාතාවරණය; තුන් හතර දෙනෙකුට තිබුණු එක එක් කෙනෙකුගේ ග්‍රහණය යටතට ඇවිල්ලා තිබෙනවා. ඒක ඒ තරම් සාර්ථක දෙයක් නොවෙයි. මා දන්නා හැටියට එහි දක්ෂයෝ අපව දැනුවත් කරලා තිබෙන විධියට -මොකද, මට ඒ සම්බන්ධයෙන් දැනුවත්කම ටිකක් අඩුයි- ඒ අය කියලා තිබෙන හැටියට මේක දකුණු අප්‍රිකාවේ තිබෙන ක්‍රමයට ගමන් කරනවා. නමුත් ඒකේ සාරවත්භාවය උරා ගන්න පුළුවන් මට්ටමක මේ වෙනස් කිරීමේ අන්තර්ගතයක් ඇති වෙලා නැහැයි කියන එක තමයි අප දැනුවත් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාමත් ඕනෑකමින් මේ අවස්ථාවේ කියන්නේ, අද රජයේ සියලුම ආයතන අලාභයට දුවන බවයි. CEB එක, එක පැත්තකින් ලාභයක් පෙන්නුවාට ඒක maintain කරලා නැහැ. මම හිතන්නේ ඇමතිවරයා හොඳ උනන්දුවකින් වැඩ කර ගෙන යනවා. මම ඒක පිළිගන්නවා.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

එතකොට CWE එක? [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා 3.50ට පාන් වික්කාට පස්සේ එහෙම තමයි. එවකට හිටපු ඇමතිවරුන්ගෙන් අහන්න කෝ. ඔබතුමන්ලාගේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග දැන් ඒවා කියන්නේ; ඔබතුමන්ලාට private tuition lessons දෙන්නේ. ඉතින් ඒ සම්බන්ධයෙන් බලන කොට CEB එක අලාභයි. ඛනිජ තෙල් සංස්ථාව අලාභයි. දුම්රිය දෙපාර්තමේන්තුව අලාභයි. [බාධා කිරීමක්] මේක මාර වැඩක් නේ. [බාධා කිරීමක්] ඒ කියන්නේ සියයට 55ක, 60ක පාරිභෝගිකයන් පිරිසක් තමයි විදුලිය පාවිච්චි කරන්නේ. එතකොට පාරිභෝගිකයන්ගෙන් ඉතිරි සියයට 40ත් මේකේ අලාභය ගෙවන්න ඕනෑද? මොන අපරාධයක්ද? මොනවාද මේ කථා කරන්නේ? වාමාංශික ඇමතිවරයෙක් හැසිරෙන්න අවශ්‍ය වන්නේ මෙහෙමද? එතකොට පෙට්‍රල් පාවිච්චි කරන්නේ සියයට 20යි. එතකොට තෙල් සංස්ථාවේ අලාභය පෙට්‍රල් පාවිච්චි නොකරන අයටත් ගෙවන්න සිද්ධ වෙනවා. මේ මොන විහිළු කථාද ඇමතිතුමනි? හොඳම දේ මෙන්න මේකයි. කරුණාකර පඩි වැඩි කිරීම සිද්ධ කරන්න. අපට ඔච්චර සද්ද කරන්න එපා. වැඩ කළ ජනතාව වෙනුවෙන් සටන් කරන්න. ඒ තිබෙන අභියෝගය අමතක කරන්න එපා. ඒක තුළින් තමයි අපට ඉදිරියට ගමන් කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා මේ වෙනස් කිරීම් තුළින් රටේ ආර්ථිකය සවි ශක්තිමත් වන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ බොහොම ඕනෑකමින් රටේ ආර්ථික සංවර්ධනය ඉලක්ක - target - කරන්නයි. IMF එක කිව්වත්, ලෝක බැංකුව කිව්වත්, යූඑන්පී එක කිව්වත් හොඳ දෙයක් නම් ඒක කරන්න. IMF එක කිව්වා කියලා එදා අපට සද්ද කරපු අය, අද IMF එක කියන්න ඉස්සෙල්ලා ඒවා කරනවා. ඔබතුමන්ලා තෙල් මිල වැඩි කරන්නේ ඒ නිසායි; ඔබතුමන්ලා ලයිට් බිල වැඩි කරන්නේ ඒ නිසායි; ඔබතුමන්ලා පඩි වැඩි කරන්නේ නැත්තේ ඒ නිසායි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. හැබැයි සාධාරණීකරණයක් ඉෂ්ට කරන්න. එච්චරයි අවශ්‍ය වන්නේ. මේක තමයි තිබෙන වටිනාම දේ. අද මේ රටේ ආයෝජකයන්ගෙන් US Dollars මිලියන 3කට වඩා වැඩිය ආයෝජනය කරන අයට තමයි බදු ගැන හිතන්නවත් වාතාවරණයක් ඇති වන්නේ. එතකොට මෙහේ යම් තැනක රැකී රක්ෂා 1,000ක් පමණ ඇති කරන අහිංසක අයට කොතරම් අමාරුවෙන් ද ඒ ආයතන ගෙනි යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේක value additionවලට target කරන්න. බදු ඇති කරන්න අවශ්‍ය වන්නේ value additionවලටයි. එහෙම කරන්න. එහෙම නැත්නම් සුද්දෙක් ආවා කියලා, ෂැන්ග්‍රි-ලා හෝටලය ආවා කියලා, කැටික් කොම්පැනිය ආවා කියලා, එතැන US Dollars මිලියන 200ක් කියන්නේ මොන වාගේ අපරාධයක් ද? [බාධා කිරීමක්] මොකක්ද මේ අමාරුව? ඔබතුමන්ලා ඇවිල්ලා සංවර්ධනය කරන්නේ බොහොම පොඩි කොටසක්. ඕකට ඔය තරම් ලොකුවට පම්පෝරි ගහන්න අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය, රටට නිදහස ලබා දුන් පක්ෂය, රටේ සංවර්ධනයක් ඇති කර තිබෙන පක්ෂය, රට එක්සත් කර තිබෙන පක්ෂය, - [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මහ ලොකු පක්ෂය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අනේ! ඔව් ඉතින්. අද බලන්න, පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියා ඔබතුමන්ලා කිව්වා. අද උත්තර දුන්නා, "ඔන්න පෞද්ගලීකරණය කළා"ය කියා. ඒ වාගේම තමයි පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියලා ඉඩම් විකුණනවා. ඊට පස්සේ telephone licence විකුණනවා; TV licence විකුණනවා. Immobile assets වුණාට ඒවා පෞද්ගලීකරණය යටතේ එන්නේ නැද්ද? ඉතින් මේ වාගේ බොරු කරන්නේ කාටද? මුබාරක් ඔහොම තමයි හිතුවේ. ගඩාෆි ඔහොම තමයි හිතුවේ. ටියුනීසියාවේ නායකයෝ ඔහොම තමයි හිතුවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නියෝජ්‍ය කථානායකතුමා දැන් මට උඩින් බෝම්බ ගහනවා. ඉතින් මට නිශ්ශබ්දව ඉන්නම වෙනවා. මම මේ අවස්ථාවේ කියන්නේ, කරුණාකර ඔක්කෝම එකතු වෙලා රටේ ආර්ථිකය හදමු; රටේ ජනතාව ගැන කථා කරමු කියලායි. ඡන්ද කාලයේ විතරක් ජනතාවගේ කකුල ළඟ. ඡන්දයට පසුව ජනතාවගේ බෙල්ල ළඟට යන ආණ්ඩුවක් ඇති කරන්න එපා; කරුණාකරලා ජනතාව ගැන කථා කරලා ඒවා ක්‍රියාත්මක කරන්නය කියන එක මතක් කරනවා. පනත් සංශෝධනය තුළින් නම් රටේ ආර්ථිකයක් සවි ශක්තිමත් කරන්නට බැහැ. නමුත් එකට වැඩ කර ශක්තිමත් ආර්ථිකයක් හදන එක තමයි අවශ්‍ය වන්නේ. ඒක කරන්න. මේ

ආණ්ඩුවේ හුඟක් ඇමතිවරු ඉන්නවා; නමුත් මේ අවස්ථාවේ දී වැඩ කරන්න පුළුවන් ඇමතිවරුන්ට භාර දීලා වැඩ කරන්නය කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් සභාව අමතන්නේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා. කරුණාකර නිශ්ශබ්ද වන්න. ඊට පෙර ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම් අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 3.26]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම අද ඉතාමත්ම සන්තෝෂ වෙනවා, මුදල් ඇමතිතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමා විසින් සරල බදු ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා අය වැය යෝජනා යටතේ ඉදිරිපත් කරන ලද යෝජනාවලින් කිහිපයක් සඳහා අද මෙම විවාදය පැවැත්වීම ගැන. ඒ අනුව එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත, පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත් කෙටුම්පත, හරබදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සහ මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත යන සියලුම පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අද විවාද වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක කාරණාවකින් මගේ කථාව පටන් ගන්න කැමැතියි. අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කෙරුවා, පළාත් පිරිවැටුම් බදු සංශෝධනය වන කොට එම ආයතනවල ඉන්න සේවකයන්ට හානියක් වනවාය කියාලා. එතුමා කිව්වා, "එවැනි සේවකයන් තුන්දහස් ගණනක් සිටිනවා" කියාලා. නමුත් ඇත්ත වශයෙන්ම ඒවායේ ඉන්නේ සේවකයන් 372ක් පමණයි. ඒ නිසා අපි වග කීමකින් යුතුව ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි, මේ සේවකයන් 372 දෙනාගෙන් කිසිම කෙනකුගේ සේවය අහිමි වීමක් සිදු වන්නේ නැහැයි කියන එක. ඒ අනුව ඒ පිළිබඳ අවශ්‍ය සාකච්ඡා යම් යම් වෘත්තීය සමිති සමඟත් කරනවා. එසේ කිරීමෙන් පසුව ඒ පිළිබඳ ක්‍රමවේදයක් සකස් කළ විට ඒ අය නිසි ස්ථානවල තබා ගන්නට පුළුවන් වනවා. මෙසේ ඉන්න නිලධාරීන්ගෙන් සැලෙන ප්‍රමාණයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉඳලා පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවලට මාරු වුණු අය. ඉතින් ඒ පිළිබඳ ප්‍රශ්නයක් වන්නේ නැහැ. ඒ අනුව ඉදිරියේදී කටයුතු කෙරෙනවා. ඒ නිසා ඒ පිළිබඳ කිසිම ප්‍රශ්නයක් ඇති වෙයි කියලා අපි කල්පනා කරන්නේ නැහැ.

දෙවෙනි කරුණ, රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, IMF එක කියන විධියට අපි වැඩ කරනවාය කියලා. අපි හැම වෙලාවේම වැඩ කරන්නේ අපේම "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ මිසක්, IMF එක කියන විධියටවත්, වෙනත් කවුරුවත් කියන විධියටවත් නොවෙයි. ඒ වැඩ පිළිවෙළ යටතේ විදේශීය ආයතන සමඟ -විශේෂයෙන් අපට මුදල් ලබා දෙන ආයතන සමඟ- අපි සාකච්ඡා කරලා, රටට ගැළපෙන ක්‍රමයක් මත තමයි අපි ඒ මුදල් ලබා ගන්නේ. ඒ අනුව පසු ගිය අවස්ථාවල -වාර තුනකදී- විශේෂයෙන් IMF එක අපට උදවු කෙරුවා; එහෙමත් නැත්නම් මුදල් ලබා දුන්නා. ඒ සෑම අවස්ථාවකම අපේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිගැනීමෙන් පසුව තමයි ඔවුන් ඒ කටයුත්ත කෙරුවේ කියන එක මම ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම එතුමා කිව්වා, අපි යමක් වැඩි කළාම ඒක අඩු කරන්නේ නැහැයි කියලා. මෝටර් රථ ආනයනය සඳහා තිබුණු බදු ප්‍රමාණයන් එක කාලයක වැඩි වුණා. ඒ වැඩි වුණු බදු ප්‍රමාණයන් යාවත්කාලීන බදු අනුපාතයන් බවට පත් කරන්න මෝටර් රථ ආනයනය පිළිබඳ බදු ක්‍රමය අපි සංශෝධනය කෙරුවා. ඇත්ත වශයෙන්ම එතුමා දන්නවා, අද ලෝකයේ පවතින ක්‍රමවේදයන් අනුව රටකට නව වාහන අවශ්‍ය බව. වාහනවල කාණ්ඩය ගැන මම දන්නේ නැහැ. ඉතා කුඩා වාහනයේ ඉඳලා ඊට වඩා වැඩි අගයක් දරන කාණ්ඩය දක්වා වාහන රටකට අවශ්‍යයි. මතක තියා ගන්න, අද රටක කල් ඉකුත් වූ වාහන තබා ගැනීම එහි පරිසරයට කරන හානියක් බව. සැබැවින්ම කල් ඉකුත් වූ වාහන අපි ඉවත් කළ යුතුයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නොවෙයි මම කිව්වේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඔබතුමා කිව්ව දෙය මට තේරෙනවා. ඔබතුමා කිව්වේ සුඛෝපභෝගී යැයි සම්මත වාහනවල මිල අඩු කෙරුවාය කියලායි. එහෙම එකක් නැහැ. අපි එක්තරා කාලයක ඒවායේ බදු අනුපාතයන් විශාල ලෙස වැඩි කෙරුවා. ඒක යාවත්කාලීන කිරීමක් පමණයි අපි කරලා තිබෙන්නේ. ඒ අනුව ගරු මන්ත්‍රීතුමා දන්නවාද, අද ඉතාම කුඩා කාර් රථයකට පවා -මරුටි කාර් රථයක් සඳහා පවා- මාස හයක waiting list එකක් තිබෙනවාය කියලා? ඒක තමයි ඇත්ත කථාව. Three-wheeler එකක් සඳහා මාස තුන හතරක waiting list එකක් තිබෙනවාය කියන එක මන්ත්‍රීතුමා දන්නවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Duty එක කීයද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු මන්ත්‍රීතුමා කරන තර්කය මේ රටේ ජනතාව පිළිගන්නේ නැති නිසා තමයි ප්‍රාදේශීය සභා 213ක් ඉතාම හොඳ අන්දමින් අපි ජය ගත්තේ. ඔබතුමා කියන ආර්ථික ප්‍රතිපත්තිය හොඳයි, ඔය ඇමෙරිකාව, ප්‍රංශය, බ්‍රිතාන්‍යය වාගේ රටවල්වලට. ඒක මේ රටට හුරු එකක් නොවෙයි. නියම විධියට ප්‍රාදේශීය සභා 213ක් අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, -එතුමා ගරු සභාවෙන් පිටව යද්දියි මම මේ කියන්නේ- ඔබතුමන්ලා පාවිච්චි කරපු වචන, කියපු පුරෝකථන මේ සියල්ලම අද ජනතාව ප්‍රතික්ෂේප කර තිබෙනවා. මොකද, ජනතාව ප්‍රතික්ෂේප කරන්නේ? ඒ, අපේ ආර්ථික ප්‍රතිපත්තිය සහ අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ මේ රටේ ජනතාව පිළිගන්න නිසා බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි.

එතුමා තව ප්‍රශ්නයක් නැඟුවා. ඒ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ රජය කාලයේ තමයි, විශේෂයෙන්ම වර්තමාන අතිගරු ජනාධිපතිතුමා පැමිණීමෙන් පසු තමයි එක් වරම රාජ්‍ය සේවයේ වැටුප දෙගුණයක් බවට පත් කරලා හොඳ වැටුප් තලයක රාජ්‍ය සේවය පිහිටෙව්වේ කියන එක. ඒක වෘත්තීය සමිති දන්නවා. ඒ වෘත්තීය සමිති එක්ක අපි නිරන්තරයෙන් සාකච්ඡා කරනවා. මතක තියා ගන්න, එක්සත් ජාතික පක්ෂය එදා උත්සාහ කෙරුවේ, ඒ ආණ්ඩුව තිබෙන කොට රනිල් වික්‍රමසිංහ මහත්මයා අය වැය යෝජනාවක් හැටියට ගෙනාවේ රාජ්‍ය සේවකයන් විශ්‍රාම යවන්නයි. රාජ්‍ය සේවකයන් තුනෙන් එකක් විශ්‍රාම ඇරලා රාජ්‍ය සේවය හකුළුවන්න උත්සාහ කෙරුවා, ලක්ෂ 4කට. හකුළුවලා, ඒ අය ගෙදර ගියාට පස්සේ විශ්‍රාම වැටුපක් ගෙවන්න තීන්දු කෙරුවා. මම ඒ වෙලාවේ ඒ පිළිබඳව යම් ප්‍රශ්නයක් ඇමතිවරයෙකුගෙන් නඟපුවාම ඒ අය කිව්වා, "අපි ඒ ගැන කියන්න දන්නේ නැහැ" කියලා. නමුත් අපේ කාලයේ අපි රාජ්‍ය සේවක ප්‍රමාණය ලක්ෂ 13 දක්වා පුළුල් කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවය විවිධ අංශවලටත්, පැතිකඩවලටත් දියුණු කරලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා රාජ්‍ය සේවයේ වැඩි පුරම පඩි වැඩි කිරීමක් කළ අපේ ආණ්ඩුවෙන් පඩි වැඩි කිරීමක් නොකළේ මොකද කියලා අහනවාට වඩා, පඩි වැඩි කිරීමේ අනුපාතයක් මේ තරම් වැඩි කළේ මොකද කියලා අහන එක හොඳයි. මොකද, ලක්ෂ 13ක් වන රාජ්‍ය සේවකයන්ට හොඳම හොඳ පඩි වැඩි වීමේ අනුපාතයක් ඇති කෙරුවේ අපේ ආණ්ඩුව නිසායි. ඒක අපි මේ අවස්ථාවේදී ඉතාම ඕනෑකමින් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන තවත් තර්කයක් ගෙනාවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන මේ වෙලාවේ පාඩමක් උගන්වන්න මට බැහැ. නමුත් මම එක දෙයක් කියලා නවත්වනවා. අපේ ආණ්ඩුවේ බලය තිබෙන කාලයේ අපි තමයි ඡන්දය දැමීම සඳහා හැඳුනුම් පත පාවිච්චි කළ යුතුයි කියලා නීතියක් ගෙනාවේ. අද මේ රටේ ඉන්න ඉහළම ගණයේ කෙනා වුණත්, මේ කථා කරන මම වුණත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා වුණත්, මෙතැනින් නික්ම ගිය ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වුණත්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා වුණත් ඡන්ද පොළට යන කොට තමන්ගේ හැඳුනුම් පත නැත්නම් මන්ත්‍රීවරයෙක් කියලා පිළිගන්නේ නැහැ. ආපහු ගෙදර එවනවා. ඒ තත්ත්වය ඇති කළේ අපේ ආණ්ඩුව. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මූලික හරය තමයි, ජනතාවට තමන්ගේ නිදහස් සාධාරණ ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ බහුලව ක්‍රියාත්මක කිරීම. ඒ කාර්යය අපි කරලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැති තවත් කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා පසු ගිය දිනවල පැවැති ඡන්දයේදී රැස්වීම් තිබ්බේ නැද්ද, කොඩි ඇද්දේ නැද්ද, පෝස්ටර් බෙදුවේ නැද්ද, සල්ලි වියදම් කළේ නැද්ද? ඒවා කළා. සමහර විට නොයෙකුත් තැන්වල විශාල ජයග්‍රහණ ලබනවා කියලා තමුන්නාන්සේලා පම්පෝරි ගැහුවත්, තවම ජනතාව ඉන්නේ අපේ ආර්ථික ප්‍රතිපත්ති එක්කයි. ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව තමුන්නාන්සේලාගේත් අදහසක් තිබෙනවා. නමුත් ඒ අදහස මේ රටට ගැළපෙන අදහසක් නොවෙයි කියලා මම ටිකක් කරුණු සහිතව කියන්න කැමැතියි.

ඔබ දන්නවා, ලෝකයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරපු ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ G - 8 රටවල් අද ආර්ථික වශයෙන් පසු බෑමකට ලක් වෙලා තිබෙන බව. ඒ රටවල් දැවැන්ත ආර්ථික පසු බෑමකට ලක් වෙලා විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ සමහර කොම්පැනි පළමුවෙනි වතාවට ඇවර කිරීමට යටත් වුණා. ඒ ආණ්ඩු කොහොමද ඒ අයව බේරා ගත්තේ? ආණ්ඩුව මුදල් දීලා, ඒවාට තමන්ගේම නිලධාරීන් පත් කරලා එක්තරා විධියක ජනසතු ව්‍යාපාරයක් කළා. එක්සත් ජනපද ආණ්ඩුව පළමුවෙනි වතාවට ජනසතු ව්‍යාපාරය නොකියා ජනසතු කිරීමක් කළා, ඒ ගොල්ලන්ට ඒ ආර්ථික අර්බුදයෙන් ගැලවෙන්න බැරි වුණ නිසා. ඒ ආර්ථික ප්‍රතිපත්තිය අද ඔවුන් පවා සංශෝධනය කිරීමකට ලක් කරලා තිබෙනවා. අපේ ආර්ථික ප්‍රතිපත්ති බොහොම සරලයි. එක පැත්තකින් අපි අපේ ජනතාවගේ මූලික අවශ්‍යතාවලට පනවන බදු බර, වැය බර බොහොමයක් නැති කරලා තිබෙනවා; අඩු කරලා තිබෙනවා. ඒ වාගේම අපි මහා පරිමාණ ව්‍යාපෘති රාශියක් ඇති කරලා තිබෙනවා.

අද මේ රටේ විදුලි බලය සම්බන්ධයෙන් කථා කරනවා නම්, ඔබතුමන්ලාටත් මතක ඇති, අපි ආණ්ඩුව ගන්න කොට මේ රටේ විදුලි බලය තිබුණේ සියයට 35කට විතර ප්‍රමාණයකට. අපි ඒක වැඩි කරලා සියයට 85ක් වැනි විශාල තැනකට ගෙනත් තිබෙනවා. ඒ නිසා අද ඉතා කුඩා නිවසක වුණත් විදුලි බලය තිබෙනවා. සියයට 90කට ආසන්න ප්‍රමාණයකට විදුලි බලය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වන විට සියයට 100කට විදුලි බලය ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා. අද කුඩා නිවසකට පවා විදුලි බලය ලැබිලා, ඒ විදුලි බලය භාවිත කළ හැකි භාණ්ඩ අර ගෙන ඒ ජනතාව කටයුතු කරන්නේ අප ගෙන යන සහනදායී වැඩ පිළිවෙළ නිසායි. විදුලිබල මණ්ඩලය වෙන්න පුළුවන්, ඛනිජ තෙල් සංස්ථාව වෙන්න පුළුවන් ඒ මිල වැඩි කරන වෙලාවට අපි ඉඩ දීලා නැහැ. ඒ වාගේම මහ ජනයාට අහිතකාමී ලෙස අපි ඒවා ක්‍රියාත්මක කරලාත් නැහැ. ඒ නිසා හැම විටම මහ ජන හිතකාමී ලෙස ඛනිජ තෙල් වාගේම විදුලි බලයත් ලබා දීලා මේ රටේ කුඩා මිනිසුන් ගණනාවක් ආරක්ෂා කරලා තිබෙන බවත්, ඒ වාගේම ඔවුන්ගේ ජීවන මට්ටම වැඩි කරලා තිබෙන බවත් අපි තමුන්නාන්සේලාට ඉතා හොඳින් මතක් කරන්න කැමැතියි. අද ගම්බද ජීවත් වන ජනතාව හුඟක් වැඩි වෙලා තිබෙනවා. අපි ගම්බද උදවිය හැටියට මම ඒ බව දන්නවා. අපේ ගම්බද ප්‍රදේශ ගණනාවකට විදුලි බලය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දුරකථන භාවිතය වැඩි වෙලා තිබෙනවා. වෙළෙඳ පොළ පිළිබඳ නිසි වැටහීමක් අද සියලුම ගොවීන්ට තිබෙනවා. එදා තිබුණේ නැහැ. එදා හපුතලේ ඇත කෙළවරේ සිට තවලමෙන් එන ගොවියාට තමන්ගේ නිෂ්පාදන විකුණා ගන්න ඕනෑ කරන මිල සොයා ගන්න බැරිවයි හිටියේ. නමුත් අද ඒ සියලු දෙනාට තමන්ගේ අතේ ගෙන යන කුඩා ජංගම දුරකථනය හරහා වෙළෙඳ පොළ හඳුනා ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ නිසා අද තමන්ගේ කොටුවේ ඉඳලා වෙළෙඳ පොළට ගෙනෙන ද්‍රව්‍යවල මිල කලින් තෝරා ගැනීමට ඔවුන්ට හැකියාව තිබෙනවා. ඒ නිසා ඒවායේ මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ බැංකු ගිණුම්වල මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා ඔවුන් අද හොඳ ආර්ථික මට්ටමකත්, හොඳ ජීවන මට්ටමකත් ඉන්නවා. අද ඔවුන් credit cards පාවිච්චි කරනවා. ඉතින් අද මේ තත්ත්වය නැහැ කියලා, එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය තමයි හොඳ කියලා, තමුන්නාන්සේලා කොච්චර කිව්වත් ඒ කියන කියන වාරයක් පාසා, හැම මැතිවරණයකදීම තමුන්නාන්සේලා පරදිනවා.

මතක තියා ගන්න ඒ ආර්ථික ප්‍රතිපත්තිය මහ ජනයා පිළිගන්න ඕනෑ බව. අපි ගෙන ගිය මහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්තිය ඉතාම වැදගත් ආර්ථික ප්‍රතිපත්තියක්. සුද්දාගේ කාලයේ ඉඳලා, එහෙම නැත්නම් යටත් විජිත යුගයේ ඉඳලා මේ රටේ යම් බදු ප්‍රතිපත්තියක් තිබුණා. ඒ බදු ප්‍රතිපත්තිය නිවැරදිව තේරුම් අරගෙන, ඒ බදු ප්‍රතිපත්තියේ ලිහිල් කළ යුතු තැන් ලිහිල් කරන්න ක්‍රියා කළේ අතිගරු ජනාධිපතිතුමා පමණයි. එතුමා බදු කොමිසමක් පත් කළා. බදු කොමිසමක් පත් කරලා බදු ක්‍රමය සරල කළා. ඒ සරල කරන්න අවශ්‍ය කරන මූලෝපායන් සහිතව තමයි එතුමා ගිය වසරේ මේ වසරේ අය වැය ඉදිරිපත් කළේ. ඒ අය වැය වාර්තාවේ යෝජනා අනුව කරන වැඩකටයුතුවල අපි දැන් යෙදිලා ඉන්නවා. ඒ අනුව මා විශ්වාස කරනවා අපේ වැඩ කටයුතුවලට විශාල යහපතක් වෙලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ එකතු කළ අගය මත බදු සංශෝධනයේ නිදහස් කිරීම් අරගෙන බැලුවොත්, ඒ තුළින් පෙට්‍රල් නිදහස් කරලා තිබෙනවා; ගල් අඟුරු නිදහස් කරලා තිබෙනවා; bitumen නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම ධාන්‍ය මිශ්‍ර බේකරි නිෂ්පාදන නිපදවීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර සහ උපකරණ, කාබනික අපද්‍රව්‍ය භාවිත කර දේශීයව සම්පීඩනය කර කුට්ටිකර ගත් ගල් අඟුරු, සම් හෝ පාවහන් හෝ බෑග් කර්මාන්තය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සහ උපකරණ, උසස් තාක්ෂණයෙන් යුත් වෛද්‍ය හා විද්‍යාගාර උපකරණ, මෝටර් හෝම්ස්, කුලී රථ මීටර්, කෘෂිකාර්මික යන්ත්‍ර සහ කොටස්, සැහැල්ලු විද්‍යුත් උපකරණ, කෘත්‍රිම ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා භාවිත කරන අයිතම, රේගු කටයුතු සඳහා ස.වි.අ. යටතේ හඳුනා ගනු ලැබූ විදුලි සංදේශ සේවා සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර හා උසස් තාක්ෂණයෙන් යුත් උපකරණ සහ ගුවන් යානා සමමිතිකයන් සහ කොටස් නිදහස් කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Minister, I have a pleasant task to perform now. I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from the National People's Congress of China led by His Excellency Hua Jianmin, Vice-Chairman of the Standing Committee of the National People's Congress of China, now present in the Speaker's Gallery.

Hon. Minister, you can continue with your speech.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි

ඒ වාගේම විදුලි සංදේශ සේවා. මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන රජයේ අමාත්‍යාංශවලට සෘජුවම ලැබෙන විදේශ අරමුදල් හා පරිත්‍යාග මත ක්‍රියාත්මක වන යම් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වන භාණ්ඩ හෝ සේවා, ආබාධිත රණ විරුවන් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිහිටු වනු ලැබුවා වූ ද, එහි කාර්යයන් එම රණ විරුවන් විසින් කරනු ලබන්නා වූ ද, ආයතනයක් විසින් සපයන භාණ්ඩ හෝ සේවා, දේශීයව සකසන ලද පරිගණක මෘදුකාංග, රක්ෂණ ව්‍යාපාරයක නියැලී සිටින දේශීය රක්ෂණ සමාගමක් ප්‍රතිරක්ෂණය කිරීමෙන් ලබන කොමිස් හෝ වන්දි ලැබීම්, විදුලි සංදේශ නියාමන කොමිසම විසින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවා, අධ්‍යාපන සේවා ආදී වශයෙන් තව බොහෝ සංඛ්‍යාවක් නිදහස් කරලා තිබෙනවා. ඒ කියන්නේ බදු ප්‍රමාණ සියයට 20 සිට 12 දක්වා අඩු කිරීමට අමතරව අපේ රටේ නිෂ්පාදන සඳහා පාවිච්චි කරන, මහා මාර්ග තැනීම සඳහා පාවිච්චි කරන යන්ත්‍රසූත්‍ර සියල්ලම වාගේ මේ එකතු කළ අගය මත බදුවලින් නිදහස් කිරීමට රජය කටයුතු කරලා තිබෙනවා.

දියුණු කරන්න නම් කළයුතු ප්‍රධාන රාජකාරියක් තිබෙනවා. එකක් තමයි අපේ ගමනාගමනය, මහා මාර්ග දියුණු කිරීම හා මාර්ග සංවර්ධනය කිරීමෙන් පමණයි, එක් අන්තයක සිට තවත් අන්තයකට ඉතාම කෙටි කාලයකින් ගමන් කළ හැකි නවීන මාර්ග නිර්මාණය කිරීමෙන් පමණයි, අපේ රටේ ආර්ථික ක්‍රියාවලිය වේගවත් කරන්න පුළුවන් වන්නේ. ඒක එක අංශයක්. ඉතිං ඒ අංශය අතිගරු ජනාධිපතිතුමා හොඳින් තේරුම් ගත්තා. විශේෂයෙන්ම මේ රටේ ගම්බද මාර්ග, නගර බද මාර්ග, ඒ වාගේම මහා මාර්ග, පාලම් යන මේ සියල්ලම සංවර්ධනය කරන්න විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඉතින් මේ නිසා අපි දන්නවා, රටක් සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මේ ආණ්ඩුව අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව නිර්ලෝභීව වියදම් කරන බව. අවුරුදු ගණනකට කලින් එක්සත් ජාතික පක්ෂය නොරොච්චෝලේ ගල් අඟුරු ව්‍යාපෘතිය අත හැරියා. මම දන්නවා අත හැරපු බව. ඒ වාගේම එතුමන්ලාගේ කාලයේ ඉහළ කොත්මලේ - Upper Kotmale - විදුලි යෝජනා ක්‍රමය අත හැරියා. අඩු ගණනේ නායකත්වයක් දී ගන්න බැරි වුණා. ඒ වෙලාවේ හිටපු විදුලිබල ඇමතිවරයා කොත්මලේ විදුලි බලාගාරයට මුල්ගල තබන්න ආරාධනා පත්‍රත් ගහලා cancel කරලා දැම්මා. එක්සත් ජාතික පක්ෂයට එහෙම ලොකු වැටහීමක් සාමාන්‍ය ජනයා ගැන නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඉතින් මම ඒක කියන්න ඕනෑ නැහැ. කොච්චර කථා කළත් සාමාන්‍ය ජනයා ගැන වැටහීමක් සහ අනාගත දර්ශනයක් පිළිබඳව වැටහීමක් නැහැ. ඒ ගොල්ලන්ට තිබෙනවා ලොකු වචන ගොඩක්. ඒ වචන මත ඒ ගොල්ලන් කරන පුරෝකථන කිහිපයක් තිබෙනවා. ඒ හැර ඒවා ප්‍රායෝගිකව ගොඩ නැඟීමට අවශ්‍ය කරන කිසිදු සැලැස්මක් එක්සත් ජාතික පක්ෂය සතුව නැහැ. ඒ නිසා මතක තබා ගන්න, අද දවසේ ලංකාවේ ප්‍රථම ගල් අඟුරු බලාගාරය අපි නොරොච්චෝලේ විවෘත කරනවා පළමුවැනි වතාවට. ඒක මෙතුමන්ලා අත හැරලා තිබුණා. මෙගාවොට් 300ක විදුලි ධාරිතාවක්. බලන්න මේකේ timing.

ජපානයේ ඇති වූ සුනාමියත් එක්ක අද මුළු ලෝකයේම න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරකවල අගය අඩු වෙලා. අද න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක ආරම්භ නොකිරීමට රටවල් ගණනාවක් තීන්දු කරලා තිබෙනවා. මේ වන කොට ජර්මනිය 24ක් නවත්වා ගෙන ඉන්නවා. ජපානය අලුතෙන් හදන්න ගිය න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක විශාල සංඛ්‍යාවක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නවත්වා තිබෙනවා. තිබෙන ඒවා decommission කරන්න, එහෙම නැත්නම් ඉවත් කරන්න කටයුතු කරලා තිබෙනවා. වෙනත් උපාය මාර්ග කල්පනා කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න, අපි ගත්ත සමහර තීන්දුවල තිබෙන නිරවද්‍යභාවය. සමහර විට ඒක අපි බලාපොරොත්තු නොවුණු පාරිසරික ක්‍රියාකාරකමක් මත ඇති වුණ දෙයක් වෙන්න පුළුවන්. නමුත් අපේ දේශපාලන නායකයා විසින් ගන්නා ලද දූරදර්ශී ක්‍රියාවන් නිසා අපේ විදුලිබල සැලැස්ම අනුව අපේ කර්මාන්තකරණයටත්, ගෘහය ආලෝකවත් කිරීමටත් අවශ්‍ය කරන සියලුම අංගෝපාංගවල අවශ්‍යතාව අනුව විදුලි බලය වැඩි කරන්න අපිට පුළුවන් වෙලා තිබෙනවා. ඒ අනුව විදුලි බලයෙන් ස්වයංපෝෂිත වීම මේ රටට ප්‍රශ්නයක් නොවෙයි. ඒ වාගේම විදුලි බලය වෙනුවෙන් මෙතෙක් කලක් අපි පාවිච්චි කරපු, විශේෂයෙන්ම ඉන්ධනවලින් දහනය වන විදුලි බලාගාර ක්‍රමානුකූලව වෙනත් ප්‍රභවයන්ට වෙනස් කිරීමත්, ඉන් යම් ප්‍රමාණයක් නවතා තැබීමටත් අපට පුළුවන් වෙනවා මෙවැනි බලාගාර හැදුවාම. නමුත් එක්සත් ජාතික පක්ෂය කියන්නේ මොනවාද? අද එක පාරක් හදා ගන්න බැරි වුණා; විදුලි රැහැන්

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

මාර්ගයක් හදා ගන්න බැරි වුණා; දුරකථන මාර්ගයක් දෙන්න බැරි වුණා; රක්ෂාවක් දෙන්න බැරි වුණා කියලා තමයි කියන්නේ. මට මතකයි "Regaining Sri Lanka" කියන පොතේ එක පරිච්ඡේදයක තිබුණා, ගොල්ෆ් පිට්ටනියක් හදන්න යෝජනා කරලා. ඔබතුමා දන්නවාද ඒ ගොල්ෆ් පිට්ටනිය හදන්න මෙතුමන්ලා යෝජනා කරලා තිබුණා මගේ ආසනයේ අක්කර 2000ක පොල් වත්තක් කපන්න. හොඳ වෙලාවට ආණ්ඩුව පෙරළුණ නිසා ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. එතකොට දැන් මොළේ තිබෙන්නේ ඒ ගොල්ලන්ටය, බලය තිබෙන්නේ අපටය කියලා කෙඳිරි ගාන මිනිස්සු සිතූ ඒ විධියට වැඩ වුණා නම් මම හිතන්නේ අද පොල් ගෙඩිය රුපියල් 200ක්වත් වෙනවා මේ යන ක්‍රමය අනුව. කුඹුරු ගොඩ කරන්න ඉඩදී ගෙන, පොල් වතු කපා ගෙන ක්‍රියාත්මක වුණු ඒ "Regaining Sri Lanka" කියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණා නම් අද අපිට හාමතේ මැරෙන්නයි වෙන්නේ. ඒ නිසා මොළේ තිබෙන්නේ අපිටද, මොළේ තිබෙන්නේ ඒ ගොල්ලන්ටද කියලා ඒ කාලයේ මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන් හැටියට අපි හොඳින් දැන ගෙන තිබෙනවා. ඒ නිසා අපි සියලු අංශ ඉතා ක්‍රමානුකූලව කළමනාකරණය කරනවා. අපේ වැවිලි ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, අපේ සේවා අංශය වෙන්න පුළුවන්, අපේ කර්මාන්ත අංශය වෙන්න පුළුවන්, අපේ වෙළෙඳ පොළ වෙන්න පුළුවන්, මේ සියලු අංශ මේ අවස්ථාව වන කොට අපි කළමනාකරණය කරලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් හැටියට අපි ඉතා විශිෂ්ට සේවාවක් අපේ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ කරලා තිබෙනවා. ඒ නිසා ජනාධිපතිවරණයට දෙවැනි වතාවේ එතුමාට පුළුවන් වුණා මෙතෙක් කිසිම ජනාධිපතිවරයෙක් නොගත්ත ආකාරයෙන් වැඩි ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කරන්න. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර බලයක් අපට ලබා ගන්න පුළුවන් වුණා. එක්සත් ජාතික පක්ෂයේ නායකයින් කරපු පුරෝකථන නිවැරදි නොවන බවට පෙන්නුම් කරමින්, සියයට 60කට වැඩි ඡන්ද ප්‍රතිශතයකින් ප්‍රාදේශීය සභා 213ක බලය අපත්, අපේ අනෙකුත් සන්ධාන පක්ෂත් එකතු වෙලා ලබා ගන්න පුළුවන් වුණා. ඒ නිසා මේ ජනතාව දිගටම එක දෙයක් කියලා තිබෙනවා. ඒ දෙය තමයි, ආර්ථික වශයෙන් වෙන්න පුළුවන්, ප්‍රතිපත්ති වශයෙන් වෙන්න පුළුවන්, නායකත්වය වශයෙන් වෙන්න පුළුවන්, ක්‍රියාමාර්ග වශයෙන් වෙන්න පුළුවන් තමුන්නාන්සේලා වැරැදියි, අනික් ඒ හැම අංශයකම අපි ඉහළ පෙළේ පරිචයක් ප්‍රකාශ කරලා තිබෙනවා කියන එක. තමුන්නාන්සේලා නොයෙකුත් දේවල් කියන්න පුළුවන්. ෂැන්ග්‍රි-ලා ගැන කියන්න පුළුවන්. වෙනත් දේවල් ගැන කියන්න පුළුවන්. නමුත් මේ හැම එකක්ම අපි කරලා තිබෙන්නේ මේ රටේ අනාගතය සහ රටේ දළ දේශීය නිෂ්පාදනය වැඩි කිරීමේ අදහස ඇතුවයි. යම් යම් කාලවල කළ යුතු දේවල් ඒ කාලවල කළ යුතුයි. යම් යම් කාලවල කරන්න ඕනෑ නැති දේවල් ඒ කාලවල නොකළ යුතුයි. මේක අප හොඳින් දන්නවා. ඒ නිසා ජනතාවට සමපාත වන, ජනතාවට තේරෙන, ජනතාවට අගය එකතු වන, ජනතාව සන්තෝෂ වන සහ රට සමෘද්ධිමත් වන වැඩ පිළිවෙළක අපි මහින්ද චින්තන ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගිහින් තිබෙන බව මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඒ නිසා අපිට ඇත්ත වශයෙන්ම ඉදිරි සැකසුමක් තිබෙනවා. අපි මේ මහා මාර්ග ටික හදලා අවසන් කරනවා. ඒ වාගේම අපේ ජල විදුලි බලාගාර, ගල් අඟුරු බලාගාර ටික හදලා අවසන් කළාම -ජල විදුලි අංශය දියුණු කළාම- ඒ වාගේම සූර්ය බලයෙන් සහ වෙනත් බල ප්‍රභවයන්ගෙන් අප ලබන විදුලි බලය දියුණු කළාම අපේ විදුලි බලය අපට අඩුවෙන් දෙන්න පුළුවන්. එතකොට අද තමුන්නාන්සේලා නඟන මේ මැසිවිලි අඩු වෙන්න පුළුවන්. කර්මාන්ත ක්ෂේත්‍රයට, ඒ ගොල්ලන්ගේ වියදම් සැහෙන පමණ අඩු කර ගන්න උදවු කරන්න අපිට පුළුවන් වෙයි. ඒ නිසා අපි ඉදිරියේදී අනිවාර්යයෙන්ම ඒ කාර්යයන් ඉෂ්ට කිරීම සඳහා ගමන් කරනවා. ඒ වාගේම ආයතන ලාබදායී කරන්න අපි කටයුතු කර තිබෙනවා. විදුලිබල මණ්ඩලයත් ලාබදායී මට්ටමට පත් වෙමින් යන බව ගරු ඇමතිතුමා කියා තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි තමුන්නාන්සේලා ගේන එකක්වත් පදනමක් තිබෙන තර්ක නොවන බව. ආර්ථික විශාරද කේන්ස්ගේ න්‍යායක් ගෙනැල්ලා තමුන්නාන්සේලාගේ ගරු මන්ත්‍රීතුමෙක් කථා කරයි. නමුත් මේ එකක්වත් අපේ මහ පොළොවට සමපාත නැහැ. මහ පොළොවට සමපාත නොවන කිසිවක් අපි කරන්නෙත් නැහැ. මහ ජනයා සමඟ එකතු වන දේශීය ආර්ථිකයක් වාගේම අනිකුත් ඒවාට අගය එකතු කරන ක්‍රියාමාර්ගවලට අපි ලොකු වැඩ කර තිබෙනවා. අපේ -විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ- ප්‍රධාන බලාපොරොත්තුවක් තමයි අගය එකතු කළ වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම. භාණ්ඩවල අගය එකතු කිරීමෙන් තොරව හුදු අමු ද්‍රව්‍ය වශයෙන් මෙතෙක් කල් පිට රට පටවපු කාලය අවසන් කරන්න අපි ක්‍රමවේදයන් සකස් කරලා තිබෙනවා. ඒ නිසා මේ හැම ක්‍රමවේදයකම අවසන් දෙය තමයි අපේ ජීවන මට්ටමත්, අපේ දළ දේශීය නිෂ්පාදනයත් දෙගුණ කිරීම සහ ඒ හරහා ජනතාවගේ ජීවන මට්ටම වැඩි කිරීම. ඒ නිසා අපි මේ තුළත් ජනතාවගේ ජීවන මට්ටම වැඩි කර තිබෙනවා. රැකියා වැඩියෙන් දීලා තිබෙනවා. ඒ වාගේම අපි විවිධ අංශවලට උදවු කර තිබෙනවා. ඒ නිසා මේ බදු ක්‍රමයන් තුළින් මේ රටේ කාර්මික අංශයත්, සේවා අංශයත් කියන අංශ දෙකම පැහැදිලි ලෙසම වැඩි ඵලදායිතාවකට ගෙන යන්න අපට පුළුවන් වන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.50]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා සභාවෙන් පිටව යනවා. එතුමා පොඩි වෙලාවක් හරි මේ ගරු සභාවේ රැඳී හිටියා නම් හොඳයි. [බාධා කිරීමක්] හොඳයි, එහෙනම් ඔබතුමා අහගෙන ඉන්නකෝ. එතුමා කිව්වා එතුමා කරන්න උත්සාහ කළේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම කියලා. මම හිතන්නේ සංවර්ධනය හැටියට කවුරුත් විශ්වාස කරන්නේ ඒක තමයි; ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම. දැන් මගේ කථාවේදී මම පෙන්වා දෙන්න යනවා ගරු ඇමතිතුමාට -ඔබතුමා කොහේ හරි, ඔෆිස් එකේ හරි ඉඳ ගෙන අහගෙන ඉන්නවා නම් හොඳයි- ඇත්ත වශයෙන්ම මේ අවුරුදු හතර තුළ ජනතාවගේ ජීවන තත්ත්වය පහළ වැටිලා තිබෙන බව. මම ඒක ඔප්පු කරලා පෙන්වනවා. ඊට කලින් තව දෙයක් කියන්න ඕනෑ.

මෙතැනදී රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා කිව්වා, පරිප්පුවල බද්ද රුපියලයි කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදි කථාවක්. ඇත්ත වශයෙන්ම පරිප්පුවල බද්ද රුපියලට තිබුණා පාර්ලිමේන්තුවට ගංවතුර ගලපු දවස වෙනකම්. පාර්ලිමේන්තුවට ගංවතුර ගලපු දවස වෙනකම් පරිප්පුවලට ගහපු බද්ද රුපියලයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා සම්මත කරපු බදුත් එක්ක මයිසූර් පරිප්පු, කහ පරිප්පු වාගේ සියලුම පරිප්පුවලට රුපියලක්ව තිබුණු බද්ද රුපියලේ ඉඳලා සියයට දාහකින් වැඩි කළා. එතකොට රුපියලේ සිට රුපියල් 10 දක්වා මේ බද්ද වැඩි කළා. හෙට විවාදයට ගැනෙන බදු පනත් කෙටුම්පත්වලිනුත් ඒ රුපියල් 10 ඒ විධියටම තබා ගෙන ඉන්නවා, අඩු කරන්නේ නැහැ. ඊ ළඟට මයිසූර් පරිප්පු, කහ පරිප්පු, පියලි කරපු පරිප්පු සඳහා බද්ද රුපියල් දෙකේ සිට රුපියල් 15 දක්වා වැඩි කළා, එදා ගංවතුර ගැලූ දවසේ. හෙට ඉදිරිපත් කරන බදුවලින් ඒ රුපියල් පහළොවේ බද්ද ඒ විධියටම නැවතත් පනවනවා. ඒ අනුව එතුමා කරපු ඒ කථාව සම්පූර්ණයෙන්ම වැරැදියි කියලා මෙම අවස්ථාවේදී කියන්න සිද්ධ වනවා.

අද බදු සංශෝධන පනත් කෙටුම්පත් නවයක් විවාදයට ගන්නවා. එම පනත් කෙටුම්පත් නවය ගැනම කථා කරන්න වෙලාව නැති නිසා පනත් කෙටුම්පත් දෙකක් ගැන පමණක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. ජාතිය ගොඩනැඟීමේ බදු -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, Please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I propose that the Hon. R. Yogarajan do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M AZWER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිය ගොඩනැඟීමේ බද්ද අඩු කරන එක ගැන තමයි ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු දැන් මේ ගරු සභාවේ කථා කළේ. නමුත් ඇත්ත වශයෙන්ම බදු පදනම පුළුල් කිරීම තුළින් මේ අවුරුද්දේ රුපියල් මිලියන 12,000ක, එහෙමත් නැත්නම් රුපියල් කෝටි 120ක වැඩිපුර ආදායමක් ආණ්ඩුව බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ මේ බදු ප්‍රතිශතය අඩු කළාට ඒ බද්දට ඇතුළත් වන අයගේ සංඛ්‍යාව වැඩි කිරීම තුළින් ලැබෙන බදු ප්‍රමාණය වැඩි වනවා. ඇත්ත වශයෙන්ම මේ බද්ද පිළිබඳව අපි පොඩ්ඩක් කල්පනා කරන්න ඕනෑ. මේ බද්ද මුලින්ම පැනෙව්වේ 2009 වර්ෂයේදීයි. ඒ බද්ද පනවන කොට කිව්වේ අවුරුදු දෙකකට පමණයි මේ බද්ද පනවන්නේ කියලායි. මුලින් මේ බද්ද සඳහා සියයට 1යි පැනෙව්වේ. නමුත් අපි කවුරුත් දන්නවා; මා ඉතාමත්ම වග කීමෙන් කියනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කොන්දේසියක් පැනෙව්වාය කියලා. ඒ කොන්දේසිය තමයි සියයට 1ක් වශයෙන් තිබුණු ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 3 දක්වා වැඩි කළ යුතුයි කියලා. ඒක ආණ්ඩුව ඒ විධියටම කළා. නමුත් අප්‍රේල් 01 වන දා සිට ඒ බද්ද සියයට 2 දක්වා අඩු කරන්න තමයි දැන් මේ කථා කරන්නේ. [බාධා කිරීමක්] ඒක මම කියන්නම්. බොහොම හොඳයි, ඒ ප්‍රශ්නය අහපු එක. ඔබතුමා නොදන්නා නිසා මා කියන්නම්. මුදල් ඇමතිතුමා වෙනුවට ඇමතිවරයකු සහ මහ බැංකුවේ අධිපතිතුමා අත්සන් කරපු ලියුමේ ඒ කොන්දේසිය තිබෙනවා. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ලියුම ඔබතුමා ළඟ ඇති. එහෙම නැත්නම් library එකේ තිබෙනවා. මා මේ ගරු සභාවේ නැඟිටලා කවදාවත් අසත්‍යයක් කියන දේශපාලනඥයෙක් නොවෙයි. මා එහෙම දෙයක් කරන්නේ නැහැ. ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 1 සිට සියයට 3 දක්වා වැඩි කරන්න පොරොන්දු වුණා. එවැනි කොන්දේසියක් තිබුණා. ඒ පොරොන්දුව ආණ්ඩුව ඉෂ්ට කළා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දැන් මොනවාද කරන්න හදන්නේ - [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් කරන්න හදන්නේ මේකයි. මේ ක්ෂේත්‍රයේ බදුවලට ඇතුළත් වන කණ්ඩායම විශාල කිරීම තුළින් රුපියල් කෝටි 120ක් වැඩියෙන් ලබා ගන්න තමයි මේ ආණ්ඩුව දැන් කල්පනා කරන්නේ. දැන් මේ බද්ද හැම දෙනාටම බලපානවා. මොකද, තෝරා ගත් දෙතුන් දෙනකු හැරුණාම ආනයනය කරන සියලුම දෙනා මේ බදු ගෙවන්න ඕනෑ. නිෂ්පාදනය කරන සියලුම දෙනා මේ බදු ගෙවන්න ඕනෑ. නමුත් ඇත්ත වශයෙන්ම මොකක්ද වන්නේ? ආනයනය කරන අයවත්, නිෂ්පාදනය කරන අයවත් මේ බදු ගෙවන්නේ නැහැ. ඒක සාමාන්‍ය පාරිභෝගිකයාට pass කරලා යවන එක තමයි සාමාන්‍යයෙන් සිද්ධ වන්නේ. භාණ්ඩාගාරයේ ඇස්තමේන්තුව මා ළඟ තිබෙනවා. මේ ඇස්තමේන්තුවේ තිබෙනවා, ජාතිය ගොඩනැඟීමේ බදු පදනම පුළුල් කිරීම තුළින් 2011 වර්ෂයට බලාපොරොත්තු වන නව ආදායම රුපියල් මිලියන 12,000යි -රුපියල් බිලියන 12යි. රුපියල් කෝටි 120යි- කියලා. මේක සාමාන්‍ය ජනතාවට ගහන බද්දක්. මේ තත්ත්වය තුළ ඇත්ත වශයෙන්ම ජනතාවට මොකද වෙලා තිබෙන්නේ? ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැම්මයි කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අකැමැත්තෙන් හෝ කියන්න සිද්ධ වනවා ජනතාව ලොකු අපහසුතාවකට පත් වෙලා තිබෙන බව.

අපි සංවර්ධනය ගැන බලමු. සංවර්ධනය කිව්වාම අපි ඉස්සෙල්ලාම බත් පිඟාන බලන්න ඕනෑ. බත් පිඟානට මොකද වෙලා තිබෙන්නේ? ගෘහස්ථ ආදායම් වියදම් සමීක්ෂණය අවුරුදු තුනකට වතාවක් ගෙවල් 25,000ක කරනවා. එම සමීක්ෂණය අන්තිමට කළේ 2009-2010 කාලය තුළයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Speaker will now take the Chair.

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. R. YOGARAJAN *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මා කියමින් සිටියේ අවුරුදු තුනකට වතාවක් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් කරන ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය ගැනයි. අන්තිමට කළේ 2009 - 2010 කාලය තුළයි. මාස 12ක් තිස්සේ මේ සමීක්ෂණය කරනවා. ඊට කලින් කළේ 2006 - 2007 කියන කාල පරිච්ඡේදයේයි. සංවර්ධනය වෙලා නම් සාමාන්‍ය බත් පිඟානේ size එකට සහ බත් පිඟානේ ගුණාත්මකභාවයට මොකද වෙලා තිබෙන්නේ? ලලිත් දිසානායක මා මිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමා කොයි වෙලාවේත් කියන්නේ බතින් බුලතින් සපිරි රටක් කියායි. කොයි වෙලාවේත් එතුමා හරි ආසාවෙන් ඒක කියනවා. දැන් ඔබතුමාට අකැමැත්තෙන් හෝ කියන්න සිද්ධ වනවා, බත් කන

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

ප්‍රමාණය. එය පසු ගිය අවුරුදු තුනේදී සියයට 2කින් අඩු වෙලා තිබෙනවා. තිරිඟු පිටි ප්‍රමාණය සියයට 4කින් අඩු වෙලා තිබෙනවා. පාන් ප්‍රමාණය සියයට 24 කින් අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඇට වර්ග පරිභෝජනය සියයට 13කින් අඩු වෙලා තිබෙනවා. මාළු පරිභෝජනය සියයට 8කින් අඩු වෙලා තිබෙනවා. කරවල පරිභෝජනය සියයට 7කින් අඩු වෙලා තිබෙනවා. කිරි බොන ප්‍රමාණය සියයට 7 කින් අඩු වෙලා තිබෙනවා. සීනි ප්‍රමාණය සියයට 8කින් අඩු වෙලා තිබෙනවා. මේවා ඔක්කොම සත්‍ය තොරතුරු. ඉස්සෙල්ලා කථා කරපු අපේ ගරු ඇමතිතුමාගෙන් මා අහනවා, ජීවන තත්ත්වය වැඩි වෙලා නම් ජනතාව අනුභව කරන බත් පිඟානේ size එක පොඩි වෙලා තිබෙන්නේ ඇයි කියලා. ඒ මොකද? මහත් වනවාට නොකා නොවෙයි. කෑම ලබා ගන්න බැරි නිසා නොකා ඉන්නවා. ඕක තමයි වෙලා තිබෙන්නේ.

ඒත් එක්කම ගරු කථානායකතුමනි, අපි ආදායම් විෂමතාව ගැන කථා කරනවා. අකැමැත්තෙන් හෝ මට නැවතත් කියන්න සිද්ධ වනවා, 2002-2010 කාල පරිච්ඡේදයේදී මේ විෂමතාව වැඩි වෙලා තිබෙන බව. That is true. The inequality has increased, Hon. Speaker.

අඩුම ආදායමක් ලැබෙන සියයට 20ක ජනගහනයේ ආදායම් ප්‍රමාණය 2002 දී තිබුණේ සියයට 4.8යි. නමුත් 2010 වන විට මේක සියයට 4.7ට අඩු වෙලා තිබෙනවා. I know that it is a negligible amount. But, still the direction is wrong. දුප්පත් මිනිසුන්ට ලැබෙන ආදායම් ප්‍රමාණය මේ අවුරුදු අටේදී අඩු වෙලා තිබෙනවා. එහෙම නම් කොහොමද තර්ක කරන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි වෙලා කියා. ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි වෙලා නැහැ; සාර්ථක වෙලා නැහැ; අඩු වෙලා තිබෙන්නේ; පිරිහිලා තිබෙන්නේ.

මා තවත් කාරණයක් කියන්නම්. අද වන විට මේ සමීක්ෂණයේ අවසාන වාර්තාව සම්බන්ධව summary එකක් ඉදිරිපත් කර තිබෙනවා, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. ඒකේ තිබෙන ඉතාමත්ම නරක දෙයක්, නරක සොයා ගැනීමක්, ඉතාමත්ම භයානක සොයා ගැනීම තමයි සාමාන්‍ය ගෘහස්ථයක ආදායම. මහින්ද චින්තන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන කාල පරිච්ඡේදය තුළ සාමාන්‍ය ගෘහස්ථයක ආදායම අඩු වෙලා තිබෙනවා. 2006 - 2007 කාල පරිච්ඡේදයේ රුපියල් 17,465කට තිබුණු මූර්ත ආදායම ඒ කියන්නේ උද්ධමනයෙන් පසු 2009 - 2010 වන විට රුපියල් 17,129ට අඩු වෙලා තිබෙනවා කියන එකයි. එහෙම නම් කොහොමද තර්ක කරන්නේ මේ මහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්තිය තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු වෙලා කියලා? කොහොමද මේ තර්කය ඉදිරිපත් කරන්නේ? මේ තර්කය ඉදිරිපත් කරන්න කිසිම දත්තයක් ඔබතුමන්ලා ගාව නැහැ. එහෙනම් මට අහන්න සිද්ධ වනවා, ලැබිලා තිබෙන්නේ සුබ අනාගතයක්ද කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ජනතාව කතිරය ගැහුවේ -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපි බොරුවට කෑ ගහන්න ඕනෑ නැහැ, ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. බොරුවට කෑ ගහන්න එපා. අපි වැදගත් කට්ටිය නේ. අපි අධ්‍යාපනයක් ලබපු කට්ටිය නේ. ඔබතුමාත් වැදගත් නීතිඥතුමෙක් නේ. කෑ ගහන්න එපා. නිකම් ඔහොම ඕනෑවට වඩා කෑ ගහන්න එපා. මේ ගැන දත්ත තිබෙනවා. ජනතාවගේ ගෘහස්ථ ආදායම අඩු වෙලා තිබෙනවා. මේක මම නොවෙයි කියන්නේ. මේක කියන්නේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන්. ඊට පස්සේ කියනවා බත් පිඟානේ සයිස් එක අඩු වෙලා තිබෙනවාය කියලා. මම නොවෙයි කියන්නේ. මේක තමයි යථාර්ථය. [බාධා කිරීම්]

දැන් බලන්න, මේ ගෙනාපු පනත් සංශෝධනයත් එක්ක සාමාන්‍ය ජනතාවට බදු ගහලා ජාතිය ගොඩනැඟීමේ බද්ද තුළින් 2011 දී රුපියල් කෝටි 120ක් හොයා ගන්න මේ ආණ්ඩුව ලෑස්ති වනවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය ගැන මේ වෙලාවේ මට වැඩිපුර කථා කරන්න සිද්ධ වනවා. අපි කල්පනා කරලා බලමු. රුපියල් කෝටි 120ක් ලබා ගන්න යන්නේ සාමාන්‍ය ජනතාවගෙන්. Shangri-La එකටයි, CATIC එකටයි ලංකාවේ තිබෙන වඩාම වටිනා ඉඩම විකිණීම තුළින් ආණ්ඩුවට ලැබිය යුතු බදු ප්‍රමාණය කීයද? රුපියල් කෝටි 2,200යි.

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
Sir, I rise to a point of Order. මේ Shangri-La එකටයි, CATIC එකටයි විකුණනවාද, බදු දෙනවාද කියන එක පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒ ප්‍රශ්නය ඇහුවාට ගරු වෙල්ගම ඇමතිතුමාට මම බොහොම ස්තුතිවන්ත වනවා. දැන් එතුමා ඇහුවේ Shangri-La එකටයි, CATIC එකටයි බදු දෙනවාද, විකුණනවාද කියලායි. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි 2011 මාර්තු 09 වැනි බදාදා හැන්සාඩ් වාර්තාවේ 278 වැනි තීරුවට. මම එදා ප්‍රශ්නයක් ඇහුවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒකට පිළිතුරක් දුන්නා. එහි මෙහෙමයි සඳහන් වන්නේ:

"මේ රටේ ඉතිහාසයේ පළමුවන වතාවට විදේශ ආයෝජකයෙක් ඉඩමේ සම්පූර්ණ වටිනාකම එක වර මුදලින් ගෙවලා ඉඩමක් ලබා ගත් අවස්ථාව තමයි, Shangri-La සහ CATIC ආයතන ඉදිරිපත් වෙලා කළ ආයෝජනය."

එම හැන්සාඩ් වාර්තාවේම 280 වන තීරුවේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තවදුරටත් මෙහෙම කියා තිබෙනවා:

" .... ලෝකයේ තිබෙන ඉහළම හෝටල් chain එක වන Shangri-La හෝටල් ඉතිහාසයේ තමුන්ගේ මුදල් දාලා ඉඩම මිලදී ගැනීමත්, හෝටලය ඉදි කිරීමත්, පාලනය කිරීමත් යන අංශ තුනම සඳහා Shangri-La හෝටල් සමාගම එකඟ වුණු එකම අවස්ථාව මේකයි."

එතකොට ගරු කුමාර වෙල්ගම ඇමතිතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මම නොවෙයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දීලා තිබෙනවා. දැන් මට අහන්න තිබෙන ප්‍රශ්නය මේකයි. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ බදු පිළිබඳව නේ. ජනතාවට බදු ගහලා රුපියල් කෝටි 120ක් ගන්න හදනවා මේ සංශෝධනයෙන්. මම අහන්නේ මේ Shangri-La එකෙනුයි, CATIC එකෙනුයි හම්බ වෙන්න තිබුණු බදු ගත්තාද කියන එකයි.

එදා ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කථා කරන කොට මම මෙහෙම ප්‍රශ්නයක් ඇහුවා. ඒකත් එම හැන්සාඩ් වාර්තාවේම 280 වැනි තීරුවේ මේ විධියට සඳහන් වෙනවා:

"ගරු ඇමතිතුමා, සියයට සියයක් බදු ගෙවනවාද?"

මොකක් සම්බන්ධයෙන්ද මේ අහන්නේ? CATIC එකයි, Shangri-La එකයි සම්බන්ධයෙන්. එතකොට ගරු ඇමතිතුමා මෙහෙම පිළිතුරු දෙනවා:

"ඔව්. අපි මේ ආයතන දෙකෙන්ම සියයට සියයක් මුදල අරගෙන තමයි දෙන්නේ."

සියයට සියයක් බදු ගහනවාද කියන මගේ ප්‍රශ්නයට එතුමාගේ පිළිතුර ඒකයි. CATIC එකයි, Shangri-La එකයි ගත්ත ඉඩම තිබෙන්නේ Galle Face එකේ පාරෙන් එහා පැත්තේ. ඒක ලංකාවේ තිබෙන හොඳම ඉඩම් කෑල්ල. ගරු කථානායකතුමනි, දැන් අපි මේක ගණන් හදලා බැලුවොත් විකුණලා තිබෙන්නේ පර්ච් එකක් රුපියල් මිලියන 8.5කට. මම ඊයේ හොයලා බැලුවා කොළඹ හතේ ඉඩම්වල මිල. මොකද, Galle Face එකේ ඉඩම්වල මිල අපි දන්නේ නැහැ. Barnes Place and Gregory's Road in Colombo 7 එකේ විකුණන්නට දමා තිබෙන ඉඩම්වල පර්ච් එකක් රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 7 දක්වා මිලක් වනවා. කොළඹ 03, Bagatalle Road එකේ පර්ච් එකක මිල රුපියල් මිලියන 6යි. එතකොට Bagatalle Road එකේ පර්ච් එකක් රුපියල් මිලියන 6යි, Barnes Place and Gregory's Road එකේ පර්ච් එකක් රුපියල් මිලියන 7යි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
විනාඩියක් ඉන්න, ගරු මන්ත්‍රීතුමනි. මේ තර්කය සම්පූර්ණයෙන්ම වැරැදියි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, කියන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ හෝටල් ආයතනය ඒ ඉඩම මිලදී අරගෙන එතැන ලොකු හෝටලයක් හදනවා. ඒක මේ රටට ආදායමක් ලැබෙන ක්‍රමයක්. ඒ නිසා ඔබතුමාගේ සංසන්දනයේ කිසි තර්කානුකූලතාවක් නැහැ. මුළු චිත්‍රයක් මවන්න. එක එක අරගෙන නිකම් මේ -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි, හරි. මගේ කාලය ගන්න එපා.

ගරු කථානායකතුමනි, අපි කථා කරන්නේ ඉඩම පිළිබඳවයි, building පිළිබඳව නොවෙයි. Horton Place එකේ හරි, Barnes Place එකේ හරි ලොකු බිල්ඩිමක් හැදුවොත් ඒ බිල්ඩිමේ වටිනාකම එහෙම තිබෙනවා. ඉඩම ගැන පමණයි මා කථා කරන්නේ ගරු කථානායකතුමනි. එතකොට Barnes Place එකේ පර්ච් එකක් රුපියල් මිලියන 7 නම්, Galle Face එකේ පර්ච් එකක් රුපියල් මිලියන 8.5ද? අපි තර්ක කරමු. Galle Face එක Barnes Place එකට වඩා හොඳයි. Barnes Place එකේ පර්ච් එකක් රුපියල් මිලියන 7යි, Galle Face එකේ පර්ච් එක රුපියල් මිලියන 8.5යි. සියයට 100ක බද්ද අය කළා නම් Galle Face එකේ පර්ච් එකක් කීයද වන්නේ ගරු කථානායකතුමනි? රුපියල් මිලියන 4.25යි. Galle Face එකේ පර්ච් එකක් රුපියල් මිලියන 4.25ක් වන්නේ කොහොමද ගරු කථානායකතුමනි, Barnes Place එකෙයි, Horton Place එකෙයි, Bagatalle Road එකෙයි පර්ච් එකක් රුපියල් මිලියන 7යි නම්? ඒක වෙන්න බැහැ නේ. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ මෙතැන සියයට 100ක බද්ද අය කරලා නැහැ. ඒකයි මම කියන්නේ. සියයට 100ක බද්ද අය කළා නම් රුපියල් කෝටි 820ක් එන්නට ඕනෑ ෂැන්ග්‍රි-ලා ගත්ත ඉඩමෙන් විතරක්. කැටික් එක ගත්ත ඉඩමෙන් එන්නට ඕනෑ, රුපියල් කෝටි 1,375ක්. එතකොට මේ දෙක එකතු කළාම බදු හැටියට රුපියල් කෝටි 2,200ක් එන්නට ඕනෑ ගරු කථානායකතුමනි. රුපියල් කෝටි 2,200ක්. එතකොට අද මේ ගෙනෙන පනත් කෙටුම්පතින් ජනතාවට බදු පනවලා අපි එකතු කර ගන්නට හදන්නේ රුපියල් කෝටි 120යි. ජනතාව තමයි මේ බදු ඔක්කොම ගෙවන්නට ඕනෑ. රුපියල් කෝටි 120ක්. එහෙනම් මේ චීන සමාගම් දෙකෙන් බදු අය කර ගන්නට තිබුණා, රුපියල් කෝටි 2,200ක්. කෝ ඒ බදු?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார )
(The Hon. Vasudeva Nanayakkara)
තමුන්නාන්සේ ලණු දෙන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා සිටියේ නැහැ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ උත්තරය හැන්සාඩ් වාර්තාවෙන් මා කියෙව්වා. ඔබතුමා සිටියේ නැහැ. ඔන්න ඔතැන තමයි ප්‍රශ්නය. දැන් මේ පෞද්ගලීකරණයෙන් හම්බ වුණු සල්ලි එහෙම නම් අය වැයට එකතු කළාම මෙතැන අය වැය පරතරය අඩු වන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අය වැය පරතරය අඩු වනවා නොවෙයි, අය වැය අතිරික්තයක් තිබෙන්නට ඕනෑ. මේ රුපියල් කෝටි 2,200ක මුදල බදුවලින් එකතු කළා නම් අය වැය පරතරයක් නොවෙයි, අතිරික්තයක් තිබෙන්නට ඕනෑ. නමුත් එහෙම වෙලා නැහැ. ඒ කියන්නේ මෙතැන බදු අය කරලා නැහැ. එහෙම නම් මේ බදු ප්‍රතිපත්තියේ සදාචාරය මොකක්ද කියලා මා අහනවා. ඒ කියන්නේ චීන සමාගම්වලින් බදු අය කරන්නේ නැහැ, සාමාන්‍ය ජනතාවගෙන් බදු අය කරනවා. 2004 දී ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ "රට පෙරට" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් තමයි සියයට 100ක බදු ගහන්න ඕනෑය කියලා කිව්වේ. සියයට 100ක බදු ගහන්න ඕනෑය කියලා කිව්වේ අපි නොවෙයි, ඔබතුමන්ලා. ඔබතුමන්ලා තමයි කිව්වේ සියයට 100ක බද්ද ගහන්න ඕනෑය කියලා. දැන් ඒ බද්ද ගහන්නේ නැහැ. Galle Face එක විකුණලා තිබෙන්නේ Horton Place එකේ ගණන අනුව සියයට 50ක වට්ටමකට. බදු අය කළේ නැත්නම්, රුපියල් කෝටි 2,200ක බදු ලබා ගන්න ඕනෑ. වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා ඉස්සර සටන් කළා වාගේ මේකටත් සටන් කරන්න. සටන් කරලා නඩු පවරන්න. නඩු පවරලා කියන්න, මේ සමාගම් දෙක ලංකාවට රුපියල් කෝටි 2,200ක් ගෙවිය යුතුයි කියලා. ගරු ඇමතිතුමනි, මේ අද ඉදිරිපත් කර තිබෙන බදු පනත් කෙටුම්පතට අනුව ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් ලැබෙන්නේ රුපියල් කෝටි 120යි. මෙතැන රුපියල් කෝටි 2,200ක් අය වෙන්නට ඕනෑ. ඒ කියන්නේ මේ අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතට අනුව අය කරන බද්ද මෙන් දහ අට ගුණයක් මේ චීන සමාගම බදු ගෙවන්නට ඕනෑ. [බාධා කිරීමක්] ආයෝජකයන් ගැන නොවෙයි කියන්නේ ඇමතිතුමනි. ආයෝජකයන් එන්නට ඕනෑ. නමුත් බදු ගෙවන්නට ඕනෑ නම් ඒවාත් ගෙවන්නට ඕනෑ. ඔබතුමන්ලා තමයි සියයට 100ක බද්ද ගෙනාවේ. දැන් බලන්න, මේ පෞද්ගලීකරණය තුළින් මේක වෙන්නට ඕනෑ. නමුත් වෙලා නැහැ. දැන් හැම දාම කියන්නේ මොකක්ද? ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. එතුමා කිව්වා, මහින්ද චින්තනය අනුව තමයි මේ වැඩ කර ගෙන යන්නේ කියලා. මහින්ද චින්තනයේ තිබුණේ නැහැ නේ, පෞද්ගලීකරණය ගැන. දැන් පෞද්ගලීකරණය කර ගෙන යනවා; ඉඩම් විකුණනවා. ඊ ළඟට ආයතන විකුණන්නට සූදානම් වෙලා සිටිනවා. ඒ සියලුම documents මා ළඟ තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා කියනවා, "We are targeting a few billion rupees through listing companies which have a government stake" කියලා. මේක කියන්නේ පසු ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 26

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

වැනි දා. එදා ඉඳලා අද වන කොට සැහෙන දුරකට මේකේ implementation එක සිද්ධ වෙලා තිබෙනවා. දැන් list එකක් තිබෙනවා 2011 වර්ෂයේ මොනවාද විකුණන්නේ කියලා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මට ඉතාමත් සන්තෝෂයි අපේ අතිගරු ජනාධිපතිතුමා ඉන්න වෙලාවේදී කථා කරන්න ලැබීම ගැන.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ ජනාධිපතිතුමා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපේ ජනාධිපතිතුමා තමයි. අපි කාගෙත් ජනාධිපති. අපි එතුමාට ගරු කරනවා. මම එතුමාගේ ආර්ථික ප්‍රතිපත්ති විවේචනය කරනවා. නමුත් එතුමා හමු වුණාම ඉතාමත්ම සුහදව කථා කරනවා. ඒ ගරුත්වය මම තියා ගෙන ඉන්නවා. [බාධා කිරීම්] ඒ ගරුත්වය තියා ගෙන ඉන්නවා. [බාධා කිරීමක්]

අතිගරු ජනාධිපතිතුමනි, මම මේ කියකියා හිටියේ පෞද්ගලීකරණය කිරීම සම්බන්ධව list එකක් තිබෙන එක ගැනයි. ගරු කථානායකතුමනි, මේ අවුරුද්දේ කොටස් වෙළෙඳ පොළෙන් පෞද්ගලීකරණය කරන්නට නියමිතව තිබෙන list එකේ ආණ්ඩුවට අයිති company තුනක් තිබෙනවා. ඒ මොනවාද? SriLankan Catering (Pvt.) Limited, SriLankan Airlines Ground Handling. ඊ ළඟට Litro Gas Lanka Limited. දැන් බලන්න මේ ආයතන තුන ගැන. Litro Gas Lanka Limited ආයතනය ඊයේ පෙරේදා තමයි ආණ්ඩුවට පවරා ගත්තේ ගරු කථානායකතුමනි. සමහර වෙලාවට කියනවා, "ලාභ ලබන්නේ නැති ආයතන තිබෙනවා නම් විකුණලා දමමු" කියා. ඒකට කමක් නැහැ. ගරු කථානායකතුමනි, SriLankan Catering (Pvt.) Limited එකේ ශුද්ධ ලාභය පසු ගිය අවුරුද්දේ -2010 අවුරුද්දේ- සියයට 40කින් වැඩි වෙලා තිබෙනවා. ආණ්ඩුවට අයිති මේ ආයතනය රුපියල් මිලියන 640ක් ශුද්ධ ලාභය හැටියට ලබා ගෙන තිබෙනවා. එතකොට අජිත් නිවාඩ් කබ්රාල් මහ බැංකු අධිපතිතුමාට අනුව සහ මේ කොළඹ කොටස් වෙළෙඳ පොළේ ඉදිරිපත් කර තිබෙන list එකට අනුව SriLankan Catering (Pvt.) Limited කියන සමාගමේ යම් කිසි ප්‍රමාණයක් 2011 අවුරුද්දේ පෞද්ගලීකරණය කරන්න ලැහැස්ති වෙලා තිබෙනවා. පෞද්ගලීකරණය කියන්නේ සියයට සියයම විකුණනවා කියන එක නොවෙයි. Sri Lanka Telecom ආයතනයෙන් සියයට සියයක් විකුණුවේ නැහැ. එයාර් ලංකා ආයතනයෙන් සියයට සියයක් විකුණුවේ නැහැ. නමුත් යම් කිසි කොටසක් විකුණුවා. ඒකට තමයි අපි පෞද්ගලීකරණය කරනවා කියලා කියන්නේ. එතකොට ගරු ලක්ෂ්මන් යාපා ඇමතිතුමාගේ තර්කය එතැන සම්පූර්ණයෙන්ම බිඳ වැටෙනවා. ඊ ළඟට අපි බලන්න ඕනෑ, කොහොමද මේක අද කථාවට වැදගත් වන්නේ කියලා. ගරු කථානායකතුමනි, අද මුදල් (සංශෝධන) පනත් කෙටුම්පතේ කොටස් ගනුදෙනු බද්ද සියයට දශම දෙකේ ඉඳලා දශම තුන වන තෙක් වැඩි කරන්න කථා කරලා තිබෙනවා. ඒ වැඩි කිරීම හොඳයි. යම් කිසි ප්‍රමාණයක් ගන්න ඕනෑ. වාසුදේව ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා කොටස් වෙළෙඳ පොළේ ලබන ලාභවලින් බදු ගෙවන්න අවශ්‍යතාවක් නැහැ කියා. ඒවා බදු රහිත ලාභ. ඒ නිසා දශම දෙකේ ඉඳලා දශම තුන දක්වා වැඩි කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක දශම දෙකේ ඉඳලා සියයට එකට විතර වැඩි කරන්න තිබුණා. කමක් නැහැ. දශම දෙකේ ඉඳලා දශම තුනකට වැඩි කරලා තිබෙනවා. ඊ ළඟට මෙතැනදී කොටස් වෙළෙඳ පොළ ගැන කථා කරන්න සිද්ධ වෙනවා. මොකද ඒකට අදාළ වන නිසා. මම විශ්වාස කරනවා කොටස් වෙළෙඳ පොළේ සියයට 99ක්ම ඉන්නේ සාමාන්‍යයෙන් ඉතාම වැදගත් ව්‍යාපාරිකයන්ය කියා. නමුත් සියයට එකක් පමණ එතැන පල් හොරුත් ඉන්න බව -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය දැන් අවසන් වනවා. තව විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳමයි, ගරු කථානායකතුමනි. කොටස් වෙළෙඳ පොළේ සියයට එකක් පමණ ඉන්නවා එච්චරම වැදගත් නොවන පුද්ගලයන්. එතකොට මේ කොටස් වෙළෙඳ පොළේ මේ හොරු අල්ලන්න ආවේක්ෂණ හෝ සෝදිසිකරණ මෘදුකාංග - surveillance software - සවි කරනවා කියලා ආණ්ඩුව භාර ගත්තා. 2008 දී රුපියල් මිලියන 20ක් Millennium Information Technologies Limited කියන ආයතනයට ගෙවලා ඒ software එක මේ ගොල්ලන් අරගෙන තිබෙනවා. මේකේ තිබෙනවා, "Regulators would be able to go back in time to a particular time of day where all trades can be replayed. This would help identify suspected trades and every detail behind them, such as brokers and investors, be they individuals or groups or institutions, could be generated by the system" කියලා. නමුත් ගරු කථානායකතුමනි, මේ කොටස් වෙළෙඳ පොළේ මේ වාගේ ප්‍රශ්න තිබෙනවා කියලා දැන, දැනත් මේ මෘදුකාංගයට අද වෙන කල් වෙච්ච දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. කොටස් වෙළඳ පොළේ වැඩිපුරම ආයෝජනය කරන ආයතනයක් තමයි සේවක අර්ථසාධක අරමුදල; EPF එක. මුදල් අමාත්‍ය ධුරය දරන ගරු ජනාධිපතිතුමාත් මෙතැන ඉන්න නිසා මේ කාරණය කියන්න දෙන්න ගරු කථානායකතුමනි. මා ළඟ තිබෙනවා, "ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ වෘත්තික චර්යා ධර්ම" යනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශනයක්. එහි "සාමාන්‍ය කොටස්වල ආයෝජනය" කියන කොටසේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"මුදල් මණ්ඩලය විසින් සේ.අ.අ. බැංකු සහ මූල්‍ය ආයතන අධීක්ෂණය කරනු ලබන බැවින් බැංකු සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාර වස්තුවල

ආයෝජනය කිරීමට අරමුදලට අවසර නොමැත."

බැංකු සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාර වස්තුවල ආයෝජනය කිරීමට සේවක අර්ථසාධක අරමුදලට අවසර නොමැත කියලා මෙහි සඳහන්ව තිබෙනවා. This is called good governance. It states that you cannot invest in banks and financial institutions because the Central Bank, which controls the EPF which is going to be one trillion rupees is the regulator of all these banks.

ගරු ජනාධිපතිතුමනි, මෙතැන තිබෙනවා, සේවක අර්ථසාධක අරමුදලට කොටස් වෙළඳ පොළේ කුමන ඒවායෙහිද ආයෝජනය කරන්න පුළුවන්, කුමන ඒවායෙහිද ආයෝජනය කරන්න බැරි කියලා. බැංකුවල ආයෝජනය කරන්න බැහැ කියලා මේකේ තිබෙනවා. නමුත් මම අද library එකේ research unit එකට ගිහිල්ලා බැලුවා බැංකුවල තිබෙන සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනයන් පිළිබඳව. එහි තිබෙනවා shareholders ගැන. සේවක අර්ථසාධක අරමුදල NDB බැංකුවේ දෙවැනි ලොකුම

කොටස්කාරයා; ප්‍රතිශතය සියයට 9යි. සෙලාන් බැංකුවේ හයවැනි ලොකුම කොටස්කාරයා; සියයට 5යි. සම්පත් බැංකුවේ දෙවැනි ලොකුම කොටස්කාරයා; සියයට 8යි. DFCC බැංකුවේ දෙවන ලොකුම කොටස්කාරයා; සියයට 13යි. කොමර්ෂල් බැංකුවේ පස්වන ලොකුම කොටස්කරුවා; සියයට 4.7යි. හැටන් නැෂනල් බැංකුවේ දෙවන ලොකුම කොටස්කරුවා; සියයට 7.6යි. ඉතින් ගරු කථානායකතුමනි, බැංකු සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාර වස්තුවල ආයෝජනය කරන්න බැහැ කියලා සඳහන් වෙලා තියෙද්දීත් බැංකුවල ආයෝජනය කරනවා. එකක් දෙකක් නොවෙයි, පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි කොටස්කරුවන් වන විධියටම මේ බැංකුවල ආයෝජනය කරලා තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ ආයෝජනයෙන් පාඩුවක් වෙලා තිබෙනවාද? පාඩුවක් නැහැ නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ජනාධිපතිතුමා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසාන කළොත් හොඳයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, අවසාන විනාඩිය. ගරු ජනාධිපතිතුමා ඉන්න නිසායි මා මේක කියන්නේ. ආයෝජනය කරනවා පමණක් නොවෙයි, මේකේ තිබෙනවා, ආයෝජනය කළාට ඒ බැංකු පාලනය කරන්න අවශ්‍යතාවක් නැහැ කියලා. මම ඒක කියවන්නම්:

"අරමුදලට ලැබෙන ප්‍රතිලාභය ඉහල නැංවීමේ අභිප්‍රායෙන් පමණක්ම මිස සමාගම පාලනය නොකිරීමට අරමුදල වගබලා ගත යුතුය."

ගරු ජනාධිපතිතුමනි, ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කර තිබෙන ලියවිල්ලක් මා ළඟ තිබෙනවා. ඒ අනුව HNB බැංකුවේ සභාපති හැටියට Dr. (Mrs.) Rani Jayamaha, Adviser to His Excellency the President පත් කරන්න යනවා. ගරු ජනාධිපතිතුමනි, ඊ ළඟට Co-ordinating Secretary to His Excellency the President, Dr. Willie W. Gamage කියන මැතිතුමාව HNB බැංකුවට පත් කරන්න යනවා, EPF එකේ මාර්ගයෙන්. නමුත් මා අහන්නේ මෙතැන තිබෙන සදාචාරය මොකක්ද කියලා පමණයි. ගරු කථානායකතුමනි, මොකද මෙතැන තිබෙනවා නම්, EPF එකට බැහැ කියලා බැංකුවල ආයෝජනය කරන්න, මෙතැන තිබෙනවා නම් EPF එකට බැංකුවල පාලන බලය ගන්න බැහැ කියලා, ඇයි මේ දේ කරන්නේ කියලා මම අහනවා. මම මෙතැනින් කථාව නවත්වන්න බලාපොරොත්තු වනවා ගරු කථානායකතුමනි. අපට ආයෝජනය අවශ්‍ය වනවා නම් අප ඒ යහ පාලන රාමුව තියා ගන්න ඕනෑ. අප ඒ යහ පාලන රාමුවට එළියෙන් වැඩ කරනවා නම් මොකද වෙන්නේ? අපි දන්නවා ඇමෙරිකාවේ මොකද වුණේ කියලා. කවුරුත් කියන්නේ ඒ යහ පාලන රාමුවට එළියෙන් ගිය නිසා තමයි ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටුණේ කියලායි. The regulations were not implemented. They overstepped the regulations. ඉතින් නැවතත් මම ඉතාම සන්තෝෂ වනවා අතිගරු ජනාධිපතිතුමා ඉන්න දවසක කථා කරන්න ලැබීම පිළිබඳව. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට අතිගරු ජනාධිපතිතුමා.

[අ. භා. 4.20]

**අතිගරු මහින්ද රාජපක්ෂ මහතා (ජනාධිපතිතුමා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා)**
(மேதகு மஹிந்த ராஜபக்ஷ - ஜனாதிபதியும் நிதி, திட்டமிடல் அமைச்சரும் பாதுகாப்பு அமைச்சரும்)
(His Excellency Mahinda Rajapaksa - President, Minister of Finance and Planning and Minister of Defence)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ඒ ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වනවා යම් යම් දේවල් පෙන්නුම් කර දීම පිළිබඳව.

ගරු කථානායකතුමනි, පසු ගිය දෙසැම්බර් මාසයේ සම්මත කරනු ලැබූ අය වැය යෝජනාවලට අදාළ බදු නීති විවාදයට ගැනෙන අවස්ථාවකට සහභාගි වන්න ලැබීම ගැන මම සන්තෝෂ වනවා. ගෙවී ගිය කෙටි කාලය තුළ උත්තරීතර පාර්ලිමේන්තුවේ කටයුතුවලට සහභාගි වෙමින් විධායකය හා පාර්ලිමේන්තුව අතර පුළුල් සම්බන්ධතාවක් ගොඩ නැඟීමට හැකි වීම ගැනත් මම එක්තරා දුරකට ආඩම්බර වනවා. ඒ වාගේම මේ විවේචන හා මතවාදවලට ඉතා ළඟින් සම්බන්ධ වන්නට අපටත් පුළුවන් වීම පිළිබඳව මම ආඩම්බර වනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඔබතුමාත්, මාත් අතර තිබෙන සහෝදරත්වය මෙන් දැඩි සහෝදරත්වයක් පාර්ලිමේන්තුව හා විධායකය අතර ඇති කිරීමෙන් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කළ හැකි යැයි මම තරයේ විශ්වාස කරනවා. දැඩි කැප කිරීමකින් දිනා ගත් සාමය තුළින් ශීඝ්‍ර සංවර්ධනයකට අපේ රට මෙහෙයවීමට පාර්ලිමේන්තුව තුළින් හා ඉන් පිටතදී පුළුල් සහයෝගයක් අප විසින් ගොඩ නැඟිය යුතු වනවා.

ගරු කථානායකතුමනි, මෙම යෝජනා විවාදයට ගැනෙන මෙම අවස්ථාවේ අපේ රටට බලපාන කරුණු කිහිපයක් කෙරෙහි මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට මා මුලින්ම බලාපොරොත්තු වනවා.

මෙයට දින 10කට පමණ පෙර ජපානයේ ඇති වූ භූමි කම්පාව සහ සුනාමිය නිසා එරට ජනතාව මහත් දුෂ්කරතාවන්ට මුහුණ දී තිබෙනවා. ඒ වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියනයක මූල්‍ය ආධාරයකුත්, පරිභෝජනය සඳහා තේ මෙන්ම එරට අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස වෛද්‍ය හා ආරක්ෂක සේවා සැපයීමටත් අපේ රජය ඉදිරිපත් වුණ බව මම මතක් කර දිය යුතුව තිබෙනවා. වසර 60ක පමණ කාලයක් ජපානය අපේ රටේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් අඛණ්ඩව ආධාර දෙමින් විශාල කැපවීමක් සිදු කර තිබෙනවා. 2004 දෙසැම්බර් මාසයේ අපේ රට සුනාමි ආපදාවෙන් හානියට පත් වෙද්දී, අපේ රට නැවත ගොඩ නැඟීමට ජපානය විශාල දායකත්වයක් දුන්නා. ත්‍රස්තවාදය පරාජය කර සාමකාමී රටක් ගොඩ නැඟීම වෙනුවෙන් ද ජපානය දැඩි උත්සාහයක් ගත්තා. එබැවින් ඉතා දැඩි ජාතික ආපදාවකට මුහුණ දී ඇති මේ අවස්ථාවේ විපතට පත් ඒ ජනතාව සමඟ අප ශෝක වන අතර, මිය ගිය ජනතාවට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඉතා ඉක්මනින් එම රට ගොඩ නඟා ගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපේ රටේ ජනතාව වෙනුවෙන් හා රජය වෙනුවෙන්ද මේ අවස්ථාවේ මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, කාලගුණික විපර්යාසවලට ලෝකයේ බොහෝ රටවල් මුහුණ දී තිබෙනවා. 2011 ජනවාරි මාසයේ අපේ රටේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්ක වන අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය සහ මඩකලපුව ඇතුළු ප්‍රදේශවලත්, නුවර, නුවරඑළිය, මාතලේ හා බදුල්ල

[අතිගරු මහින්ද රාජපක්ෂ මහතා]

දිස්ත්‍රික්කවලත් ඇති වූ නාය යෑම් හා අධික වර්ෂාපතනයත් නිසා අපේ රටට ද දැඩි බලපෑමක් එල්ල වුණ බව ඔබ දන්නවා. විශේෂයෙන් 2010/2011 මාස් කන්නයේ අපේක්ෂිත වී අස්වැන්නෙන් සියයට 30 සිට 40 අතර අලාභයකුත්, එළවලු, පළතුරු ඇතුළු භෝග නිෂ්පාදනවලට, පශු සම්පත්වලට හා වන සතුන්ටද දැඩි හානි සිදු වුණා. කුඩා වාරිමාර්ග රාශියක් විනාශ වුණා. මාර්ග පද්ධතියට දැඩි හානි ඇති වුණා. එම ප්‍රදේශවල ජන ජීවිතද, ජීවනෝපාය මාර්ගද අඩ පණ වුණා. ඒ අවස්ථාවේදී අවතැන් වූ පුද්ගලයන්ට සහන සැපයීමටත්, විනාශ වූ මාර්ග, වැව් අමුණු හා අනෙකුත් යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීමටත් රජය වහා පියවර ගත් බව ඔබතුමා දන්නවා. මේ සඳහා අමාත්‍ය මණ්ඩලය රුපියල් බිලියන 33ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කළා. 2011 යල් කන්නය ඇරඹීමට පෙර මෙම ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරමින් ජන ජීවිතය ගොඩ නැඟීමට අපි කටයුතු ආරම්භ කර තිබෙනවා.

මැද පෙරදිග රටවල් ආශ්‍රිතව ඇති වී ඇති දේශපාලන අස්ථාවරත්වය නිසා මේ වන විට බොර තෙල් බැරලයක මිල ඩොලර් 115ක් පමණ වී තිබෙනවා. පරිභෝජනය සඳහා තෙල් ආනයනය කරන රටක් වශයෙන් තෙල් සඳහා අධික මිල ගණන් ගෙවීමට ද ඒ නිසා අපට සිදු වනවා. විකල්ප බලශක්ති කෙරෙහි යොමු වීමට අපේ රජය ගෙන ඇති පියවර නිසාත්, ගල් අඟුරු බලාගාරය මඟින් විදුලිය ලබා ගැනීමට හැකි වීම නිසාත් මේ මොහොතේ රටට විශාල සහනයක් වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලෝක ආර්ථිකයේ ඇති වී තිබෙන අස්ථාවරත්වයත්, දේශගුණික විපර්යාසත් නිසා ආහාර හිඟයත්, අධික මිල ගණනුත් බොහෝ රටවල ඇති වී තිබෙනවා. මේ නිසා සෑම රටකම පාහේ ඉහළ උද්ධමන අනුපාතයන් ද දැන් වාර්තා වනවා.

ගරු කථානායකතුමනි, ආහාර නිෂ්පාදනය සඳහා අප ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ විවිධ රටවල්වල ආහාර සැපයුම මත රඳා පැවතීම ඉතා අවදානම් බව මනා ලෙස තේරුම් ගෙන තිබෙන නිසායි. ග්‍රාමීය ආර්ථිකයත්, කෘෂි කර්මාන්තයත් අපේ රටේ අනෙකුත් අංශ සංවර්ධනය කරන ගමන්ම ශක්තිමත් කරන්නේ ඒ යථාර්ථයට මුහුණ දීමටයි. 2006 වර්ෂයේ සිට "ගම නැඟුම" වැඩසටහනෙන් ගම බලසම්පන්න කිරීම ආරම්භ කළා. "මග නැඟුම" වැඩසටහනෙන් මාර්ග දියුණු කළා. ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රම සෑම ගමක් පාසාම ව්‍යාප්ත කළා. වගා කළ හැකි හැම ඉඩමක්ම වගා කිරීමට පහසුකම් සැලසෙන පුළුල් වාරි මාර්ග පද්ධතියක් ඇති කිරීම ආරම්භ කළා. සෑම පළාතක්ම සම්බන්ධ වන පරිදි ජාතික මාර්ග සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. 2006 සිට රුපියල් 350 බැගින් පුරා වසර හයක් තිස්සේ අඛණ්ඩව වී ගොවිතැන සඳහා පොහොර සහනාධාරය දෙනු ලැබුවා. ඒ සඳහා අය වැයෙන් රුපියල් බිලියන 30ත්, 40ත් අතර ප්‍රමාණයක් වියදම් වුණත්, එයට වැඩි ගුණයක ප්‍රතිලාභ අපේ රටට ලැබුණු බව ඔබ දන්නවා. 2005 අපේ රටේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.2යි. එය 2009 වන විට මෙට්‍රික් ටොන් මිලියන 3.7 දක්වා වැඩි කර ගත්තා. රුපියල් 8 සිට 12 මට්ටමක පැවැති වී කිලෝවක මිල රුපියල් 24 සිට 28 මට්ටමක පවත්වා ගැනීමත්, පොහොර සහනාධාරයත් නිසා වී ගොවීන්ගේ ආදායම දෙගුණයකට වඩා වැඩි කරන්න අපට හැකි වුණා. ඒ නිසාම ගොවි ආර්ථිකයේ ද ප්‍රබෝධයක් ඇති වුණා. අප අද සහලින් ස්වයංපෝෂිත රටක්. ඒ ආකාරයටම පිට රටින් ගෙනෙන ආහාර ද්‍රව්‍ය වන බඩ ඉරිඟු, මුං ඇට, සෝයා බෝංචි වැනි වගාවන් වැඩිදියුණු කිරීම සඳහා ද අප යොමු වී තිබෙනවා. එළවලු නිෂ්පාදනය වැඩි කළ යුතුව තිබෙනවා. ඒ වාගේම පොල් නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 3,500 ඉක්ම වන මට්ටමකට වැඩි කර ගත යුතුව තිබෙනවා. ඒවා ප්‍රවාහනය හා බෙදා හැරීම, ගබඩා කිරීම ක්‍රමවත් කළ යුතු වෙනවා. කිරි, මස්, මාළු ඇතුළු අත්‍යවශ්‍ය ආහාරවල අතිරික්තයක් නිපදවීම මඟින් ආහාර සුරක්ෂිත බව ඇති කරමින් පාරිභෝගික සුභසාධනයත්, ගොවි ජනතාවගේ ආදායම් වැඩි කිරීමත් මේ යුගයේ කාලීන අවශ්‍යතාවක්.

ගරු කථානායකතුමනි, ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල රුපියල් 4,000 පමණ මට්ටමක තිබියදීත් සෑම වගාවක් සඳහාම පොහොර රුපියල් 1,200 සහන මිලකට දීමට අප තීරණය කළා. මේ නිසා ඕනෑම ස්ථානයකින් සහන මිලට පොහොර ගන්න ජනතාවට හැකි වෙනවා. පොහොර බෙදා හැරීමේදී නිලධාරින්ගේ වෙනත් කටයුතු අතපසු වීම මෙන්ම කාර්යාලවලදී ගොවි ජනතාවගේ කාලය නාස්ති වීම ද මින් මඟ හැරෙනවා.

2011 අය වැය මඟින් ගෘහ ආර්ථික ඒකක දශලක්ෂයක් ගොඩ නැඟීමට යෝජනා කළා. ඒ සඳහා රාජ්‍ය යන්ත්‍රයත්, ජනතාවත් දැනුවත් කළා. අපේ රටේ ජීවත් වන බොහෝ දෙනෙකුට තමන්ගේ ගෙදර පරිසරය තුළ මනා ගෘහ ආර්ථිකයක් ගොඩ නඟා ගත හැකියි. ගෘහ ඒකකවල ගෙවතුවල එළවලු, පළතුරු, මල් හා විවිධ දැව වර්ග වවා ගත හැකියි. බොහෝ ගෙවල්වල පොල් ගසක්, කොස් ගසක් වැනි දිගු කාලීනව ආහාර සපයන වගාවන් මෙන්ම ස්ථිර ආදායම් මාර්ග ගෙන දෙන වගාවන් ද කළ හැකියි. ඒ ආකාරයට ගෙවල් දශලක්ෂය ඉලක්ක කර ගනිමින් පොල් ගස් දශලක්ෂයක් වගා කර ගත හැකි වුවහොත් එමඟින් ඇති වන වගාව පොල් අක්කර 15,000ක් හා සමානයි. එපමණක් නොව, ඇතැම් ගෘහ ඒකකවල සුළු කර්මාන්ත, සත්ව ගොවිපොළවල්, මී මැසි පාලනය වැනි දේවල්වල නිරත වී අතිරේක ආදායම් මාර්ග ඇති කර ගත හැකියි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් ගම්බද හා අර්ධ නාගරික ප්‍රදේශවල මෙම කටයුතු පුළුල් කිරීමෙන් ගෘහ අවශ්‍යතා ඉටු කිරීම පමණක් නොව, වෙළෙඳ පොළට කිසියම් සැපයීමක් ද ඇති කළ හැකියි. අප රට පුරා ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332ත්, ග්‍රාම නිලධාරි කාර්යාල 14,022ත් සම්බන්ධ කරමින් රාජ්‍ය සේවයේ සියලු ආයතනත්, පළාත් සභා හා ප්‍රාදේශීය සභාත් මෙම වැඩ පිළිවෙළට යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ජීවන වියදම ස්ථාවරව පවත්වා ගැනීමට බලපාන කරුණු රාශියක් 2011 අය වැය සමඟ අප දැනටමත් ක්‍රියාත්මක කර තිබෙනවා. අය වැයෙන් සඳහන් කළාටත් වඩා වැඩි ප්‍රමාණයක සහන දෙමින් විදුලි පරිභෝජන ඒකක 120ක් දක්වා, පැවැති මිල නොවෙනස්ව පවත්වා ගෙන යෑමට කටයුතු කළා. විදුලි ගාස්තු සියයට 35කින් වැඩි කිරීම සඳහා යෝජනා ඉදිරිපත් වී තිබුණත්, රටේ කර්මාන්ත හා නිෂ්පාදන කටයුතු වැඩිදියුණු කිරීම දිරි ගැන්වීමට අවශ්‍ය නිසා එම ගාස්තු වැඩි කළේ සියයට 8කින් පමණයි.

අය වැය විසින් යෝජනා කළ පරිදිම රුපියල් 1,200 අවම වැඩි වීමක් ඇති වන පරිදි 2011 ජනවාරි මාසයේ සිට වැටුප් වැඩි කිරීමටත්, රජයේ සේවකයින්ට බලපෑ විවිධ මට්ටම්වල වැටුප් විෂමතාවන් ඉවත් කිරීමටත් අප කටයුතු කර තිබෙනවා. විශ්‍රාමලාභීන් සඳහා ද ජීවන වියදම් දීමනාව හා විෂමතා ඉවත් කිරීමේ දීමනා වැඩි කළ බව මා කියන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, භාණ්ඩ මිල ස්ථාවර කිරීම සඳහා ගෑස් සඳහා පැවති බදු, සිලින්ඩරයකට රුපියල් 125 සිට 0 දක්වා අඩු කළා. කිරිපිටි සඳහා ද මේ වන විට රුපියල් 125 සිට 50 දක්වා බදු අඩු කර තිබෙනවා. පෙට්‍රල් සඳහා පැවැති බදු ලීටරයට රුපියල් 75 සිට රුපියල් 25 දක්වා අඩු කර තිබෙනවා. ඩීසල් සඳහා පවතින්නේ ද ලීටරයට රුපියල් 2.50ක බද්දක් පමණි. භූමිතෙල් සඳහා කිසිදු බද්දක් අය නොකරන අතර එය වෙළෙඳ පොළට සපයන්නේ ලීටරයකට රුපියල් 20ක පාඩුවක් ද දරමිනුයි. ඉන්ධන සඳහා බදු අඩු කිරීමෙන් සහන සැලසිය හැක්කේ ජාත්‍යන්තර මිල ගණන් දරා ගත හැකි මටටමක පැවතියහොත් පමණයි.

ගරු කථානායකතුමනි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන සීනි, පරිප්පු වැනි භාණ්ඩ සඳහා කිලෝවකට රුපියල් 5 - 15ක තරම් අඩු බදු ප්‍රමාණයක් පවත්වා ගෙන යනවා. අල, ලූනු, තිරිඟු පිටි වැනි භාණ්ඩ සඳහා කිලෝවකට රුපියල් 20ක පමණ බදු ප්‍රමාණයක් පවත්වා ගෙන යනවා. එය දේශීය ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා කළ යුතු වෙනවා. අඩු ආදායම්ලාභීන්ට භාණ්ඩ බෙදා හැරීම පුළුල් කිරීමට "ලක් සතොස" වෙළෙඳ සල් ව්‍යාප්ත කරනවා. ස්වයං රැකියා වෙළෙඳ ජාලයක් නාගරික ප්‍රදේශවල ආරම්භ කළ බව ඔබතුමා දන්නවා.

ගරු කථානායකතුමනි, මෑත ඉතිහාසයේ අපේ රටේ බදු ක්‍රමයේ ප්‍රධාන වෙනසක් සිදු කරන විවාදයක් අද පැවැත්වෙන්නේ. මහ ජනතාවට බැංකු සමඟ ගනුදෙනු කිරීමේදී කරදරයක්ව තිබූ හර බද්ද ඇතුළු බදු වර්ග පහක් මෙම සංශෝධනත් සමඟ ඉවත් කරනවා. රටේ අමු ද්‍රව්‍ය පිට රට යැවීම අධෛර්යවත් කිරීමටත්, රට තුළ හැකි තරම් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අමුද්‍රව්‍ය අපනයනය මත කෙරෙන භාණ්ඩවලට බදු පනවා තිබෙනවා. වැඩ කරන ජනතාවගේ ආදායම මත පැනවෙන උපයන විට බදු ගෙවීමේ සීමාව මසකට රුපියල් 50,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ අයගේ ආදායම මත පැන වෙන උපරිම ආදායම් බද්ද සියයට 24 දක්වා අඩු කර තිබෙනවා. එපමණක් නොව එම බදු ගෙවීම සරල කිරීම සඳහා වැටුපෙන් අය කළ පසු ලිපිගොනු පවත්වා ගැනීමේ අවශ්‍යතාව ද ඉවත් වෙනවා.

ගරු කථානායකතුමනි, වැඩ කරන ජනතාවගේ අර්ථසාධක අරමුදල් ආපසු ගැනීමේදී පැන වී තිබූ බදු ඉවත් කර තිබෙනවා. අපේ රටේ ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර වන කෘෂිකර්මය, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර, ඉදිකිරීමේ කර්මාන්තය, සංචාරක ක්ෂේත්‍රය මෙන්ම අපනයනය සඳහා අය කරන ආදායම් බද්ද සියයට 10-12 මට්ටමකට අඩු කර තිබෙනවා. බැංකු හා ව්‍යාපාර සඳහා ක්‍රියාත්මක වන බද්ද සියයට 28 දක්වා අඩු කර තිබෙනවා. එම බදුවලින් බැංකුවල ඉතිරි වන මුදල් ප්‍රමාණය සංවර්ධන කටයුතු සඳහා ණය දීමට බල කෙරෙන නීති සකස් කර තිබෙනවා. පළාත් සභා සහ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන බදු එක්කර සරල බදු ක්‍රමයක් ඇති කර තිබෙනවා. බදු නීති ක්‍රියාත්මක කිරීමේදී විවිධ නිලධාරීන් විවිධ නිර්වචනයන් ඉදිරිපත් කිරීම වැළැක්වීම සඳහා ආදායම් කොමසාරිස්වරුන්ගෙන් සමන්විත නිර්වචන කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබෙනවා. විවිධ බදු ආරාවුල් විසඳීමට ගත වන කාලය අඩු කිරීම සහ ඉක්මන් තීරණ ලබා දීම සඳහා ස්වාධීන බදු අභියාචනා කොමිසමක් ඇති කිරීමට විධිවිධාන සලසනවා. ත්‍රස්තවාදී උවදුරු පවතින කාලයේ විශේෂයෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ජනතාවට ඇති වූ පීඩනයන්ට සහනයක් වශයෙන් 2010 අප්‍රියෙල් මස දක්වා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට අදාළ බදු ඉවත් කර තිබෙනවා.

රටේ සංවර්ධනයට දායක වන රට තුළ රැකී රක්ෂා ඇති කරන, භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම අපනයන අගය වැඩි කරන රටට වාසිදායක ආයෝජන සඳහා බදු සහන දීමට රජය කටයුතු කර තිබෙනවා. ඒ සඳහා පහසුකම් සපයන ආයෝජන මණ්ඩලය, සංචාරක මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය මෙන්ම වෙනත් රජයේ ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් කටයුතු කරමින් සිටිනවා. කලාපයේ ආකර්ෂණීය, සරල බදු ක්‍රමයක් ඇති කරමින් ඉතිරි කිරීම්වලට මෙන්ම පෞද්ගලික ආයෝජනයට හිතකාමී පරිසරයක් ගොඩ නැඟිය යුතු වනවා.

ගරු කථානායකතුමනි, මෙම අය වැය යෝජනා මඟින් අප බලාපොරොත්තු වන්නේ රටේ බහුතරයකට ප්‍රතිලාභ ගෙන දෙන අයුරින් බදු ප්‍රතිපත්තිය සකස් කිරීමයි. මේ නිසා ලක්ෂ තුනක පමණ උපයන විට බදු ගෙවන්නන්ට සහන සැලසෙනවා. මේ රටේ වැඩ කරන ජනතාව කාලාන්තරයක් තිස්සේ ඉල්ලා සිටි පරිදි සේවක අර්ථසාධක අරමුදලින් ගනු ලබන අර්ථසාධක මුදල් බදුවලින් නිදහස් කර තිබෙනවා. රටේ ආර්ථිකයෙන් වැඩි බහුතරයක් නිරත වන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට අදාළ ආදායම් බද්ද සියයට 10ට අඩු කර තිබෙනවා. මෙම අය වැය යෝජනාවලින් පොහොසතුන් සඳහා සහන සලසා ඇති බවට විවේචනය සිදු වුණත්, මත්පැන්, සිගරට් වැනි අතිවිශාල ලාභ ලබන සමාගම්වල බද්ද සියයට 35 සිට සියයට 40 දක්වා වැඩි කර තිබෙනවා. බැංකුවල බදු බර අඩු කර තිබුණ ද, එම අඩු වූ බදුවලින් ඇති වන ඉතිරිය රටේ සංවර්ධනය සඳහා යෙදවීමට සෑම බැංකුවක්ම ආයෝජන අරමුදල් ගිණුමක් විවෘත කළ යුතු වෙනවා. එම මුදල්, රටේ දිගු කාලීන සංවර්ධනයට අවශ්‍ය ණය මුදල් අඩු පොලියට දීමට නීත්‍යානුකූලව බැඳී සිටිනවා. එම නිසා මෙම අය වැය යෝජනා මඟින් විශාල සංවර්ධනයකට අවශ්‍ය අත්තිවාරම දමා තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2010 ජනාධිපතිවරණයෙනුත්, පාර්ලිමේන්තු මහ මැතිවරණයෙනුත් ජනතාව අනුමත කළ "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ක්‍රියාවට නැංවීම 2011 අය වැයෙන් ආරම්භ කළා. ඒ සඳහා 2010 දෙසැම්බර් 10 වන දින මෙම උත්තරීතර සභාවේ තුනෙන් දෙකක බහුතරයක සහයෝගය ලැබීම ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට ලොකු දිරි ගැන්වීමක් වුණා. එතැන් සිට පසු ගිය මාස තුනක පමණ කාලය තුළ එම යෝජනා නීති බවට පත් කිරීමට අප කටයුතු කළා. සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ඉක්මන් කළා. අද විවෘත කිරීමට නියමිත නොරොච්චෝලේ විදුලි බලාගාරය අප අනුගමනය කරන සංවර්ධන වැඩසටහනේ තවත් දැවැන්ත ජනතා ප්‍රතිලාභයක් වෙනවා. මේ වර්ෂය අවසානයේ කොත්මලේ විදුලි බලාගාරය ද ජනතා සන්තක වීමට නියමිතයි. ඉදිරි වසර දෙක තුළ වරාය හා වාරිමාර්ග ව්‍යාපෘති රාශියක් ද සම්පූර්ණ වෙනවා. දිගු කාලීන ණය ගෙන ඉටු කරන මෙම සංවර්ධන කටයුතු නිසා රටේ ආර්ථිකය සියයට 8ක පමණ වර්ධනයක් ඇති කර තිබෙනවා. රජය ණය ගනු ලබන බවට චෝදනා කළත් ණයවලින් දියුණු කළ වත්කම් නිසා ණය බර ජාතික ආදායමෙන් සියයට 104 සිට සියයට 80 දක්වා මේ වන විට අඩු වී තිබෙනවා. වරාය, විදුලිබල මණ්ඩලය හා රාජ්‍ය බැංකු ලාභ ලබන තත්ත්වයට පත් වී තිබෙනවා. රජයේ ආදායමට සරිලන පරිදි වියදම් ද කළමනාකරණය කර ගැනීමට රජයේ ව්‍යාපාර ලාභ ලැබිය යුතු වෙනවා. අය වැය හිඟය අඩු කර ගැනීමට රජයේ වියදම් අරපරිස්සමින් යොදා ගැනීමට ද පියවර ගෙන තිබෙනවා. එමඟින් ඉදිරියේ දී අය වැය හිඟය ජාතික ආදායමින් සියයට 5ක පමණ මට්ටමකට අඩු කර ගැනීමට හැකි වෙනවා.

වසර එකහමාරකට පෙර බිම් බෝම්බවලින් ජනතාවගෙන් ඈත් කර තිබූ උතුර, අද බිම් බෝම්බවලින් තොර ජනාවාසයක් වී තිබෙනවා. එම ප්‍රදේශවල කෘෂිකර්ම, ධීවර, පශු සම්පත්, සංචාරක කටයුතු ඉදිරියට පැමිණ තිබෙනවා. ගංවතුරෙන් හානියට පත් වූ මහා මාර්ග සියල්ලම ඇතුළත්ව දිවයින පුරා මහා මාර්ග රාශියක් සංවර්ධනය කිරීමට 2011 වර්ෂයේ දී රුපියල් බිලියන 115ක් වැය කිරීමට බලාපොරොත්තු වෙනවා. ලොව පුරා ජයග්‍රාහී ලීලාවෙන් ක්‍රීඩා කරන අපේ ක්‍රිකට් කණ්ඩායමටත්, අනෙක් රටවල ක්‍රීඩකයන්ටත් සූරියවැව, පල්ලේකැලේ වැනි ගම්වල ඉදි වී ඇති ජාත්‍යන්තර ක්‍රීඩාංගනවලට පැමිණීමට හැකි වුණා. ඒ එක්කම අපි ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනයත් හැදුවා. නමුත් ඒ නම වෙනස් කළේ නැහැ. අප නිර්මාණය කරන අලුත් රට සෑම පළාතකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි සිදු විය යුතුයි. මෙම ජාත්‍යන්තර තරග නැරඹුවේ ඒ බලාපොරොත්තු සිය මුහුණුවලින් පෙන්නුම් කරමිනුයි. ගම්වල මෙන්ම නගරවල ද අද ඇති වන්නේ සාමයත්, සංවර්ධනයත් සංකේතවත් කරවන පරිවර්තනයක්. එය උතුරේත් දකුණේත් එක ලෙස සිදු කිරීමට අප කැප වී සිටින බව මා මතක් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, සාමයත් සංවර්ධනයත් මඟින් ඇති කර තිබෙන ප්‍රතිලාභ අපේ ජනතාව ආරක්ෂා කර ගැනීමට සමත් වී තිබෙනවා. පසු ගිය දා පළාත් පාලන ආයතන සඳහා පැවති

[අතිගරු මහින්ද රාජපක්ෂ මහතා]

මැතිවරණයේදී ජනතාව අප කෙරෙහි තබා ඇති විශ්වාසය එයින් මනාව පැහැදිලි වනවා. ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මැතිවරණයේදීත්, පළාත් පාලන මැතිවරණයේදීත් අඛණ්ඩව ජනතාව විසින් ප්‍රකාශ කරනු ලැබූ විශ්වාසය අපේ රටේ දිගු කාලීන සංවර්ධන ගමනට මනා පෙර නිමිත්තක් බව මා මෙම අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිය යුතුයි. එම ජනතාව විසින් දෙනු ලබන මෙම පණිවිඩය රජය කරන අපටත්, විපක්ෂය මෙහෙයවන තමුන්නාන්සේලාටත් වැදගත් මාර්ගෝපදේශ රාශියක් දෙනු ලබනවා. අතිබහුතර පිරිසක් දෙනු ලබන පණිවිඩය නම් රටේ සංවර්ධනය වෙනුවෙන් සියලු දෙනාම ආදර්ශවත්ව මනා කැපවීමකින් යුතුව මවු බිමට ආදරය කරමින් කටයුතු කරන ලෙසටයි. මවු බිමට ආදරය කරමින් කටයුතු කරන ලෙසටයි!

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජෝන් අමරතුංග මැතිතුමා.

**අතිගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மேதகு மஹிந்த ராஜபக்ஷ)
(His Excellency Mahinda Rajapaksa )
වත්තලත් දුන්නාද?

සමස්ත වශයෙන් රටේ කීර්ති නාමය රකිමින් අභිමානවත් ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමටත්, වග කීමෙන් වැඩ කරන ලෙස අපේ ජනතාව අපට කියනවා. බොහොම පැහැදිලිව කියනවා. විපක්ෂය විසින් ද, රටේ නොපවතින දූෂණ, වංචා, අපරාධ පිළිබඳ ජාත්‍යන්තරය තුළ වැරදි තොරතුරු ප්‍රකාශ කිරීමෙන් රටේ කීර්ති නාමයට සිදු වන හානිය පිළිබඳ වග කීමෙන් යුතුව ඇස් ඇර බැලිය යුතු කාලයයි, මේ. දැන හෝ නොදැන පුවත් පත්වල පළ වන ඇතැම් ප්‍රවෘත්ති රටේ කීර්ති නාමයට විශාල කැලලක්. මේවායෙන් වැළකී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ නිරත වීමට අප සියලු දෙනා පරිණත විය යුතු කාලය දැන් එළැඹ තිබෙනවා. රාජ්‍ය සේවයේ ගෞරවය රැක ගැනීමට රාජ්‍ය සේවකයන් කැප විය යුතුවා මෙන්ම දේශපාලනඥයන් වශයෙන් අප විසින්ද රාජ්‍ය සේවයේ ගෞරවනීයත්වය රැක දෙමින් ඔවුන්ගෙන් රටේ සංවර්ධනයට ඉහළ දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. මෑතදී ඇති වුණ අතිබිහිසුණු ගංවතුර උවදුරෙන් විපතට පත් ජනතාව මුදා ගැනීමටත්, අපේ විශාල වාරිමාර්ග සියල්ල රැක ගැනීමටත් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ අපේ රාජ්‍ය සේවය හා ආරක්ෂක හමුදා ඇත්ත වශයෙන්ම අපට ආඩම්බරයක් කියලා මා මෙම අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, රටේ සමස්ත බදු ප්‍රතිපත්තියේ වෙනස්කම් රාශියක් කළා මෙන්ම රටේ වැඩ කරන ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ද අය වැයෙන් යෝජනා කළ දායක විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා වූ පනත් කෙටුම්පත් ලබන මාසයේ දී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. එමඟින් රජයේ සේවකයන්ට පමණක් හිමිව තිබූ විශ්‍රාම වැටුප රාජ්‍ය බැංකු, සංස්ථා හා පෞද්ගලික අංශයටත්, විදේශ රැකියාවල නිරත වී ජාතික ආදායමට විශාල දායකත්වයක් දෙන විදේශ රැකියාලාභීන්ටත්, ස්වයං රැකියාවල නිරත වන මේ රටේ ගොවීන්, ධීවරයන්, වෙළෙන්දන්, කලාකරුවන් ආදී සියලුම පිරිස් සඳහාත් මෙම විශ්‍රාම වැටුප් ක්‍රම ක්‍රියාත්මක කරනවා. එමඟින් අපේ රටේ වැඩ කරන ජනතාවට විශ්‍රාම දිවිය සඳහා ද ස්ථිර ආදායම් ලැබෙන සුරක්ෂිත සමාජ ක්‍රමයක් ඇති කිරීමට අපට හැකි වනවා කියලා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මෑත කාලයේ පැවැති ඉහළම ආර්ථික ස්ථාවරත්වය අප ඇති කළා. විනිමය අනුපාතය දැන් වසර දෙකක් පමණ ස්ථාවර මට්ටමක තිබෙනවා. පොලී අනුපාතය අඩු මට්ටමකට පවත්වා ගෙන තිබෙනවා. බදු ක්‍රමය සරල කිරීමත්, අඩු බදු අනුපාත ඇති කිරීමත් තවත් වැදගත් පියවරක්. "ගෘහ ආර්ථික දස ලක්ෂය" අපේ ජන ජීවිතයට ඇති කළ හැකි තවත් ස්ථාවර ආදායම් මාර්ගයක්. වැඩ කරන සෑම පුද්ගලයකුම විශ්‍රාම වැටුපකට හිමිකරුවකු කිරීම තවත් ආර්ථික ස්ථාවරත්වයක්. නාගරික පරිසරය කැළි කසළවලින් තොර පිරිසිදු, සෞඛ්‍ය සම්පන්න ආකර්ෂණීය ජනාවාස වීම මෑත ඉතිහාසයේ ඇති වූ විශාල පෙරළියක්. ගමත්, නගරයත් එක ලෙස ආකර්ෂණය කරමින් අපගේ ජනතාවට ලෝක ආර්ථිකයේ අභිමානවත් රටක ගත කිරීමට ඉඩ සැලසීම, මහින්ද චින්තන ඉදිරි දැක්මයි. එය යථාර්ථයක් වීම දැකීම අපට ආඩම්බරයක්. එය දූ දරුවන් වෙනුවෙන් කරන ආයෝජනයක් ලෙස අප සලකනවා. "සපිරි ගමක් - සුපිරි රටක්" ඇති කරමින් ආසියාවේ නැඟී එන රටක් බවට මෙම මාතෘ භූමිය පත් වනු දැකීමට ජනතාව තුළ ඇති අපේක්ෂාව නොපිරිහෙළා ඉටු කිරීමට දායක වන්නැයි ඔබ සියලු දෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා.

ඔබ සැමට තෙරුවන් සරණයි!

[අ. භා. 4.47]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, රජය මඟින් බදු සංශෝධන 9ක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ ගැන අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා කල්පනා කරනවා. විශේෂයෙන්ම මෙහිදී ජාතිය ගොඩනැඟීමේ බදු සංශෝධනය පිළිබඳව වචන කිහිපයක් කියන්න ඕනෑ. අපට මතකයි මීට කාලයකට ඉස්සෙල්ලා රජය ජාතිය ගොඩනැඟීමේ බද්ද පැනවූවේ සියයට 1ක් විධියටයි කියලා. නමුත් පසුව ඒක සියයට 3 දක්වා වර්ධනය වුණා. පසු ගිය අය වැය විවාදයේදී ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 3 සිට සියයට 2 දක්වා අඩු කරන බවට මේ රජය ප්‍රකාශ කළා. නමුත් අපි මතක් කරන්න ඕනෑ, මුලින්ම මේ ජාතිය ගොඩනැඟීමේ බද්ද තිබුණේ සියයට 1ක් විධියටය කියන එක. මේ සභාවේදී ඒ පිළිබඳව කරුණු කාරණා ගණනාවක් මතු වුණා. ඒ වාගේම ජාතිය ගොඩනැඟීමේ බද්ද - සියයට 3ක බද්ද- සියයට 2ක් කරන අතරේ අය වැය ලේඛනයේ තාක්ෂණික ලියවිල්ලේදී ඉදිරිපත් වුණා ගරු කථානායකතුමනි, බදු අඩු කිරීම තුළින් අලුතින් ආදායමක් එකතු වන බව. ඉතින් අපි ඒ අවස්ථාවේදීත් ප්‍රශ්න කළා, බදු අඩු කිරීමක් තුළින් කොහොමද අලුත් ආදායමක් එකතු වන්නේ කියා. රුපියල් මිලියන 12,000ක ආදායමක් බදු අඩු කිරීම තුළින් එකතු වෙනවාය කියන කාරණය එහිදී මතු කළා. ඒ නිසා අපට ඉතාම පැහැදිලියි සියයට 3ට තිබුණු ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 2ක් බවට පත් කරද්දී බදු විහිදෙන පරාසය -බදු එකතු කරන පරාසය- පළල් වන බව.

ඒ එක්කම ඉදිරිපත් වුණු අනික් කාරණය තමයි පළාත් ආදායම් දෙපාර්තමේන්තුව යටතේ එකතු කර ගත්තු පිරිවැටුම් බදු අහෝසි කරනවාය කියන එක. නමුත් ගරු කථානායකතුමනි, විශේෂයෙන් මින් පසුව රජයේ පාර්ශ්වයෙන් කරුණු ඉදිරිපත් කරන ගරු මැති ඇමතිතුමන්ලාගෙන් අපි දැන ගන්න කැමැතියි, මේ පළාත් පිරිවැටුම් බද්ද අහෝසි කිරීමත් එක්ක ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 2ක් විධියට එකතු වෙද්දී සියලුම පිරිවැටුම් බදු එකතු කරපු ක්ෂේත්‍රවලට මේ බද්ද බලපානවාද, ඊට එහා යනවාද කියන කාරණය.

ඒ වාගේම දිගින් දිගටම අපි ඉදිරිපත් කරපු, අද ඔප්පු වෙච්ච කාරණයක් තමයි පළාත් සභා ක්‍රියාවලිය ඉතාම අසාර්ථක වෙච්ච, තේරුමක් නැති, සුදු අලියෙක් බවට පත් වෙච්ච ක්‍රියාවලියක්ය කියන එක. මේ රටේ සියලුම පළාත් සභාවලින් අද

ඒක ඉතා පැහැදිලිව ඔප්පු කරලා තිබෙනවා. අපි දැක්කා, පළාත් සභා නඩත්තු කිරීම සහ වැටුප් ගෙවීම සඳහා පළාත් සභාවේ ආදායමට වඩා විශාල වියදමක් පළාත් සභාවලට දරන්න සිද්ධ වෙලා තිබෙන බව. අද පළාත් සභාව රජයෙන් පවත්වන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද ඒ පළාත් සභාව යටතේ ව්‍යාපෘති, ඒ වාගේම ආයතන පවත්වාගෙන යන එක කර ගන්න බැරි අකාර්යක්ෂම තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පළාත් සභා ක්‍රමය හැදූ අරමුණ ඉටු කර ගන්නට හෝ අඩුම ගණනේ පළාතේ මූලික සංවර්ධන කටයුතු කර ගන්න බැරි තත්ත්වයකට අද එය පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ පිරිවැටුම් බදු අහෝසි කිරීමත් එක්ක අපි දැක්කා, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව තේරුමක් නැති ආයතනයක් බවට පත් වෙලා තිබෙන බව. අද මේ රටේ නිර්මාණය වෙලා තිබෙනවා, බදු එකතු කරන්නේ නැති, බදු ආදායමක් නැති, බදු එකතු කරන ආයතනයක්. ආදායමක් නැති, බදු ආදායමක් නැති බදු එකතු කරන ස්ථානයක් පළාත් සභා යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක වන බව ඉතා පැහැදිලියි. ඒ නිසා රජයේ මේ අය වැය යෝජනාවත් එක්ක අද අලුත් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ ගැටලුව මතු වුණේ ජාතිය ගොඩනැඟීමේ බද්ද ක්‍රියාත්මක කරමින් එය පළාත් සභා පිරිවැටුම් බදු ක්‍රියාත්මක කරන තැනට ගළපමින් කරපු කටයුත්තත් එක්කයි. ආණ්ඩුව දුර දිග නොබලා ගත්තු තීරණයක් නිසා අද අලුත් අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ අනුව ආණ්ඩුවම අද තීන්දුවක් අරගෙන තිබෙනවාය කියා පැහැදිලියි, "පළාත් සභා ක්‍රමය අසාර්ථකයි, පළාත් සභාවලින් බදු එකතු කරලා වැඩක් නැහැ" කියා. ඒ අනුව පළාත් සභාවල ක්‍රියාත්මක කරපු බදු ක්‍රමය අද පැත්තකට අරගෙන තිබෙනවා. ඒ නිසා මම අහන්න කැමැතියි, මේ අලුතින් නිර්මාණය කරපු ගැටලුවත් එක්ක පිරිවැටුම් බද්ද අහෝසි කිරීමත් එක්ක පළාත් ආදායම් දෙපාර්තමේන්තුවල වැඩ කරන සේවකයන්ට සිද්ධ වෙන්නේ මොකද කියලා. ඒ නිසා රජය නිර්මාණය කරලා තිබෙන මේ අලුත් ගැටලුවට රජයේ පාර්ශ්වයෙන්ම විසඳුමක් ලබා දිය යුතුයි කියා අප කල්පනා කරනවා. ඒ පිළිබඳව මේ වන කොටත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවල සේවකයන් විශාල ප්‍රමාණයක් ජනාධිපතිතුමාගෙනුත්, ඒ වාගේම රජයේ විවිධ ඇමතිවරුන්ගෙනුත් සාකච්ඡා කරලා විසඳුමක් ඉල්ලා සිටියත් ඔවුන්ගේ ප්‍රශ්නයට තවම විසඳුමක් ලැබී නැති බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි මේ කාරණයත් දැන ගන්න කැමැතියි. මේ එකතු කරන ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් තුනෙන් එකක් පළාත් සභාවට ලබා දෙනවාය කියලා මේ පනත් කෙටුම්පතේ කියලා තිබෙනවා. ඒත් අපි දකිනවා, ඒ තිබුණු ආදායම එන්නේ නැහැ කියා. ඒ පළාත් සභා පවත්වා ගෙන යන්නේ කොහොමද? ඔබතුමන්ලාම පෙනී ඉන්න ඔබතුමන්ලාම සාර්ථක ක්‍රමයක්ය කියන මේ පළාත් සභාව අසාර්ථක බව ඔබතුමන්ලා පිළිගත්තා නේද කියලා අප අහන්නට කැමැතියි.

අනෙක් කාරණය මේකයි. මේ ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 1 ඉඳලා සියයට 3ක් දක්වා ක්‍රියාත්මක කරලා අද සියයට 2 දක්වා අඩු කළා වුණත් ඒ බදු ක්‍රියාත්මක වන වපසරිය, ක්ෂේත්‍ර ප්‍රමාණය වැඩි කරලා අලුත් ආදායමක් රජයට එකතු කරන්න තීන්දු කරලා තියෙද්දී මේ ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් රජය ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මොනවාද, එයින් රට තුළ කරන ව්‍යාපෘති මොනවාද කියලා නිශ්චිතව දැන ගන්න කැමැතියි. මොකද, ජාතිය ගොඩ නැඟීම සඳහාය කියලා එකතු කරන බද්දෙන් මේ රටේ ජාතිය ගොඩ නැඟීම වෙනුවෙන් කරන්නේ මොකක්ද කියන එක මේ රටේ ජනතාව දැන ගත යුතුයි කියලා අප විශ්වාස කරනවා. ඒ නිසා ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා දෙන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැනත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපි දන්නවා, මේ අවස්ථාව වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගැටලු ගණනාවක් තිබෙනවා කියලා. රටට විශාල ආදායමක් එකතු කරලා දෙන මේ දෙපාර්තමේන්තුව අද විවිධ ගැටලු ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. ගොඩනැඟිලි ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම සේවකයන්ගේ වැටුප් ප්‍රශ්න තිබෙනවා. විවිධ ප්‍රශ්න ගණනාවකට මේ වන කොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ රටේ විශාල ආදායමක් උපයා දෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙන මේ ගැටලු පිළිබඳව සාධාරණ මැදිහත් වීමක් කරන්නය කියන ඉල්ලීම අපි මේ අවස්ථාවේදී කරන්න ඕනෑ. අපි දන්නවා, විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සුබ සාධන කප්පාදු වෙලා තිබෙන බව. ඔවුන්ගේ ආපදා ණය හැටියට මාස 10ක මූලික වැටුප ගෙවිය යුතු වුණත් ඔවුන්ට ගෙවන්නේ රුපියල් ලක්ෂයක් විතරයි. ඒ වාගේම ඔවුන්ගේ ගොඩනැඟිලි පිළිබඳ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මේ පිළිබඳවත් සාධාරණ මැදිහත් වීමක් කරන්නය කියලා මේ පාර්ලිමේන්තුවේදී මමත්, තවත් මන්ත්‍රීවරු ගණනාවකුත් ඉල්ලීමක් කළා. ඒ පිළිබඳව සාධාරණ මැදිහත් වීමක් කරන බවක් තවමත් පෙනෙන්නට නැහැ. ඒ නිසා ඔවුන් වෙනුවෙන් නිසි මැදිහත් වීමක්, සාධාරණ මැදිහත් වීමක් කරන්නය කියලා මේ අවස්ථාවේ මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට අදාළව අලුතෙන් බදු උත්පාදනයක් සඳහා රජය යොමු වෙලා තිබෙන බව. නමුත් ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය අද දියුණු කරන්න ඉඩකඩක් තියෙද්දී ඒ සංචාරක කර්මාන්තය පිළිබඳව පුළුල් දැක්මකින් යුතුව දියුණු කරන්න මැදිහත් වෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රදේශවල අඩුම තරමේ ඒ පළාත් පාලන ආයතනය, ඒ වාගේම සංචාරක මණ්ඩලය මැදිහත් වෙලා සංචාරක කර්මාන්තය තිබෙන ප්‍රදේශවල අවම මට්ටමෙන් ඒ වටපිටාව, පරිසරය අලංකාරවත්ව තබා ගන්නවත් සාධාරණ මැදිහත් වීමක් කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. අද අපි දකිනවා, විශේෂයෙන්ම දකුණු පළාතේ බෙන්තොට ගඟ ළඟ ඉඳලා උණවටුන, ඒ වාගේම ගොවියපාන දක්වා තිබෙන ඒ කලාපයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව තිබෙන ප්‍රදේශයේ අඩුම ගණනේ කැළි කසළ ඉවත් කිරීම සඳහා වූ සාධාරණ මැදිහත් වීමක්, විශාල ආදායමක් ලබන මේ සංචාරක කර්මාන්තයේ දියුණු කිරීම ඉලක්ක කර ගෙන අද ක්‍රියාත්මක වන්නේ නැහැ කියා. ඒ වෙනුවෙන් පළාත් පාලන ආයතන සාධාරණ මැදිහත් වීමක් කරන්නේ නැහැ. ඒ නිසා මා විශේෂයෙන්ම ඒ පිළිබඳව මේ රජයේ අවධානය යොමු කරවන්න ඕනෑ. අද අලුතෙන් බදු ගහනවා, සංචාරක කර්මාන්තය ආශ්‍රිත කර ගෙන. සංචාරක කර්මාන්තය දියුණු කරන්න ඉඩකඩක් තිබෙනවා. නමුත් ඒ කර්මාන්තය දියුණු කරන්න තිබෙන ඒ පරිසරය ලස්සනට තියා ගන්න, අලංකාරවත්ව තියා ගන්න සාධාරණ වැඩ පිළිවෙළක්, මැදිහත් වීමක් නැහැ. සමහර අවස්ථාවල මේ පිළිබඳව අපි ඉදිරිපත් කරන යෝජනාවත් සැලකිල්ලට ගන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව විධිමත් සැලැස්මක් අද ඉදිරිපත් වෙන්න ඕනෑ. එහෙම නොවුණොත් සංචාරක කර්මාන්තයෙන් බලාපොරොත්තු වන ආදායම මේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න තිබෙන ඉඩකඩ අපට අහිමි වෙන්න පුළුවන්. ඒ වාගේම සංචාරක කර්මාන්තයට අදාළව ගහන මේ බදුවලින් ඒ කර්මාන්තයේ ඒ ක්ෂේත්‍රයේ යෙදෙන අයටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. විශේෂයෙන් අපි දන්නවා, සුනාමිය වෙලාවේ සංචාරක කර්මාන්තය බිඳ වැටිච්ච වෙලාවේ සංචාරක කර්මාන්තයත් එක්ක ඒ හෝටල් හිමියන්ට ඒ කර්මාන්තයේ අනෙකුත් සේවාවන්වල යෙදිච්ච අයට විවිධ දුක් ගැහැට විඳින්න සිද්ධ වුණා කියලා. ඒ කර්මාන්තය වැටිච්ච වෙලාවේ ඔවුන්ට ඇති වෙච්ච පීඩනය සමනය කර ගන්න ඒ පාඩුව පියවා ගන්න ඔවුන්ට අවශ්‍ය ණය සහන, විවිධ ආධාර උපකාර ආදිය, සැලසිය යුතු පහසුකම් සම්බන්ධයෙන් රජය දැක්වූයේ, විශේෂයෙන් සංචාරක මණ්ඩලය

[ගරු අජිත් කුමාර මහතා]

දැක්වූයේ අඩු මැදිහත් වීමක්ය, අඩු අවධානයක්ය කියන එක මා මේ අවස්ථාවේ කියන්න ඕනෑ. ඒ නිසා ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අලුතෙන් බදු එකතු කරන වෙලාවේ, සංචාරක කර්මාන්තයත් ආශ්‍රිතව එය වර්ධනය කරන්න ඉඩකඩක් තිබෙන වෙලාවේ ඒ පිළිබඳව සාධාරණ මැදිහත් වීමක් කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා.

ඒ වාගේම විශේෂයෙන් නැවත වතාවක් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එනම් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව අද බදු එකතු කරන්නේ නැති, බදු පවත්වා ගෙන යන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. රජය විසින්ම නිර්මාණය කළ අලුත් ගැටලුව විසඳීම සඳහා සාධාරණ වූ මැදිහත් වීමක් කරන්නය කියන ඉල්ලීමත්, විශේෂයෙන්ම ජාතිය ගොඩනැඟීමේ බද්ද, සියයට 02ක් කරපු ඒ බද්ද විඳිදෙන පරාසය පිළිබඳව, එනම් බදු ගහපු නැති අයටත් අලුතෙන් මේ බදු බලපානවාද කියන කාරණය පිළිබඳව අපට මේ ගරු සභාවේ පැහැදිලි කරන්නය කියන ඉල්ලීමත් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."- [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக"*
*[மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 22ஆம் பிரிவைத் திருத்துதல்.)
## CLAUSE 5.- (*Amendment of section 22 of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නමුත් එම මුදල් ප්‍රමාණය, නිමැවුම් බද්දෙන් ඉඩදිය හැකි යෙදවුම් බදු බැර අඩු කිරීමෙන් පසු එම තැනැත්තා විසින් ගෙවිය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 5, as amended, ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)
## வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 25ஆ என்னும் பிரிவை மாற்றீடு செய்தல்.)
## CLAUSE 6.- (*Replacement of section 25B of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 16 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කරන්න:

'(3) (අ) 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් සහ වෙනත් තැනැත්තෙකු විසින්ම යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය, මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ වාර්තාව ඉදිරිපත් කිරීමත් සමඟ අවසාන ගැළපීමක් වෙතොත් එම අවසාන ගැළපීම සිදු කිරීමට යටත්ව, මාසික පදනමක් මත ඊළඟ මාසයේ විසිවන දිනයේ දී ගෙවිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති පරිදි ගෙවා නොමැති යම් බදු මුදල් ප්‍රමාණයක්, නොගෙවා පැහැර හැර ඇති ලෙස සැලකිය යුතු අතර, මේ උපවගන්තිය අදාළ වන යම් ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තෙකු මේ පනතේ අර්ථානුකූලව පැහැර හරින්නෙකු ලෙස සැලකිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 7 to 18 ordered to stand part of the Bill.*

**19 වන වගන්තිය.-** (ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කිරීම.)
வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தின் முதலாம் அட்டவணையைத் திருத்துதல்.)
CLAUSE 19.- (*Amendment of the First Schedule to the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"17 වන පිටුවේ, (1) 3 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කොට ඇති යම් සමිතියක් හෝ පළාත් සභා මඟින් පනවා ඇති අදාළ ප්‍රඥප්ති යටතේ එසේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා ඇති හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස මඟින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා';

(2) 12 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

20. රුපියල් මිලියන සියය නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත, යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ යම් මූල්‍යමය ගැටලු හේතුවෙන් 2010 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවීමට නියමිත බදු ගෙවීම පැහැර හැර ඇති, යම් භාණ්ඩ හෝ සේවා සපයන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්ද ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් ඉදිරි බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 19 , as amended, ordered to stand part of the Bill.*

***21 සහ 22 වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*21ஆம், 22ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 21 to 22 ordered to stand part of the Bill.*

**10 වන අලුත් වගන්තිය.-** (ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඒ අලුත් වගන්තිය ඇතුලත් කිරීම)
புதிய வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தில் 25ஒ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.)
NEW CLAUSE 10.- (*Insertion of new section 25J in the principal enactment.*)

"10 වන පිටුවේ, 22 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඒ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

'10. ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 25ඒ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය.

ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනු වලින් පැන නගින සැපයුම් අගය මත බදු අය කළ යුතු බව.

25ඒ.(1) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව යම් ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවල සැපයුම් අගය මත, බදු අය කළ යුතු ය.

(2) දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, යම් විශේෂිත ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකින් පැනනගින සැපයුම් අගය බද්දට යටත් විය යුතු ප්‍රමාණය තීරණය කිරීම සඳහා-

(අ) ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කරුණු හඳුනා ගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකින් පැනනගින සැපයුම් අගය සොයා දැන ගැනීම සඳහා, අවශ්‍ය විය හැකි පරිදි, කලින් කල, රීති සහ මාර්ගෝපදේශ නිකුත් කළ යුතු ය.' ".

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"වගන්තිය දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***10 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*வாசகம் சட்டமூலத்தின் பகுதியாயிருக்க வேண்டும் எனும் வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*புதிய வாசகம் 10 சட்டமூலத்தின் பகுதியாயிருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the Clause be added to the the Bill, put and agreed to. New Clause 10 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී. පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது. சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill. Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝද්‍යපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවට අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
## NATION BUILDING TAX (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (2009 අංක 9 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 2.- (2009ஆம் ஆண்டின் 9ஆம் இலக்க சட்டத்தின் 2ஆம் பிரிவைத் திருத்துதல்.)
### CLAUSE 2.- (*Amendment of the section 2 of the Act No. 9 of 2009.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 13 සහ 14 පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් පේළි ආදේශ කරන්න:

'(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන අදාළ වන යම් නිෂ්පාදකයකු විසින් එම ද්‍රව්‍ය නිෂ්පාදනය කර විකිණීමක් නොවනතාක් දුරට තොග සහ සිල්ලර වෙළඳාම් කරනු ලබන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සහ 4 වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம், 4ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 3 and 4 ordered to stand part of the Bill.*

### 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය.)
### வாசகம் 5.-(முதன்மைச் சட்டவாக்கத்தின் 6ஆம் பிரிவைத் திருத்துதல்)
### CLAUSE 5.- (*Amendment of the section 6 of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 13 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා සියලුම පේළි (ඒ දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

බදු බැර. 6. මෙම පනත අදාළ වන යම් තැනැත්තෙක්, මෙම පනත යටතේ වූ ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇති

නිෂ්පාදකයකුගෙන් ද්‍රව්‍ය මිලදී ගනී නම්, හෝ තමා විසින්ම ආනයනය කරනු ලැබූ ද්‍රව්‍ය බද්දට යටත් වන යම් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා මුළුමනින්ම හෝ කොටසක් භාවිතා කරන විට සහ එම මිලදී ගැනීම මත හෝ ආනයනය කිරීම මත ගෙවන ලද බද්ද සඳහා බද්දට යටත් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබූ ද්‍රව්‍යවල වටිනාකමට අනුපාතිකව ගෙවන ලද බද්ද සඳහා බදු බැර හිමි විය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6 ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය සඳහා සංශෝධනය.)
## வாசகம் 7.-(முதன்மைச் சட்டவாக்கத்தின் 1ஆம் அட்டவணையைத் திருத்துதல்)
CLAUSE 7.- (*Amendment of the Schedule I to the principal enactment.*)

### ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 19 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා ඉවත් කොට (එම පේළි දෙක ද ඇතුළත්ව) ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) (xiii) වන අයිතිමයෙහි 'ඖෂධීය ද්‍රව්‍ය; සහ' යන වචන වෙනුවට 'ඖෂධීය ද්‍රව්‍ය';

(ආ) (xv) වන අයිතමයෙහි 'භාවිතා කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක්.' යන වචන වෙනුවට 'භාවිතා කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක්';

(ඇ) අයිතම (xv)ට පසු, I වන කොටසෙහි පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන්;

(xvi) රටට සිදු වන ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, රජයට ලැබෙන විදේශ අරමුදල් හෝ පරිත්‍යාග මඟින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය හෝ සැපයීම;

(xvii) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2714 යටතේ වර්ගීකරණය කරන ලද බිටුමන්;

(xviii) 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ එම කාර්යය සඳහා පළාත් සභා පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කාර්යය සඳහා වූ වෙනත් අදාළ පනත් මඟින් ලියාපදිංචි වූ සමුපකාර සමිතියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස සමාගම විසින් භාණ්ඩ ආනයනය හෝ විකිණීම;

(xix) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8701.10.10, 8701.10.90.10 සහ 8701.90.20 යටතේ වූ ට්‍රැක්ටර්;

(xx) ඖෂධ නිෂ්පාදනය සඳහා අදාළ රජයේ ආයතන විසින් අනුමත කරන ලද, අමුද්‍රව්‍ය හෝ ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය;

(xxi) 2010 මාර්තු මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි රත්‍රං ආනයනය;

(xxii) 2010 ජූලි මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට වැඩදායී වන බව සැලකිල්ලට ගනිමින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, විශාල පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වැඩ සම්පූර්ණ කිරීමෙන් පසු නැවත අපනයනය කිරීමේ පදනම මත පිරියත, යන්ත්‍ර උපකරණ, තාවකාලික පදනම මත ලංකාවට ආනයනය කිරීම;

(xxiii) 2010 ජූනි මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 4907.00.90 යටතේ වූ විදේශ ව්‍යාපාර මුදල් නෝට්ටු;

(xxiv) ආයුර්වේද ඖෂධ නිසන්වුවට අයත් ආයුර්වේද නිෂ්පාදනය සඳහා වූ අදාළ බලධරයා විසින් අනුමත කරන ලද, ආයුර්වේද නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීම;

(xxv) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0102.10 හෝ 0104.20.10 යටතේ වූ අභිජනන කාර්යය සඳහා වූ සතුන්, සංශෝධිත වර්ගීකරණ අංක 8434.10 යටතේ වූ කිරි නිෂ්පාදන යන්ත්‍ර, 8434.90 (2011.01.18 දින සිට ක්‍රියාත්මක වනු ඇත.);

(xxvi) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව රුපියල් විසිපන් දහසකට වැඩි නොවන අගයකින් යුතු ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධිත සාම්පල් ආනයනය කිරීම.' "

(2) "8 වන පිටුවේ, 1 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

(3) "9 වන පිටුවේ, 1 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

(4) "11 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරන්න:

'හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියා පදිංචි කොට ඇති ලක් සතොස සමාගම විසින් සලසනු ලබන සේවා;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***7 වන වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7, as amended, ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට නව උපලේඛන II ඇතුළත් කිරීම)

## வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்திற்கு புதிய அட்டவணை II இனைச் சேர்த்தல்)

CLAUSE 8.- (*Addition of new Schedule II to the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, (1) 18 වන පේළියට ඉක්බිතිවම පහත සඳහන් කොටස ආදේශ කරන්න:

'ඉහත උපලේඛනයේ කාර්යය සඳහා 'බෙදාහරින්නා' යන්නට 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතින් දෙන ලද අර්ථකථනය අදහස් වේ; ' "

(2) 24 වන පේළියට පසුව පහත දැක්වෙන කොටස් ආදේශ කරන්න:

‘ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

11. රුපියල් මිලියන සියය නොඉක්ම වන වාර්ෂික පිරිවැටුමක් සහිත, යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාර්තුවක් සඳහා මේ පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ජාතිය ගොඩනැඟීමේ බදු මුදල් ගෙවීම යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ එවැනි යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ මූල්‍යමය ගැටලු පැවතීම හේතුවෙන් පැහැර හරිනු ලැබ ඇති විටදී, එවැනි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්ද ගෙවීමෙන් නිදහස් විය යුතු ය:

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තව දුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් ඉදිරි බදු අය කළ හැකි කාර්තුවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය."

වගකීමෙන් මුක්ත කිරීම.

12. 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව සහ මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන සහ 5 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තෙකුගෙන් මේ පනතේ 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බදු මුදලක් එකතු කරන අවස්ථාවක දී ඒ එකතු කිරීම සියලු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදු කර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව අවස්ථාවෝචිත පරිදි ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.’ "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 8, as amended, ordered to stand part of the Bill.*

***10 සහ 11 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம், 11ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக ருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 10 and 11 ordered to stand part of the Bill.*

## 6 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)

## புதிய வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தில் 6அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

NEW CLAUSE 6.- (*Insertion of new section 6A in the principal enactment.*)

“6 වන පිටුවේ, 26 වන පේළියට ඉක්බිතිවම පහත සඳහන් කොටස ඇතුළත් කරන්න:

‘ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.’

‘ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවලින් ලැබෙන පිරිවැටුම සඳහා බදු අය කළ යුතු බව

6අ. (1) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් පිළිබඳ යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සඳහා මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බදු අය කරනු ලැබිය යුතු ය.

(2) යම් විශේෂිත ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් සඳහා යටත් වන බදු ප්‍රමාණය තීරණය කිරීමේ අරමුණින් දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් -

(අ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකට බලපානු ලබන අවස්ථානුගත කරුණු හඳුනා ගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උපචිත වන ලාභ සහ ආදායම නිශ්චිතව දැන ගැනීමේ කාර්ය සඳහා,

නියම කරනු ලැබිය හැකි රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.’ "

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, "වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***6 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*புதிய வாசகம் 6, சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the Clause be added to the Bill, put, and agreed to.*

*New Clause 6, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendment.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත

## பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்

## ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

### 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 1වන උපලේඛනයට ඉක්බිතිවම අලුත් උපලේඛනයක් ඇතුළත් කිරීම.)

### வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்துக்குப் புதிய அட்டவணையை உட்புகுத்துதல்.)

### CLAUSE 6.- (*Insertion of the new Schedule to the principal enactment*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 33 වන පේළියට ඉක්බිතිවම පහත සඳහන් කොටස ආදේශ කරන්න:

'ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

7. රුපියල් මිලියන සියය නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත, යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 දෙසැම්බර් මස 31වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව ගෙවීම යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ එවැනි යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ මූල්‍යමය ගැටලු පැවතීම හේතුවෙන් පැහැර හරිනු ලැබ ඇති විටදී, එවැනි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ ගාස්තුව ගෙවීමෙන් නිදහස් විය යුතු ය:

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, ගෙවීම් පැහැර හැර ඇති ගාස්තුව සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් ඉදිරි තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7 ordered to stand part of the Bill.*

## පොදු සංශෝධනය
## பொதுத் திருத்தம்
## GENERAL AMENDMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "උපලේඛනය" යන වචනය යෙදෙන කවර හෝ අවස්ථාවකදී ඒ වචනය වෙනුවට "පළමුවන උපලේඛනය" යන වචනය ආදේශ කරනු ලැබේ."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

## 4 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
### புதிய வாசகம் 4.-(முதன்மைச் சட்டவாக்கத்தில் 10அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
### NEW CLAUSE 4.- (*Insertion of new section 10A in the principal enactment*.)

"දෙවන පිටුවේ, 23 වන පේළියට ඉක්බිතිවම පහත සඳහන් කොටස ඇතුළත් කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම — 4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:

ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවලින් ලැබෙන පිරිවැටුම සඳහා බදු අයකළ යුතු බව — 10අ. (1) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් පිළිබඳ යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සඳහා මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බදු අය කරනු ලැබිය යුතු ය.

(2) යම් විශේෂිත ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් සඳහා යටත් වන බදු ප්‍රමාණය තීරණය කිරීමේ අරමුණින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකට බලපානු ලබන අවස්ථානුගත කරුණු හඳුනාගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උපචිත වන ලාභ සහ ආදායම නිශ්චිතව දැන ගැනීමේ කාර්ය සඳහා,

නියම කරනු ලැබිය හැකි රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.' "

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***

*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*

*Brought up, and read the First time*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, "වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***4 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*4ஆம் புதிய வாசகம், சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the Clause be added to the Bill, put, and agreed to.*

*New Clause 4, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත
## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்
## STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற் றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත් කෙටුම්පත
## மாகாண சபைகள் (முத்திரைத் தீர்வையைக் கைமாற்றுதல்) சட்டமூலம்
## PROVINCIAL COUNCILS (TRANSFER OF STAMP DUTY) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (මුද්දර ගාස්තු පළාත් සභාවලට මාරු කිරීම.)
## வாசகம் 2.-(முத்திரைத் தீர்வையை மாகாண சபைகளுக்குக் கைமாற்றுதல்)
## CLAUSE 2.- (*Transfer of Stamp Duty to the Provincial Councils.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 9 වන, 10 වන සහ 11 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ආදායම්, අදාළ පළාත් සභා වෙත වෙන්කර දීම සඳහා පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# හරබදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
## பற்றுகள் வரி (நீக்குதல்) சட்டமூலம்
## DEBITS TAX (REPEAL) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப் பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත
## நிதி (திருத்தம்) சட்டமூலம்
## FINANCE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (2006 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 2.-(2006ஆம் ஆண்டின் 11ஆம் இலக்க, நிதிச் சட்டத்தின் பாகம் 1இன் 2ஆம் பிரிவைத் திருத்துதல்.)
### CLAUSE 2.- (*Amendment of section 2 of the Part I of the Finance Act, No. 11 of 2006*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉහත (1) වන ඡේදයේ සඳහන් අනුග්‍රාහකත්වය එම ඡේදය ප්‍රකාරව' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සහ 4 වන වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3 ஆம், 4 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 and 4 ordered to stand part of the Bill.*

### 5 වන වගන්තිය.- (2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)
### வாசகம் 5.-(2005ஆம் ஆண்டின் 5ஆம் இலக்க, நிதிச் சட்டத்தின் 7ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
### CLAUSE 5.- (*Replacement of section 7 of the Finance Act, No. 5 of 2005.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, (1) 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ;'

(2) 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6 ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.)
வாசகம் 7.-(முதன்மைச் சட்டவாக்கத்தின் 13ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 7.- (*Amendment of section 13 of the principal enactment*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ශ්‍රී ලංකාවේ දී ඇතුළත් වී බලාත්මක කරන ලද යම්' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 7, as amended, ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසට 13අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
வாசகம் 8.-(2003ஆம் ஆண்டின் 25ஆம் இலக்க, நிதிச் சட்டத்தின் பாகம் 11இல் 13அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 8.- (*Insertion of new section 13A in Part II of the Finance Act, No. 25 of 2003)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 1 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

### 'II අ කොටස
### තරු පහේ හෝටල්වල කාමර සඳහා බද්ද

කාමර ගාස්තුව එක්සත් ජනපද ඩොලර් එකසිය විසිපහකට වඩා අඩුවන තරුපහේ හෝටල් විසින් බදු ගෙවීම.

13 අ. (1) 2005 අංක 38 දරන ශ්‍රී ලංකා සංචාරක පනතේ 53 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් ප්‍රකාරව, අවම ගාස්තු අය කිරීමේ කාර්යය සඳහා 'තරු පහේ හෝටලයක්' ලෙස වර්ගීකරණය කර ඇත්තා වූ ද, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ සහ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, එක් කාමරයකට එක්සත් ජනපද ඩොලර් එකසිය විසි පහකට අඩු අනුප්‍රමාණයකට කාමර ගාස්තු අය කරනු ලබන කාමරවලින් සමන්විත වන්නා වූ ද, සෑම හෝටලයකට ම, ඒ හෝටල්වල සෑම කාමරයක් සම්බන්ධයෙන් ම එක්සත්ජනපද ඩොලර් විස්සක් හෝ ඊට ස මාන ශ්‍රී ලංකා රුපියල් ගණනකින් යුතු බද්දක්, 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීමට නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද බද්ද මේ කාර්යය සඳහා (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගෙවනු ලැබිය යුතු අතර, 2005 අංක 38 දරන ශ්‍රී ලංකා සංචාරක පනත යටතේ පිහිටුවන ලද සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් රැස් කරනු ලැබිය යුතු ය. ඒ බද්ද ගෙවිය යුතු වන්නේ යම් මාසයක ද, ඒ මාසයේ අවසන් දිනයේ සිට දින පහළොවක් ඇතුළත සභාපතිවරයා විසින් රැස් කරගනු ලැබිය යුතු අතර, එය රැස්කරගනු ලැබූ දිනයේ සිට දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. සභාපතිවරයා විසින් රැස් කරගන්නා ලද මුදල් ප්‍රමාණවල සියලු විස්තර දක්වනු ලබන ලිඛිත ප්‍රකාශයක් ද ඔහු විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, බද්ද එකතු කිරීම හා ප්‍රේෂණය කිරීමට අදාළ මාර්ගෝපදේශ කලින් කල, නිකුත් කරනු ලැබිය හැකිය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 8, as amended, ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (1995 අංක 16 දරන පනතේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
வாசகம் 9.- (1995ஆம் ஆண்டின் 16ஆம் இலக்கச் சட்டத்தின் 3ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 9.- (*Replacement of Section 3 of Act, No. 16 of 1995*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, (1) 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්;'

(2) 26 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන් පසුව' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9 , as amended, ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය. - (ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)
## வாசகம் 10.-(முதன்மைச் சட்டவாக்கத்தின் 4 ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
## CLAUSE 10.- (*Replacement of section 4 of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, (1) 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්'

(2) 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස අදේශ කරන්න:

'(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 10 , as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය. - (ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)
## வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 5 ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
## CLAUSE 11.- (*Replacement of section 5 of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, (1) 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්'

(2) 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 11 , as amended, ordered to stand part of the Bill.*

***12 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*12ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 12 to 17 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Enacting Clause ordered to stand part of the Bill.*

## දීර්ඝ නාමය
## விரிவுப்பெயர்
## LONG TITLE

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, දීර්ඝ නාමය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"2006 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*விரிவுப்பெயர் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Long Title, as amended, ordered to stand part of the Bill.*

***නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*தலைப்பு, சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
## பிராந்திய உட்கட்டமைப்பு அபிவிருத்தி அறவீடு (நீக்கம்) சட்டமூலம்
## REGIONAL INFRASTRUCTURE DEVELOPMENT LEVY (REPEAL) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## රේගු ආඥා පනත: යෝජනාව
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Hon. Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235), relating to import duties, which was presented on 23.02.2011 be approved.

(Gazette Extraordinary No. 168/13 of 22 November 2010)

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva )
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.35ට, 2011 මාර්තු 23 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.35 மணிக்கு பாராளுமன்றம், 2011 மார்ச் 23, புதன்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 5.35 p.m. until 1.00 p.m. on Wednesday, 23rd. March, 2011.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### වී අලෙවි මණ්ඩලය: ගබඩා
### நெல் சந்தைப்படுத்தும் சபை: களஞ்சியசாலைகள்
### PADDY MARKETING BOARD: STORES

0664/'10

1. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ආරම්භයේදී, වී අලෙවි මණ්ඩලය සතුව තිබූ,
(i) ගබඩා සංඛ්‍යාව කොපමණද;
(ii) එක් එක් ගබඩාව පිහිටි ස්ථාන කවරේද;
(iii) එම ගබඩාවල ධාරිතාව වෙන වෙනම කොපමණද;
(iv) එක් එක් ගබඩාවේ සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;
(v) වාහන සංඛ්‍යාව කොපමණද;
යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද වන විට රජය සතු,
(i) වී ගබඩා සංඛ්‍යාව කොපමණද;
(ii) වී ගබඩා පිහිටි ස්ථාන කවරේද;
(iii) එක් එක් ගබඩාවේ ධාරිතාව හා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) වී මිළදී ගැනීම සඳහා වෙන් කළ වාහන වර්ග සහ සංඛ්‍යාව කවරේද;
යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 5 තුළ,
(i) යල හා මහ කන්නවලදී එක් එක් ගබඩාව මිලදී ගත් වී ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) වී ගැනුම් මිල කොපමණද;
(iii) වී විකුණුම් මිල කොපමණද;
(iv) ඉහත කාල සීමාව තුළ මිලදී ගත් වී තොගවලින් විනාශ වූ වී ප්‍රමාණයන් කොපමණද;
යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஆரம்ப காலத்தில் நெல் சந்தைப்படுத்தும் சபைக்கு உரித்தாயிருந்த,
(i) களஞ்சியசாலைகளின் எண்ணிக்கை எத்தனை யென்பதையும்,
(ii) ஒவ்வொரு களஞ்சியசாலையினதும் அமைவிடம் யாதென்பதையும்,
(iii) மேற்படி களஞ்சியசாலைகளின் கொள்ளளவு தனித்தனியாக எவ்வளவு என்பதையும்,
(iv) ஒவ்வொரு களஞ்சியசாலையிலும் பணியாற்றிய ஊழியர்களின் எண்ணிக்கை எத்தனையென்ப தையும்,
(v) வாகனங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்
அவர் குறிப்பிடுவாரா?

(ஆ) தற்போது அரசாங்கத்துக்கு உரித்தாயுள்ள,
(i) நெல் களஞ்சியசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,
(ii) நெல் களஞ்சியசாலைளின் அமைவிடங்கள் யாவை யென்பதையும்,
(iii) மேற்படி ஒவ்வொரு களஞ்சியசாலையினதும் கொள்ளளவு மற்றும் ஊழியர் எண்ணிக்கை தனித்தனியே எவ்வளவென்பதையும்,
(iv) நெல் கொள்வனவிற்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங்களின் வகைகள் மற்றும் எண்ணிக்கை யாதென்பதையும்
அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) கடந்த 5 வருடங்களில்,
(i) சிறுபோகம், பெரும்போகங்களின் போது ஒவ்வொரு களஞ்சியசாலையினால் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு தனித்தனியே யாதென்பதையும்,
(ii) நெல்லுக்கான கொள்வனவு விலை எவ்வளவென்பதையும்,
(iii) நெல்லுக்கான விற்பனை விலை எவ்வளவென்பதையும்,
(iv) மேற்கூறிய காலத்தினுள் கொள்வனவு செய்யப்பட்ட நெல் கையிலிருப்பில் அழிவடைந்த அளவு எவ்வளவென்பதையும்,
அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he state-
(i) the number of stores;
(ii) the location of each of the aforesaid stores;

(iii) separately, the capacity of each store;

(iv) the number of employees who served in each store; and

(v) the number of vehicles;

(vi) that belonged to the Paddy Marketing Board at its inception?

(b) Will he submit to this House-

(i) the number of paddy stores that belong to the government;

(ii) the places where those paddy stores are located ;

(iii) separately, the capacity of each of those stores and the number of employees attached to each of them; and

(iv) the types of the vehicles allocated for purchasing paddy and the number of vehicles so allocated;

at present ?

(c) Will he state with respect to the last 5 years-

(i) the amount of paddy purchased by each store separately, during the Yala and Maha seasons ;

(ii) the purchasing price of paddy;

(iii) the selling price of paddy ; and

(iv) the amount of paddy destroyed out of the stocks of paddy purchased during the aforesaid period of time?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)

(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

(අ) (i) 311කි.

(ii) ඇමුණුම 01හි දක්වා ඇත.

(iii) ඇමුණුම 01හි දක්වා ඇත.

(iv) දිගු කලක් අක්‍රියව පැවති වී අලෙවි මණ්ඩලය 2007 ජූලි 25 වන දින අමාත්‍ය මණ්ඩලය තීරණයකින් නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව ආරම්භයේදී පැවති තොරතුරු සොයා ගත නොහැක.

(v) ඉහත ආ(iv) පරිදි සොයා ගත නොහැක.

(ආ) (i) 147කි.

(ii) ඇමුණුම 02හි දක්වා ඇත.

(iii) එක් එක් ගබඩාවේ ධාරිතාව - ඇමුණුම 02හි දක්වා ඇත.

සේවක සංඛ්‍යාව - වී මිල දී ගැනීමේ කටයුතු සඳහා ගබඩා භාර සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් 42ක් සහ ගබඩා සහයකයින් 20කට අමතරව මහවැලි අධිකාරිය කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ආහාර දෙපාර්තමේන්තුව යන ආයතනවලින් තාවකාලික පදනම මත නිලධාරින් අනුයුක්ත කරගනු ලැබේ.

(iv) එක් වාහනයක් බැගින් කලාප 05ක් සඳහා තාවකාලිකව කුලී පදනම මත ලබා දී ඇත.

(ඇ) (i) ඇමුණුම 03හි දක්වා ඇත.

(ii) ඇමුණුම 04හි දක්වා ඇත.

(iii) ඇමුණුම 04හි දක්වා ඇත.

(iv) වී කිලෝග්‍රෑම් 7,500ක් පමණ විනාශ වී ඇත.

(ඈ) අදාළ නොවේ.

(அ) (i) 311 ஆகும்

(ii) இணைப்பு இல. 01 இல் தரப்பட்டுள்ளது.

(iii) இணைப்பு இல. 01 இல் தரப்பட்டுள்ளது.

(iv) நீண்ட காலமாக தொழிற்படாதிருந்த நெல் சந்தைப் படுத்தல் சபையின் செயற்பாடுகள் 2007 ஜூலை 25ஆம் திகதிய அமைச்சரவை தீர்மானத்தின்படி மீண்டும் ஆரம்பிக்கப்பட்டன. ஆகையினால் சரியான தகவல்களைப் பெறமுடியவில்லை.

(v) மேலே (iv) இன் படி சரியான தகவல்களைப் பெற முடியாதுள்ளது.

(ஆ) (i) 147 ஆகும்.

(ii) இணைப்பு இல. 02 இல் தரப்பட்டுள்ளது.

(iii) ஒவ்வாரு களஞ்சியங்களின் கொள்ளளவு — இணைப்பு இல. 02 இல் தரப்பட்டுள்ளது.

ஊழியர்களின் எண்ணிக்கை — நெல் கொள்வனவு செய்தலுக்கான களஞ்சியங்களை நிருவகிக்கும் பிராந்திய முகாமையாளர்கள் 42 பேர், மற்றும் களஞ்சிய உதவியாளர்கள் 20 பேருக்கு மேலதிக மாக மஹாவலி அதிகாரசபை, விவசாய அமைச்சு மற்றும் உணவு திணைக்கள நிறுவனங்களின் ஊழியர்கள் ஆகியோர் இதற்கு தற்காலிகமாக இணைக்கப் பட்டுள்ளனர்.

(iv) வலயமொன்றிற்கு ஒரு வாகனம் என்ற அடிப்படையில் 05 வலயங்களுக்கு வாகனங்கள் வாடகைக்கு பெற்றுக் கொடுக்கப்பட்டுள்ளன.

(இ) (i) இணைப்பு இல. 03 இல் தரப்பட்டுள்ளது.

(ii) இணைப்பு இல. 04 இல் தரப்பட்டுள்ளது.

(iii) இணைப்பு இல. 04 இல் தரப்பட்டுள்ளது.

(iv) அண்ணளவாக 7500 கி.கி.

(ஈ) பொருத்தமற்றது

(a) (i) 311

(ii) Shown in annex No. 01

(iii) Shown in annex No. 01

(iv) The functions of Paddy Marketing Board (PMB) re-launched following a Cabinet decision taken on 25th July 2007. Since the PMB defunct for a long period it is not possible to find out the proper details.

(v) As per above (a) (iv) details could not be found.

(b) (i) 147

(ii) Shown in annex No. 02

(iii) The capacity of each stores - shown in annex No. 02

Number of employees - For purchasing of paddy there are 42 Regional Managers and 20 stores assistants in PMB. In addition to that employees were obtained from the Mahaweli Authority, Ministry of Agriculture and the Department of Food on temporary basis.

(iv) Five vehicles were taken on rental basis - one vehicle per Zone.

(c) (i) Shown in annex No. 03

(ii) Shown in annex No. 04

(iii) Shown in annex No. 04

(iv) About 7,500 Kg.

(d) Does not arise.

*ඇමුණුම්:*
*இணைப்புகள்:*
*Annexees*

*ඇමුණුම: 1*

**වී අලෙවි මණ්ඩලය - ගබඩා පිළිබඳ විස්තර - 311**
(1990 දශකයේදී ලබා ගත් වාර්තාවක් ඇසුරිනි)

| | අ (i) | අ (ii) |
|---|---|---|
| | ගබඩාව | ගබඩා ධාරිතාවය මෙ.ටො. |

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| | | |
|---|---|---|
| | මනම්පිටිය | 1045 |
| | මනම්පිටිය 2 | 1045 |
| | පොළොන්නරුව 2 | 735 |
| | පොළොන්නරුව 3 | 735 |
| | පොළොන්නරුව 4 | 1045 |
| 1 | පොළොන්නරුව V | 1260 |
| 2 | පොළොන්නරුව VI | 3150 |
| 3 | හිගුරක්ගොඩ 1 | 2100 |
| 4 | හිගුරක්ගොඩ 2 | 1365 |
| 5 | හිගුරක්ගොඩ 3 | 1470 |
| 6 | හිගුරක්ගොඩ සහල් මෝල | 1365 |
| 7 | අභයපුර | 1045 |
